මව්බිම සංවර්ධනයේ

# "සුරතාන්තය"

සඳහා නිවැරදි පාර සෙවීමකට



## කුසල් පෙරේරා

# මච්බිම සංවර්ධනයේ
# සුරතාන්තය
# සඳහා නිවැරදි පාර සෙවීමට

**කුසල් පෙරේරා**

ප්‍රකාශය

නිදහස් වෙළඳ කලාප ප්‍රකාශකයෝ
අංක 141, ආනන්ද රාජකරුණා මාවත
කොළඹ 10.

**සැමට යහපත් අලුත් සංවර්ධන මාවතක් ගැන කතා කිරීමට සූදානම් සියලු දෙනාට**

පළමු ප්‍රකාශනය 2023 ඔක්තෝම්බර
© කුසල් පෙරේරා
ISBN

## කුසල් ගේ වෙනත් සිංහල කෘති

සංස්කෘතික මහල්ලෙකුගේ සංවර්ධන විලාපය - 2006
'13' ගැන අලුත් කතාවක් - 2007
මැයි 24 ඃ පෙර සහ පසු - ඇන්ටන් මාකස් සමග - 2011
බිඳුණු පංතියක නැගී සිටීම - වෘත්තීය සමිති ඉතිහාසයෙන් බිඳක් 2012
වික්ටර් අයිවන් ඃ අභියෝගාත්මක මුද්‍රාව - ලිපි එකතුව 2014
'83 දරුවෝ ඃ කුසල්ගේ අමුතු කියවීම් - ලිපි සංස්කරණය ක්‍රිෂාන් සිරිවර්ධන 2017
කොටඋඩ ඇත්තෝ ඃ අපේ කතාව කියවීමේ වෑයම - 2018
කොටඋඩ ඇත්තන්ගේ අලකලංචිය - ලිපි සංස්කරණය මේනකා ජයසුන්දර 2019
බිඳුණු පංතියක සිව් දසකයක පාසල - ආසන්න වෘත්තීය සමිති අත්දැකීම් 2022

## ලිපි පෙළගැස්ම

1. පටන් ගැන්මට පය ගැසීමකි
2. ප්‍රවේශයක්
3. **පළමු කොටස - මච්බිම නොදන්නා ''සංවර්ධනය''**
   අ. ආණ්ඩු පාලනයේ සමස්ථ දේශපාලන දේහය බිඳ වැටීම
   ආ. අර්බුදය 2023 ට ගෙන ඒම
4. **දෙවන කොටස - සංවර්ධනයේ ''සුරතාන්තය'' විඳීම**
   අ. අභියෝගාත්මක වෙනසකට
   ආ.ලක් වැසියනට ''ප්‍රජාතන්ත්‍රවාදය'' දැරිය හැකිද?
5. මෙය අමතර කියවීමකි


## පටන් ගැන්මට පය ගැසීමකි

මෙය කොවිඩ් වසංගතය කඩා වැදුණු මොහොතේ අප සමාජයේවූ හරස් සහ තිරස්කඩ සම්බන්ධ ජීවමාන නියෝජනයක කතාවකි. එය බහුතර ජන ජීවිතයට අත්‍යාවශ්‍ය විසඳුම් ගැන කතාවකට හොඳ පිවිසුමක් යැයි සිතුනෙන් මෙහි උපුටා දක්වමි.

## අන්තිම රේල්ලුව - ඇයද යා යුතුය ගම

**අප වැනිම විය යුතුය**
**ඇවිදින් ඇයද නගරයට**
**සොයන්නට බඩ වියත**
**යා හැකිය නොතකා මීටරේ ඉඩ**
**ඇය වැනි තවත් කිහිප දෙනෙකුට**

**පොදි බැඳන් අවිනිශ්චිතය**
**හිර කරන් බඩු මල්ල**
**එල්ල ගෙන කර මතින් ජීවිත**
**හිර කෙටුණු දුම්රිය පෙට්ටි වල**
**ගම යන්න හදිස්සිය**
**ඇඳිරි නීතිය වැටෙනු පෙර.**



**කිරි කහට කෝප්පය**
**රැය නිදන්නට ඉඩ නොදුන්**
**වැඩක් නැති දහවල**
**සෝදන්නෙ ගම යන්න දෑතම**
**කිම පලය දහවල සේදූ අත**
**රේල්ලුවෙ ඉඩ නැතිව හිට ගන්න**

**ඉඩක් නැති කහින්නට**
**හෙටක් නැති හිතන්නට**
**කණස්සලු හිත් තොග පුරවගෙන**
**පීලි මත ගාට යන රේල්ලුව**
**වැරදිලා අවසන් නැවතුම**
**පැමිණ ඇත කොරෝනා නගරෙට**

ගම දුප්පත් නිසා ජීවිතයක් සොයාගෙන මහ නගරයට විත් "තණ කොළ කපනවා, ගස් කපනවා" යැයි කෑ ගසමින් ගිණි ගහන මධ්‍යහනේ පාරවල යන තරුණන් මම දැක ඇත්තෙමි. මහත්වරු සේ අන්දවා මදුරුතලා ටෙනිස් පිති වනන්නට පදිකයේ සිටුවා ඇති අහිංසකයින් මම දැක ඇත්තෙමි. "මැන්පවර්" රැකියා ඒජන්සි මගින් තුට්ටු දෙකේ දෛනික වැටුපකට දිනකට පැය 12 ක් කඹුරණ තරුණියන් මට හමුව ඇත. නගරයේ මැද පංතිකයින් සුඛෝපභෝගී වාහන වල පැමිණ උදේ හවස සනීපාරාක්ෂාවට ඇවිදින බෙල්ලන්විල මන් තීරු අසළ පාරේ රාත්‍රිය ත්‍රීරෝද රථයේම නිදා ගන්නා තරුණන් සමග මා කතා කර ඇත. අතිකාලයද වැඩ මුරය බවට පත්ව දවසම හිට ගෙන සේවය කරන්නට වන සුපර්මාකට් තරුණ තරුණියන් ඔවුන්ගේ දුක කියනු මම අසා ඇත්තෙමි. කොරෝනාව හමුවිනැයි ප්‍රකාශ වූ පසු ගෙවී ගිය සතිවල ආදායම් සොයා ගත නොහැකිව මුලු දවසම කහට කෝප්පයකින් දවස ගෙවූ තරුණන් මට හමුව ඇත.

පැය කිහිපයක දැනුම් දීමකින් රටම වසා දැමීමේ ඇඳිරි නීතිය ඉකුත් සිකුරාදා පැනවූ පසු කොළඹ තව දුරටත් නැවතී සිටිය නොහැකි වූ මේ අසරණුන් ඔවුනගේ ගම් බිම් බලා යන්නට පොරකන විට, ඔවුන්ට දොස් නැගූ නාගරික මැද පංතිකයින්ගේ අවලාද මම අසා සිටියෙමි. ගම නොගොසින් ඉන්නා තැන සිට කෝවිඩ්-19 වයිරසයෙන් ආරක්ෂා වන හැටි ඔවුන්ට ඉගැන්වීමට සමාජ මාධ්‍ය ජාල වලට ගොඩ වූ සුව පහසු ජීවිත සඳහා බඩු තොග ගසා ගත් නෝනලාගේ මහත්වරුන්ගේ පාණ්ඩිත්‍ය මම ඇසුවෙමි. ඒවායේ ඇති ආත්මාර්ථයද මම දුටුවෙමි.

මෙය ලියූවේ ඒ සියල්ල ඇසූ දුටු මට ඇතිවූ අපුල සමග මේ ඇඳිරි නීති සමගින් වන හිතුවක්කාර පිළිවෙත් නිසා මුල් උදුරා දැමෙන මේ රටේ සියයට 40 ක් පමණ වන අසරණුන් වෙනුවෙනි. ඔවුන්ද ඇතුලුකර ගත හැකි ගෞරවනීය විසඳුම් නොමැත්තේ නම් කෝවිචිය යන්නේ වැරදි පීල්ලක යැයි කීමටය.

කුසල්
2020 මාර්තු 22

## ප්‍රවේශයක්

මෙය ඉතා හදිස්සියෙන් ලියැවුනකි. විශේෂ හේතුවක් නොමැතිව එවැන්නක් සිදු නොවන්නේය. මෙයට හේතු වූයේ විදේශගතව ඉන්නා උගත් මිතුරෙකු මා සමග දිග හැර ගත් වාදයකි.

මීට දසකයකට පමණ ඉහතින් රටින් පිටවූ මිතුරෙකු, මා සමග අලුත් වාදයකට එලැඹීන. මහින්ද රාජපක්ෂ ජනාධිපතිගේ දෙවන යුගය ආරම්භ වූ ජනාධිපතිවරණයේදී පරාජය වූ ජනාධිපති අපේක්ෂක ෆොන්සේකා දඩයම් කිරීමට ගෝඨාභයගේ හිතුවක්කාරී මෝඩකම් සමග දැරූ අමන උත්සාහය අතරතුර ඔහු රටින් බැහැර වූවෙකි. පසුගිය ජනාධිපතිවරණයේදී ලංකාවට අවශ්‍ය ''විනීත ඒකාධිපතියෙකු'' (Disciplined Dictator) යැයි ගෝඨාභය වෙනුවෙන් ඔහු පෙනී සිටියේය. දැන් රනිල් ඒ වෙනුවෙන් වඩාත්ම සුදුස්සා යැයි ඔහු තර්ක කරන්නේය. අප ඇද වැටුණු ආර්ථික බංකොලොත් බවෙන් මෙතරම් වේගයෙන් නැවත දෙපයෙන් සිට ගන්නට හැකි වූයේ රනිල් ජනාධිපති ලෙස විධායක බලය ඉතා විනීත ලෙස හසුරුවා ගන්නා නිසා යැයි ඔහුගේ මූලික තර්කය වන්නේය.

මේ ගරා වැටීමට නැති නම් යෝධ දූෂණ සඳහා වගකිව යුත්තේ මහින්ද, මෛත්‍රී, ගෝඨාභය හෝ රනිල් යැයි වාද කිරීමෙන් හෝ දැන් රට ගොඩ ගන්නේ විධායක බලය ඇතිව රනිල්ද නැතිනම් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ.අරමුදල) මග පෙන්වීමද යැයි තර්ක කිරීමට ප්‍රථම මේ අර්බුදයේ සමස්ථය තේරුම් ගත යුතු යැයි මම ඔහුට කීවෙමි. ඒ සම්බන්ධයෙන් විනාඩි කිහිපයකදී මා ඔහුට දුර කතනයෙන් කියූ මගේ විවරණය යම් පමණකට පුළුල් කොට සටහන්කර තැබිය යුතු යැයි සිතුණි. මේ සාහිත්‍ය මාසයේ මේ සටහන මුද්‍රණයෙන් ප්‍රකාශයට පත් කළ හැකි නොවේදැයි සිතුනත් දැනටම සැප්තැම්බර මාසයේද තුනෙන් පංගුවක් ගෙවී ගොස් ඇතැයි ඒ සමගම මතක් වූයෙන් මෙය මන්දගාමීව ලියැවුනකි.

මෙහි ඇතැම් තැන් මීට වඩා සවිස්තරව ලියන්නට තිබුණි යැයි නැවත කියවන විට මටද සිතුණි. එහෙත් මගේ ලියැවිලි ගැන මා දන්නා නිසා එයට අත නොගැසුවෙමි. එනිසා මේ සම්බන්ධ සංවාද ඇති වුවහොත් ඒ තුල විස්තර කතා කළ හැකි යැයි උත්තරයක් මම හදා ගත්තෙමි.

පොතට තැබූ නම ගැනද කෙටියෙන් කිව යුතු යැයි සිතුනි. හේතුව, එය මේ කතාවට ගැලපේදැයි දෙතුන් දෙනෙකුගෙන් ඇසූ විට


ඇතැමුන් ''සුරතාන්තය'' යන වචනය අසා තිබුණේද නැත. එය ලිංගිකත්වය සම්බන්ධ අධ්‍යනයෙහි යොදා ගැනෙන ඉංග්‍රීසි වදනක සිංහල ආදේශකය වන්නේය. ඉංග්‍රීසි යෙදුම පැත්තකින් තබා කතා කළහොත් ''සුරතාන්තය'' යන්නෙන් අදහස් කෙරෙන්නේ ''ඉතා සුන්දර ආස්වාදයක උපරිමය'' යන්න ය. ඒ අනුව මා අදහස් කරන්නේ අප්‍රමාණ දුක් අඳෝනා මැද කාලයක් තිස්සේ ජීවිත ඇදගෙන පැමිණි මේ රටේ ජනතාවට, ඔවුන්ගේ මව්බිමෙහි ''ඉතා සුන්දර උපරිම ආස්වාදයක්'' බුක්ති විඳිය හැකි දියුණුවකට පය තැබීම ''මව්බිම සංවර්ධනයේ සුරතාන්තය'' පිළිබඳ කතාව යැයි කියා ය.

දැන් මෙතැනින් මෙය නතර කරමි. මෙය හුදෙක් සංවාදයකට ආරම්භයක් පමණකැයි නැවත කියමි.

ස්තුතියි.

කුසල් පෙරේරා
බෙල්ලන්විල

2023 ඔක්තෝම්බර 06



## පළමු කොටස

## මච්බිම නොදන්නා ''සංවර්ධනය''

වර්තමාන සමාජ ආර්ථික අර්බුදය ගැන මෙලෝ අවබෝධයක් නැති කොළඹ ඇතැම් සමාජ ක්‍රියාකාරී ඔස්තාර්ලා ඔවුන්ගේ නඩත්තුව වෙනුවෙන් ''රාජපක්ෂ විරෝධය'' තවමත් නඩත්තු කරන්නේ ජනාධිපති වික්‍රමසිංහට ''රාජපක්ෂ'' නාමය අන්වර්තනය කිරීමෙනි. ඒ රාජපක්ෂ විරෝධය අලුත් කර ගැනීමට සාධාරණ චෝදනාවක් ලෙස ඉදිරිපත් කළ හැකි, මේ සැප්තැම්බර මස (2023) ආරම්භයේදී බ්‍රිතාන්‍ය චැනල්-4 රූපවාහිනි ආයතනය විකාශනය කළ ''පාස්කු ත්‍රස්ත ප්‍රහාර'' සම්බන්ධ වාර්තාමය වැඩ සටහන නාගරික සමාජයට ආන්දෝලනාත්මක මාතෘකාවක් විය.

ආරම්භක සමයේ එයට වගකිව යුතු යැයි ඇඟිලි දිගු කෙරුණු අය වෙත නැවත නැවතත් ඇඟිලි දිගු කිරීම දැකිය හැක්කේ දේශපාලන අර්ථ දැක්වීමේ වෙනස්කම්ද ඇතිවය. යුධ සහ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ සම්බන්ධ එකල ආණ්ඩු පාලනයේ වූවන්ගේ වගවීම් වෙනුවෙන් ජාත්‍යන්තර පරීක්ෂණ ඉල්ලමින් අවුරුදු දොළසකට වැඩි කාලයක් ඉබා ගාතේ හිස් ගමන් පැමිණි නමුත්, පාස්කු ත්‍රස්ත ප්‍රහාර සම්බන්ධයෙන්ද දැන් වැඩි ඉල්ලුමක් ඇත්තේ එවැනිම ජාත්‍යන්තර පරීක්ෂණ සඳහාය. එයද තව දුරටත් මැතිවරණ සටන් පාඨයක් ලෙස හෝ ඇද ගෙන යා නොහැකි තරමට හැල්ලුවී ඇත්තේ එහි මතු කෙරෙන චෝදනා සඳහා ඔවුන්ට වැදගත් සාක්ෂි නැතැයි චැනල්-4 රූපවාහිනියේ වගකිව යුත්තන් පසුව කියූ නිසාවෙනි. ඒ හා සමග චැනල්-4 පාස්කු ප්‍රහාර

සම්බන්ධ වාර්තාමය වැඩසටහනට අදාල ස්වාධීන ජාත්‍යන්තර පරීක්ෂණ ඉල්ලීම්ද හෙමින් සීරුවේ අත හැරුණු සෙයකි.

අවුරුද්දකට වැඩි කලක් කොවිඩ්-19 ගැන තිබූ අවදානම් කතාද දැන් අසන්නට නැත. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කොවිඩ්-19 සම්බන්ධව නිකුත් කළ තත්ත්ව වාර්තාද දැන් නැත. ප්‍රධාන නගරවල සුළු අත්කම් නිෂ්පාදනයක් ලෙස ආරම්භ වූ ''මුව ආවරණ'' මැසීමද දැන් බිඳ වැටී ඇත. ත්‍රී රෝද රථවල පිටුපස ''මීටරේ ජීවිතේ'' යැයි ලියා තිබූ කොවිඩ්-19 වයිරසයෙන් ආරක්ෂාවීම සිහිපත් කිරීමේ පාඨයද දැන් වෙනත් උසුළු විසුළු පාඨ වලින් වැසී ඇත. කොවිඩ් වසංගතය අවසානද නැද්ද යන්නවත් දැන් කතා වන්නේ නැත.

දැන් ඉහළ සමාජයේ විශේෂඥ කව වල හෙමින් සීරුවේ කතාවන්නේ අප තවමත් සිටින්නේ පසුගිය අවුරුද්දේ (2022) අප්‍රේල් මාසයේ රට බංකොලොත් යැයි ප්‍රකාශ කළ යෝධ අර්බුදය මධ්‍යයයේ බවය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අරමුදල) සමග ඉකුත් මාර්තු මාසයේ එකඟතා අත්සන් කිරීමට අවශ්‍ය වූ ජා.මූ. අරමුදලේ පූර්ව කොන්දේසි ක්‍රියාවට නගන්නට ජනාධිපති වික්‍රමසිංහ පියවර ගෙන දැනට අවුරුද්දක් සම්පූර්ණ වූවත් ඒවායින් අර්බුදය පාලනය වූ බවක් දැකිය නොහැකි බව ඒ කතාවල හරය වන්නේය. මේ අතර, සතියක පළමු විමර්ශනය සඳහා ජා.මූ. අරමුදලේ මාණ්ඩලික නියමුවන් කණ්ඩායම පැමිණ සැප්තැම්බර අවසානයේ යනවිට, ලාංකාණ්ඩුවට ලබා දිය යුතු ණය මුදලේ දෙවන කාර්තුව ලබා දීම මඳක් ප්‍රමාද කෙරෙන බව කීවේය. හේතු ලෙස කියා තිබුණේ, ඔවුන්ගේ සෑහීමට සරිලන අයුරු ක්‍රියාත්මක කළ යුතු ප්‍රධාන පියවර විශේෂයෙන් ආදායම් වැඩිකර ගැනීම එතෙක් ප්‍රමාණවත් ලෙස ක්‍රියාත්මකව නැති බවය.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයෙහි පර්යේෂණ අධ්‍යක්ෂිකා ආචාර්ය නීශා අරුණාතිලක ඉංග්‍රීසි පුවත් පතක් සමග පසුගිය සැප්තැම්බර 23 වන දින පැවැත් වූ සම්මුඛ සාකච්ඡාවකදී පවසා තිබූයේ ලෝක බැංකුවට අනුව මේ වනවිට සමාජ විෂමතා සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති බවය. 2019 දී සියයට 11.3 ක් වූ දිළිඳු ප්‍රතිශතය සියයට 25 දක්වා වැඩි වී ඇති බවය. ඊට අමතරව ඇය කියා තිබුණේ රැකියාවල සේවා හා ආදායම් තත්ත්වය බිඳ වැටී ඇති බවය. එබැවින් නිෂ්පාදන හා සේවා අංශවල සේවකයින් ග්‍රාමීය කෘෂි ක්ෂේත්‍රයෙහි ආදායම් සොයන්නට පෙළඹී ඇතැයි ඇය කියා තිබිණ.

මේ ගත වෙන්නේ මෙතෙක් මේ රටේ දේශපාලන ඉතිහාසයෙහි අත් නොවිඳි දරුණුම සමාජ ආර්ථික කඩා වැටීමෙන් ගොඩ යාමට දරණ වෑයමක අවිනිශ්චිතය සමගය. බංකොලොත් යැයි පිළිගනු ලැබූ රටක අසාර්ථක රාජ්‍යයක් සමග හෙට දවසට ලබා ගත හැකි විසඳුම් කවරේදැයි පැහැදිලි නොමැති මොහොතක ය. මහමෙරක් මෙන් උසට ගොඩ ගැසුණු විශේෂයෙන් විදේශ ණය ගෙවීමට නොහැකි වීම හමුවේ ජා.මූ.අරමුදලේ පිහිටෙන් මිස ආර්ථිකය නැවත එකලස් කර ගැනීමට වෙනත් විකල්පයක් නැතැයි ප්‍රධාන දේශපාලන ධාරාවේ සියල්ලන් අතරමංව ඉන්නා මොහොතකය. විචිකිච්චාවන් සමග වුවත් නාගරික මැදපංතියද තවමත් එය එසේ යැයි පිළිගන්නා සමාජ පසුබිමක ය.

බැලූ බැල්මට පමණක් නොව ඇත්තටම, ප්‍රධාන දේශපාලන ධාරාවේ කිසිවකුට වික්‍රමසිංහ ජනාධිපතිගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක වන ජා.මූ.අරමුදලේ නිර්දේශ සම්බන්ධ රළු කොන් අහුල ගැනීමක් මිස වෙනත් විසඳුමක් නැත. කුඩා කැබලිති දේශපාලන කණ්ඩායම් වලටද කතා කළ හැකි වෙනත් විසඳුම් නැත. ආණ්ඩුව හා සම්බන්ධ නොමැති ඒ සියල්ලන්ට ඇත්තේ ඒ ඔස්සේද ආණ්ඩු විරෝධයක් ඔසවා ගැනීමේ උත්සාහ පමණි.

එහෙත් අර්බුදයට හේතුව රාජපක්ෂලාගේ යෝධ දූෂණ යැයි කියමින් රාජපක්ෂ විරෝධයෙන් මැතිවරණ වාසි ගත හැකි යැයි ඇතැමුන් තවමත් ගණන් හදති. පැවතිය යුතුව තිබූ පළාත් පාලන මැතිවරණය ජනාධිපති වික්‍රමසිංහ ආණ්ඩුව විසින් දින නියමයක් නොමැතිව කල් තැබූ පසු, ඒ මැතිවරණය ගැන දැන් ප්‍රධාන ධාරාවේ දේශපාලන නායකයින් බලාපොරොත්තු අත හැර ඇත. දැන් කතා වන්නේ ජනාධිපතිවරණ නැතිනම් මහ මැතිවරණයක් ගැනය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරණයක් පැවැත්විය හැක්කේ ලබන 2024 නොවැම්බරයේදී ය. පලාත් සභා සහ පළාත් පාලන මැතිවරණ පැවැත්වීමට හෝ සූදානම් නොමැති ජනාධිපතිවරයෙකුගෙන් පාර්ලිමේන්තු මැතිවරණයක් ලබා ගැනීමට නම්, මැතිවරණය බහුතර ජනතාවගේ ප්‍රධානම ඉල්ලීම ලෙස සමාජය හමුවට ගෙන ආ යුතුය. පාක්ෂිකයින් හා හිතවතුන් සඳහා සිංහල දකුණේ රැස්වීම් තැබීම හැර එවැනි මැතිවරණ ඉල්ලන ජනතා ව්‍යාපාරයක් දකින්නටද නැත. බහුතර ජනතාවගේ ජීවත්වීමේ අරගලයට මැතිවරණයකින් වහා ලබා ගත හැකි විසඳුම් ගැන විශ්වාසයක් නොමැති විට, මැතිවරණ ඉල්ලීමට ජන සමාජයෙහි වැදගත්කමක් ලැබෙන්නේ නැත.

මේ අවධියේ සහ තව ඉදිරියට ප්‍රධාන සහ අත් හළ නොහැකි මාතෘකාවක් වන්නේ, මූලික වශයෙන් මේ රටේ බහුතර ජනතාවගේ ජීවත්වීමේ අරගලයට ලබා දිය හැකි විසඳුම් මොනවාද යන්න ය. එය ජාත්‍යන්තරයට බාර දිය හැකි කාරණාවක් නොවේ. ආර්ථික අර්බුදයට විසඳුම් ලබාදීම සඳහා හැකියාවක් ඇති අවංක දේශපාලන නායකයින් සෙවීමේ නාගරික මැදපංතික හා අලුත් දේශපාලන උනන්දුවක් පෙන්වූ තරුණ පිරිස් ගන්නා උත්සාහ මගින්ද එයට උත්තර සෙවිය නොහැක. එයට ඇත්තේ අවශ්‍ය තැන්හි ජාත්‍යන්තර අත්දැකීම් ඇසුරු කරමින් ප්‍රමුඛතාගත කෙරෙන ලාංකීය අවශ්‍යතා සඳහා අලුත් මානයන් ඔස්සේ අප විසින් සකසා ගත යුතු අපේම විසඳුම් පමණ ය. එය බරපතල සමාජ කතිකාවක් ඔස්සේ යා යුතු ගමනකි.

එවැනි සමාජ කතිකාවක් අපතේ නොයන්නට එහි පදනම විය යුත්තේ මොනවාද යන්න පිළිබඳව අප සතු පූර්ව එකඟතාවක් තිබිය යුතුය. සාමාන්‍ය ජනතාවගේ ඉල්ලීම වනු ඇත්තේ ඔවුන්ට දෛනිකව මුහුණ දෙන්නට සිදුව ඇති අත්‍යාවශ්‍ය වියදම් පියවා ගැනීම වෙනුවෙන් වහ වහා ලබා ගත හැකි විසඳුම් කිහිපයකි. එය මග හැර යා නොහැක්කකි. එහෙත් එය අනාගතය සඳහා ස්ථාවර තිර සාර විසඳුමක් හෝ එවැන්නකට පදනමක් වන්නේ නැත. එබැවින් අද දිග හැරී තිබෙන ආර්ථික හා සමාජ බිඳ වැටීමට ගොදුරුව ඉන්නා බහුතරයක් ජනතාවගේ අත්‍යාවශ්‍ය හදිසි අවශ්‍යතා සඳහා සහනදායි විසඳුම් ඉදිරිපත් කිරීමේ වගකීමට යටත්ව, අප දිග හැර ගත යුතු ස්ථාවර තිර සාර විසඳුම් සම්බන්ධ සමාජ කතිකාවෙහි පළමු කාර්ය විය යුත්තේ මේ අර්බුදයේ ආර්ථික සාධකය මෙන්ම දේශපාලන සාධකයද හඳුනා ගැනීමය.

## මේ අර්බුදයේ අග මුල කොහේද?

බහුතරයක් ජනතාව අද මුහුණ දෙන සමාජ ආර්ථික ගරා වැටීම සම්බන්ධ පොදු කතාව නම්, විශාල විදේශ විනිමය හිඟයක් සමග ගොඩ ගැසුනු යෝධ ණය කන්දරාවෙහි වාර්ෂික පොලිය හෝ ගෙවා ගැනීමට ඇති නොහැකියාව අප මුහුණ දෙන අර්බුදය යැයි කීමය. දළ වශයෙන් එය සැබෑ ය. එහෙත් එය සම්පූර්ණ අර්බුදය පිළිබඳ කතාවම නොවේ. අර්බුදය පිළිබඳ කතාව සම්පූර්ණ කිරීමට නම් මේ ණය කන්දරාව ගොඩ ගැසෙන්නේ 1978 න් ආරම්භ කළ විවෘත වෙළඳපල ආර්ථිකයෙහි බව ආරම්භයේදීම පිළිගත යුතුව ඇත. අනතුරුව එහි පිටුපස ඇති දේශපාලන කාරණා ගැනද සංවාදයක් දිග හැර ගත යුතු වන්නේය.

අපේ විදේශ ණය ගොඩ ගැසෙන්නේ වාර්ෂික ආනයන වියදම පියවීමට අවශ්‍ය විදේශ විනිමය උපයා ගැනීමට අපට නොහැකි හෙයිනි. බදු විරාම, බදු අහෝසි කිරීම්, රජයේ ඉඩම් ඇතුළු අප්‍රමාණ සහන සහ වරප්‍රසාද ලබා දෙමින් අපනයන නිෂ්පාදනය සඳහා ගෙන්වා ගත් ඍජු විදේශ ආයෝජන මගින් හෝ අපට ආනයන වියදම පියවා ගැනීමට වාර්ෂිකව අවශ්‍යවන ඩොලර ප්‍රමාණය උපයා ගැනීමට නොහැකි විය. එය ඉලක්කම් වලින් කිවහොත් 2019 වසරේ ආනයන වියදම පියවීම සඳහා අපට ඩොලර බිලියන 19.5 ක් අවශ්‍යව තිබිණ. එහෙත් අපට ඒ අවුරුද්දේ අපගේ අපනයන මගින් උපයා ගත හැකි වූයේ ඩොලර බිලියන 11.97 ක් පමණි. ඒ අනුව අපට ඩොලර බිලියන 7.5 ක හිඟයක් තිබිණ. කලින් වසරේ (2018) ආනයන - අපනයන වෙළඳාමේ හිඟය ඩොලර බිලියන 10.3 ක් විය. ඊට පෙර 2017 වසරේ ඒ හිඟය ඩොලර බිලියන 9.6 ක් විය. 1978 විවෘත වෙළඳපල ආරම්භයේදී මේ වෙළඳ ශේෂය එදා පැවති ඩොලර අනුපාතය අනුව දළ වශයෙන් මිලියන 362.2 ක් වූවකි. අවුරුදු 44 ක කාලයක් තුල මේ විවෘත වෙළඳපල ආර්ථිකයෙහි අපගේ විදේශ වෙළඳ හිඟය ඩොලර මිලියන 362 සිට බිලියන 10 ක් දක්වා ඉහළ යෑම සොරකම් වංචා නිසාම සිදුවූවක් නොවන බව අමුතුවෙන් කිව යුතු නැත. එහෙත් කිව යුත්තේ, ඒ හිඟය අප දිගටම ගෙවූයේ ණය ලබා ගැනීමෙන් බවය.

අපව ක්‍රමානුකූලව ඒ බේදවාචකයට තල්ලු කළ ජයවර්ධනගේ සිට හැම ජනාධිපතිවරයෙකු යටතේම, හැම ආණ්ඩුවකින්ම පවත්වා ගෙන පැමිණි ජාවාරම්කාර විවෘත වෙළඳපල ආර්ථිකය යනු මහ නගර කේන්ද්‍රීය පාරිභෝගික වෙළඳ පොලකි. එය සංවර්ධන ආකෘතියක් නොවේ. එනිසා සංවර්ධනයේ නාමයෙන්ද අපේ ආණ්ඩු ණය ගත්හ. ජයවර්ධන ආණ්ඩුව යටතේ මහවැලි සංවර්ධන ව්‍යාපෘතියේ සිට හැම ජනාධිපතිවරයෙකු යටතේම වර්තමාන අධිවේගි මාර්ග පද්ධති දක්වා සියලු යටිතල පහසුකම් දියුණු කිරීම් වෙනුවෙන් විදේශ ණය ලබා ගැනීමට අපට සිදු විය. විදේශ වෙළඳ ශේෂයේ හිඟයට වාර්ෂිකව එලෙසින් එකතු වූ ඩොලර ණය ප්‍රමාණයද එන්න එන්නම විශාල වූවකි.

යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා යැයි විදේශ ණය ගැනීමේ සමාජ අවසරයක්ද මේ ආණ්ඩු වලට ලැබිණ. ජාවාරම්කාර ගනුදෙනු සමග එවැනි සමාජීය ඉඩ හැරීම් සමග නෙළුම් කුළුණු දක්වා හැම ව්‍යාපෘතියකම යෝධ දූෂණ සඳහා ඉඩ තැබිණ. ජනාධිපති ජයවර්ධනගේ ආණ්ඩුව කාලයේ පාර්ලිමේන්තුවේ සිටි එකම වාමාංශික මන්ත්‍රී වූ කලවාන ආසනය නියෝජනය කළ

කොමියුනිස්ට් පක්ෂයේ නීතිඥ සරත් මුත්තෙට්ටුවෙගම මහවැලි සංවර්ධන ව්‍යාපෘතියෙහි දූෂණ සම්බන්ධව සවිස්තරාත්මක තොරතුරු පාර්ලිමේන්තුවට වරක් ඉදිරිපත් කළේය. ඒ කිසිවක් ප්‍රතික්ෂේප නොකළ මහවැලි සංවර්ධන ඇමති නීතිඥ ගාමිණී දිසානායකගේ පිළිතුර වූයේ මුත්තෙට්ටුවෙගම මන්ත්‍රීගේ වාමාංශික දේශපාලන මතවාදය අනුව ඔහු සඳහන් කරන ''දූෂණය'' ධනේශ්වර ආර්ථිකයෙහි ''කොමිස් මුදල්'' යැයි ගණන් හදන අමතර ගෙවීම් බවය. එවැනි ගෙවීම් නොමැතිව වසර 30 ක ව්‍යාපෘතියක් තමන්ට වසර 06 කින් සම්පූර්ණ කළ නොහැකි බවත් ඒ වෙනුවෙන් සියයට 10 ක සිට 15 දක්වා ප්‍රතිශතයක් ඇස්තමේන්තු හැදීමේදී ගණන් බලා ඇතැයිද ඔහු පැහැදිලි කළේය.

එතැන් සිට දසක දෙකක පමණ කාලයකට පසු රාජපක්ෂ යුගය දක්වා වන විට සියයට 10 යැයි කියූ කොමිස් ගෙවීම් වේගයෙන් සියයට 20 නැතිනම් 25 ද පසුකර තිබිණ. විවෘත වෙළඳපල ආර්ථිකයෙහි ජාවාරම්කාර ගනුදෙනු සිදුවන්නේ ආණ්ඩු බලයේ මැදිහත්වීම් වර්ධනවීමත් සමගින්ය. රාජපක්ෂ පාලනයේ එය උපරිම විනාශයක් දක්වා ඉහළ යන්නේ මහින්ද රාජපක්ෂගේ දෙවන ධූර කාලයෙහිය. පළමු ධූර කාලයේ යුද්ධය සමග හදිසි මිලදී ගැනීම් සිදුවූයේ අවි ආයුධ, බැර යුධ ආම්පන්න වැනි සීමිත ක්ෂේත්‍රයකය. ඉන් පසු යුධ ජයග්‍රහණයෙන් ඔවුන්ට ලැබුණු කීර්තිය සිංහල-බෞද්ධ සමාජයේ ''මහ රජාණෝ'' යැයි රජ කිරුළු පැළඳීම දක්වා ප්‍රසාරණය කෙරෙන විට, ඔවුන්ට ඕනෑම දෙයක් කිරීමේ බලපත්‍රයක්ද දකුණේ බහුතර සමාජය විසින් ලබා දෙනු ලැබිණ.

එයටම යා වුනු තවත් කාරණාවක් ඇත. යුධ සහ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ සම්බන්ධයෙන් දෙමළ ඩයස්පෝරාවේ සෘජු මැදිහත්වීම් සමග බටහිර රටවල ඉතා වේගයෙන් මතුවූ රාජපක්ෂ විරෝධයට මුහුණ දීම පිණිස රාජපක්ෂ ආණ්ඩුව පිහිට පැතුවේ චීන රජයේ ගෝලීය ශක්තියෙනි. බිඳ වැටුණු සෝවියට් කඳවුරේ දේශපාලන තර්කනයට වෙනස්ව, කොමියුනිස්ට් පක්ෂයේ දැඩි දේශපාලන ග්‍රහණය යටතේ තබා ගෙන ගෝලීය ආර්ථික බලය සඳහා ගමන් අරඹා තිබූ චීනයටද ශ්‍රී ලංකාවෙහි පය ගැසීමේ භූ-දේශපාලනික උනන්දුවක් තිබිණ. දෙපාර්ශවයේ මේ වුවමනාවන් පහසුවෙන් ඉටුකර ගත හැකි වූයේ චීනයද විවෘත වෙළඳපල ආර්ථිකයකට දොර හැරි පසු කොමියුනිස්ට් පක්ෂය සමගින්ම ලොව දූෂිත රටවලින් ප්‍රධාන දූෂිත රටක් වූයෙනි.

## අ. ආණ්ඩු පාලනයේ
## සමස්ථ දේශපාලන දේහය බිඳ වැටීම

මේ දූෂිත භූ-දේශපාලනික සුසංයෝගය සමග මහජන මුදල් සොරකම් කිරීමේ සැළසුම් හැදුනේ ඇතැමුන් සපථ කරන අයුරු රාජපක්ෂ නිවස්වල නොවේ. මැතිවරණ ගැන විශ්වාසය තබමින් මේ දූෂණ කතා රාජපක්ෂලාට ලඝු කරනවුන් සමස්ථ අර්බුදයෙහි තමන් වග උත්තරකරුවන් නොවන්නට උත්සාහ දරන්නෝ වෙති. යෝධ දූෂණ සමග අප අද වැටී ඉන්නා බංකොලොත් අඩියෙන් නැවත ගොඩ ඒමට නම්, එයට එක හා වැදගත් ප්‍රධාන සාධක කිහිපයක් ඇති බව තේරුම්ගත යුතුව ඇත. බොහෝවිට එහි ආරම්භය ඇතැමුන්ට අනුව විවෘත වෙළඳපල ආර්ථිකය නිසා යැයිද නැතිනම් දේශපාලන බල තන්ත්‍රය නිසා යැයිද තර්ක කෙරුණාට, ඇත්තටම ඒ කතාවත් දරු උපතක් ආරම්භ වන්නේ පියාගෙන්දැයි නැතිනම් මවගෙන්දැයි අසන්නාක් වැන්නකි.

ජාතික ආර්ථිකයෙහි ආනයන අපනයන වෙළඳාම් සඳහා එතෙක් වූ සීමා තහංචි 1978 දී නිදහස් කිරීම ජයවර්ධන ජනාධිපතිගේ දේශපාලන තීන්දුවකි. අනතුරුව විවෘත වෙළඳපල තහවුරු වන්නේ හෙමින් සීරුවේ වුවත් අති දූෂිත ආර්ථික ක්‍රියාවලියක් වශයෙනි. ප්‍රධාන දේශපාලන පක්ෂ සමගින් පෞද්ගලික ලාභ සඳහා රාජ්‍ය අනුග්‍රහය සහිත ගනුදෙනු වලට මුල පුරනු ලැබූයේ මේ නිදහස් කෙරුණු වෙළඳපල ආර්ථිකයේ හැදුනු ජාවාරම්කාරයින් විසින්ය.

ඒ ආරම්භය දේශපාලනිකව කියවන්නේ නම්, ආයෝජන සඳහා ප්‍රමාණවත් ආයෝජන නොතිබුණු පෞද්ගලික ක්ෂේත්‍රයේ ප්‍රසාරණය සඳහා රාජ්‍ය හවුලක් අවශ්‍ය විය. ඒ රාජ්‍ය අනුග්‍රහය සමග ස්වාධීන පෞද්ගලික ව්‍යාපාරික ප්‍රජාවක් හැදුනේ නැත. වෙළඳපල විවෘත කිරීමේ දේශපාලන තීන්දුව විසින් ඉහළ කලමනාකාරිත්වයක් සහිත වෙළඳපල තරගකාරිත්වයකට අනුගතවන දියුණු ව්‍යාපාරිකයින් හැදෙන වෙළඳපලක් සඳහා ඉඩක්ද නොතැබුණි. ඒ වෙනුවට වෙළඳපල තරගය සඳහා බටහිර ලෝකයේ සීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පැවති නව තාක්ෂණික මෙවලම් හා උපකරණ වෙත නැඹුරු වූහ.

එවැනි තාක්ෂණික යෙදවුම් පළමුව පැමිණියේ මුද්‍රණ කර්මාන්තයට ය. ඒ පාරිභෝගික ආකර්ශණය සඳහා වෛවර්ණ ඇසුරුම් මුද්‍රණයටත් දියුණු සැහැල්ලු ඇසුරුම් නිපැයීමටත් විය. නවීන මුද්‍රණ තාක්ෂණය විසින් පුවත් පත් මුද්‍රණය නවීකරණය කෙරුණු

අතර වාරික සඟරා ප්‍රකාශනයටද වැඩි පහසුවක් ලබා දුන්නේය. සන්නිවේදනයේ ඒ දියුණුව සමග වෙළඳපල ප්‍රචාරණ කාර්යන්ද වේගවත් විය. තරගයද තියුණු විය. එවැනි තරගයක, රාජ්‍ය අනුග්‍රහය නැතිව වෙළඳපල අත්පත් කර ගැනීමටද නොහැකි විය. එනිසා නිදහස් වෙළඳපල ආර්ථිකය උපතින්ම දූෂිත විය.

එවැන්නක් පවත්වා ගැනීම වෙනුවෙන් ජයවර්ධන ජනාධිපති දේශපාලන වටපිටාව හැදුවේ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමෙනි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත පුරවැසියන්ගේ බලපෑම් අවම කිරීම වෙනුවෙන් ඔහු මැතිවරණ ආසනය දිස්ත්‍රික්කය දක්වා විශාලකර ඒ සඳහා මන්ත්‍රීවරුන් තේරීම ඡන්ද අනුපාත මත තීන්දු කෙරෙන ලෙස වෙනස් කළේය. අනුපාත ක්‍රමයට මන්ත්‍රීවරුන් තේරීම සඳහා මනාප ඡන්දයකුත් එකතු කළ පසු අලුත් සන්නිවේදන මෙවලම් සමග දිස්ත්‍රික්කයක් ආවරණය කෙරෙන එවැනි මැතිවරණයකට තරග කිරීම සඳහා අතිශය විශාල මුදලක් අවශ්‍ය විය. දේශපාලන පක්ෂ වලටද මැතිවරණ ව්‍යාපාර සඳහා එළෙසින්ම විශාල අරමුදල් අවශ්‍ය විය. එබැවින් මැතිවරණ සඳහා නාමයෝජනා ලබා ගැනීමේදී මැතිවරණ ව්‍යාපාරය සඳහා මුදල් වැය කළ හැකිවීම මූලික කොන්දේසියක් බවට පත් විය. කෙටියෙන් කිවහොත් ඒ සඳහා අපේක්ෂකයින් සීඝ්‍රයෙන් පොහොසත් විය යුතුවූ අතර, දේශපාලන පක්ෂ වලට පොහොසත් ව්‍යාපාරික අනුග්‍රහයද තිබිය යුතු විය.

ආණ්ඩු බලයට අත පෙවිය හැකි දේශපාලන නායකයින් සහ ඔවුන්ගේ පක්ෂ සමග ජාවාරම්කාර ව්‍යාපාරික ගනුදෙනුව සඳහා තවත් උත්තේජනයක් හැදෙන්නේ එළෙසිනි. එවැනි ගනුදෙනු වලට ඇතුලු වූ ව්‍යාපාරිකයින් සහ දේශපාලන පක්ෂ නායකයින් අතර වූ සම්මුතිය වූයේ, වැඩි ව්‍යාපාරික ලාභ වෙනුවෙන් රාජ්‍ය කොන්තරාත් ලබා දීමේ නොනිල වූවත් කඩ නොකළ හැකි එකඟතාවයකි.

දේශපාලන සම්මුති මත ආයෝජන සිදුවන, ඒ සමගින් ලාභ ප්‍රමාණ තීන්දු කෙරෙන ආර්ථිකයක, ස්වාධීන තරගකාරී හැසිරීම් මත ක්‍රියාත්මකවන වෙළඳපල ආර්ථිකයක් පවතින්නේ නැත. න්‍යායිකව අර්ථ දක්වා ගන්නා ධනේශ්වර වර්ධනයක තිබිය යුතු යැයි තර්ක කෙරෙන ප්‍රජාතන්ත්‍රවාදී සමාජ පැවැත්මක් ජාවාරම්කාර ආර්ථිකයක වර්ධනය වන්නේ නැත. දේශපාලන සම්මුති මත ධනය ඒකරාසි කෙරෙන මෙවැනි ධනේශ්වර වෙළඳපල ආර්ථිකයක ප්‍රජාතන්ත්‍රවාදයක් සඳහා ඉඩක් නොතැබෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදී

ආණ්ඩු පාලනයක් සමග ජාවාරම්කාර ව්‍යාපාරික සම්මුති නඩත්තු කළ නොහැකි හෙයිනි.

එනිසා ඒවායේ ධනේශ්වර චින්තනයක් සහිත නවීන පන්නයේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජ හැදෙන්නේ නැත. ඒවායේ හැදෙන ජාවාරම්කරුවන් නූතන ලෝකයේ තොරතුරු තාක්ෂණය, විද්‍යුත් සන්නිවේදනය, අධිවේගී නිෂ්පාදන ක්‍රමවේද භාවිත කළද, ඔවුන්ගේ පුද්ගලික වටිනාකම්, ආකල්ප, අපේක්ෂා අතිශය අශිෂ්ට, ප්‍රාථමික, බාල පෞරුෂයක ප්‍රකාශනයකි. ඔවුන්ගේ සේවක කලමනාකරණය එනිසා ගෝත්‍රික බලහත්කාර මානසිකත්වයකින් සිදු කෙරෙන්නකි. මනුස්සයින් ලෙස නොසළකන, සේවක සේවිකාවන් යන්ත්‍ර මෙන් හසුරුවා ගැනීමේ පාලනයක් මිස, දියුණු කලමනාකාරිත්වයක් ඔවුන්ට අදාල නැත. ඔවුන්ට ඇත්තේ අතීතයේ පැවති ''පිරිස් කලමනාකරු'' නාමය නවීන ලෝකයට ගැලපෙන ලෙස ''මානව සම්පත් කලමනාකරු'' යැයි වෙනස්කර ගනු ලැබීමක් පමණි.

මේ විකෘතිය දැකිය හැක්කේ ආයෝජන මණ්ඩලයේ නිර්දේශිත අපනයන නිෂ්පාදන ක්ෂේත්‍රයෙහි කර්මාන්ත ශාලා 1,600 ක් ඇතැයි ඔවුන්ගේ නිල වෙබ් අඩවියෙහි සඳහන්ව ඇතත් ඒවායෙන් සමාගම් දුසිමකවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 14.1 වගන්තිය යටතේ සහතික කර ඇති මූලික අයිතිවාසිකමක් වන වෘත්තීය සමිති පිළිගෙන නොතිබීමෙහිය. එම මූලික අයිතිය ඔවුන් නොපිළිගන්නවා පමණක් නොව, වෘත්තීය සමිති සංවිධානය කිරීමට අත ගසන සියලු සේවකයින් ඔවුහු වහා සේවයෙන් නෙරපන්නාහ. මේ විවෘත වෙළඳපල ආර්ථිකයෙහි ආයෝජනය කෙරෙන සියලු කර්මාන්ත ශාලා පාලනය කෙරෙන්නේ අර්ධ වහල් සේවකයින්ගෙන් බලහත්කාරයෙන් වැඩ ගන්නා ආකාරයෙනි. නූතන සමාජයක ආත්ම ගෞරවයක් ඇතිව සේවය කිරීමට අවශ්‍ය නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී පරිසරයක් ඒවායේ නැත. වර්තමානයේ මේ ජාවාරම්කාර හාම්පුතුන් හැසිරෙන්නේ නවීන විලාසිතා වලින් සැරසුණු පැරණි නූගත් වහල් හිමියන් ලෙසිනි. හැඩරුව ඉහළය. වැඩ අති බාල ය.

මෙවැනි ජාවාරම්කාරයින් විසින් නඩත්තු කෙරෙන දේශපාලන පක්ෂවල හැදියාව සහ පැටිකිරියද මඳක් විමසිය යුත්තකි. සම්මත මැතිවරණ දේශපාලනය ආරම්භයෙහි, 1947 මහ මැතිවරණයෙහි ප්‍රධාන දේශපාලන ධාරාවේ පක්ෂ ලෙස ගණන් ගත හැකිව තිබුයේ පක්ෂ කිහිපයකි. දකුණේ පක්ෂ වූයේ එක්සත් ජාතික පක්ෂය, වැවිලිකරයට සීමා වූ ලංකා ඉන්දියානු කොන්ග්‍රසය සහ පළමු

වාමාංශික පක්ෂය වන සමසමාජ පක්ෂය හා ඉන් වෙන්වුනු කොමියුනිස්ට් පක්ෂයත්, බොල්ෂෙවික් ලෙනින්වාදී පක්ෂයත් ඒ.ඊ.ගුණසිංහ ආරම්භ කර තිබූ කම්කරු පක්ෂයත් පමණි. උතුරේ සමස්ථ ලංකා ද්‍රවිඩ කොන්ග්‍රසය විය. රජිනගේ නීතිඥ ජී.ජී. පොන්නම්බලම්ගේ සමස්ථ ලංකා ද්‍රවිඩ කොන්ග්‍රසය 1950 දී දෙකඩවී ෆෙඩරල් පක්ෂය යැයි කියූ ''ඉලංකෛ තමිල් අරසු කච්චි'' පක්ෂය චෙල්වනායගම්ගේ නායකත්වයෙන් හැදින. එ.ජා.පය දෙකඩවී බණ්ඩාරනායකගේ නායකත්වයෙන් 1951 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රී.ල.නි.ප) හැදින. එතැන් සිට දකුණේ ප්‍රධාන දේශපාලන බෙදිල්ල වූයේ එ.ජා.පය සහ ඊට ප්‍රතිපක්ෂ ශ්‍රී.ල.නි.ප විය.

මේ දෙපිළ මුල් කරගෙන 1977 න් පසු නැවත නැවතත් බෙදී වෙන් වූ කුඩා පක්ෂ දුසිම් දෙකක් පමණ මේ වනවිට මැතිවරණ දේශපාලනයට පැමිණ සිටිති. ඉන් තෙවැනි කුලකයක් වශයෙන් දැන් තහවුරුව ඇත්තේ 1978 න් පසු සහ නැවත 1993 දී දෙවන වරටත් විවෘත දේශපාලනයට පැමිණි ජනතා විමුක්ති පෙරමුණ (ජ.වි.පෙ) ය. එහෙත් සාම්ප්‍රදායික වමේ පක්ෂ 1965 න් පසු ඇමීබාකරණයවීමෙන් දැන් වමේ යැයි සැළකිය හැකි මතවාදයක් රැගත් කිසිදු ''වමේ'' පක්ෂයක් නැත. නිතර රතු කමිස හඳින, සිය වේදිකා රතුවෙන් සරසන, සිංහල-බෞද්ධ ජ.වි.පෙට ''මාක්ස්වාදී'', '' වාමාංශික'' වැනි විශේෂණ යොදන්නේ මාධ්‍ය විසින්ය. දැන් ''වමේ'' යැයි කියා ගන්නේ සමසමාජ හෝ ශ්‍රී ලංකා කො.ප සමග පැරණි ඥාති සම්බන්ධකම් සොයා ගත හැකි, මැයි දිනයට රතු කමිස හඳින, තමන්ගේ දේශපාලනය කම්කරු පංති දේශපාලනය යැයි කියන, කුඩා කල්ලි කිහිපයක් පමණි. එය '77 න් පසුව ගෝලීය වශයෙන්ද එවැනිය.

## එක රටක දේශ දෙකක්

මේ ලංකාවේ 1977 න් පසු දේශයන් දෙකක් හැදෙන්නේ දෙමළ ජනතාවගේ අයිතිවාසිකම් පාගා දමන්නට සිංහල මහ ජාතිය පියවර ගතහොත් යැයි 1956 දී කීවේ සමසමාජ පක්ෂයේ ප්‍රධානියෙකු වූ ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා ය. කොල්වින්ගේ පුරෝකතනය 1983 සිට අවුරුදු 25 ක කාලයකදී මෘග යුද්ධයකින් කෙළවර වූයේ වෙනම දෙමළ ඊළාම් රාජ්‍යයක් හැදීමට සටන් වැදි විමුක්ති කොටි පරාජය වූයෙනි.

එසේ වෙනම ඊළාම් රාජ්‍යයක් මේ රටේ බිහි නොවුනාට, '77 න් පසු විවෘත වෙළඳපල ආර්ථිකය විසින් දසක 04 ට වැඩි කාලයක් පුරා මේ රටේ භූගෝලීය දේශ සීමා නොමැති ''ආර්ථික දේශ'' දෙකක් නිර්මාණය කර ඇත. එකක් ඉහළ නාගරික මැදපංතිකයින් ප්‍රමාණයක්ද ඇතිව සමස්ථ රටේ වත්කම් හා ආදායම් ප්‍රමාණයෙන් සියයට 43 ට වැඩි විශාල ධනස්කන්ධයක් ගොනු වූ කොළඹ කේන්ද්‍රීය පොහොසත් සුළුතරයකගේ නාගරික දේශයකි. එය මේ රටේ ''ජාවාරම්කාර දේශයයි''. දෙවැන්න ග්‍රාමීය හා අර්ධ නාගරිකයින්ද ඇතුළත් රටේ වත්කම් හා ආදායම් ප්‍රමාණයෙන් සියයට 20 ට අඩු ප්‍රමාණයකට අත ගසා ඉන්නාවූ සහ බොහෝවිට ක්ෂුද්‍ර ණය මත ජීවිත එල්ලා තබන විශාල පුද්ගල පිරිසකි. එය ''අතරමංවූ'' ලාංකීය දේශයයි. මේ දෙගොල්ලන් අතර ඉතිරිවන පුද්ගල සංඛ්‍යාව ණයට ජීවිත ගැට ගසා ගන්නා පිරිසකි. ඔවුන් විවෘත වෙළඳපල ආර්ථිකයෙහි නාගරික හා අර්ධ නාගරික පහළ මැදපංතිකයින් ලෙස රැඳෙන්නේ උකස් කිරීම්, කල් බදු, මූල්‍ය ණය, බැංකු ණය සහ ක්‍රෙඩිට් කාඩ් පත් සමගින්ය. සිය ජීවිත කාලයම ණයට ගෙවන්නට සිදුවන මේ පහළ මැදපංතිකයින් ග්‍රාමීය දුප්පතුන්ටද වඩා අසීරු ජීවිත ගත කරන වුන්ය.

මේ රටේ ''අතරමංවූ'' ඒ ලාංකීය දේශයෙහි දුප්පත්කම ගණන් හදන්නේ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරී මහත්ම මහත්මීන් විසින් ගණනය කරන දරිද්‍රතා රේඛාවට අනුවය. පසුගිය (2020) ජනවාරි මාසයේ එක් පුද්ගලයෙකු විසින් මාසයක් තුල උපයනු ලබණ රුපියල් 5,021 ක ආදායම, දරිද්‍රතාව තීන්දු කිරීමේ උපරිම ආදායම් මට්ටම ලෙස ඔවුහු සැළකූහ. ඔවුන්ගේ ඇගයුමට අනුව රු. 5,022 ක් උපයන්නෙකු දුප්පතෙකු නොවේ. මෙමගින් සිදු කෙරෙන්නේ මේ රටේ මිලියන 21 ක ජනතාවගෙන් දුප්පතුන් ඇත්තේ සියයට 4.1 ක් යැයි කීමය.

ඊළඟට එම සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවම තෙවසරකට වරක් පවත්වන ඔවුන්ගේ ගෘහියික ආදායම් හා වියදම් සමීක්ෂණය 2019 දී පවත්වා තිබිණ. එහි පවුලක ආදායම්ලාභීන් ඇත්තේ 1.8 ක් යැයි සළකමින් (පුරුෂ හා ස්ත්‍රී වැටුප් විෂමතාව පිළිගනිමින්) පුද්ගලයින් 4.2 ක් ඉන්නා නාගරික පවුලකට අත්‍යාවශ්‍යම ආහාර සඳහා මාසිකව රුපියල් 26,907 ක්ද අනෙක් මූලික අවශ්‍යතා සඳහා රුපියල් 68,485 ක්ද වශයෙන් රුපියල් 95,392 ක් මාසිකව අවශ්‍ය යැයි ගණන් බලා තිබිණ. ග්‍රාමීය සමාජයේ නම් ඒ එකතුව රුපියල් 57,652 ක් යැයිද, වැවිලිකරයේ ඒ සඳහා රුපියල් 38,519 ක් යැයිද ගණන් හදා තිබිණ.

මේ සංඛ්‍යා මගින් කියන්නේ කුමක්ද? අඩුම වියදමක් අවශ්‍ය යැයි පැවසෙන වැවිලිකරයේ පවා අවම මූලික අවශ්‍යතා සමගින් ජීවත් වන්නට පවුලකට මසකට රුපියල් 38,519 ක් අවශ්‍ය වන බවය. එහෙත් සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව දරිද්‍රතා රේඛාව සකසන්නේ මාසික ආදායම රුපියල් 5,021 ක් ලෙසිනි. ඔවුන්ගේ ගණන් බැලීමට අනුව වැවිලිකරයේ පවුලක ආදායම්ලාභීන් වන්නේ පුද්ගලයින් 2.1 ක් නම්, ඒ පවුලේ මාසික ආදායම වන්නේ රුපියල් 10,525 ක් පමණි. එවැනි පවුලකට වැවිලිකරයේ පවා යාන්තමින් ජීවත් විය හැක්කේ දින 08 ක් පමණි.

පෞද්ගලික අංශයේද එය එළෙසමය. ඇඟළුම් ක්ෂේත්‍රයේ කිසිදු සේවක සේවිකාවකට මසකට දින 26 ක් පමණ අතිකාල හා අනෙක් සියලු දීමනා සමග උපයා ගත හැක්කේ රුපියල් 30,000 ක පමණ ආදායමකි. නිදහස් වෙළඳ කලාපවල තත්ත්වයද එවැනිම ය. පෞද්ගලික අංශයේ එවැනි ආදායම් මට්ටමේ සේවක පිරිස මිලියන 02 ක් පමණ වේ. ඔවුන්ගේ අවම මාසික වැටුප තවමත් රුපියල් 15,000 කි.

තවමත් අවාසනාවන්ත අත හැරීමක් ලෙස ඇත්තේ ප්‍රධාන නගර, විශේෂයෙන් කොළඹ නගරය ඇසුරෙන් විශාල වශයෙන් ගොනුවන අවිධිමත් ආර්ථිකය සහ කිසිදු ස්ථිරතාවක් නොමැතිව එහි ආදායම් සොයන්නට උරච්චිවන තරුණ තරුණියන්ගේ කතාව ය. පිළිගත් සම්මත සංවිධාන වලින් බැහැරව, කම්කරු හා කාර්මික නීති මගින් ආවරණය නොවන සහ ස්ථාවර සේවා සහතිකයක් නොමැති මේ අවිධිමත් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විධිමත් ක්ෂේත්‍රය හා අදාලව කෙරෙන ආකාරයේ නිල නියාමන කාර්යන් කෙරෙන්නේද නැත. ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) විසින් 2008 දී පවත්වා ඇති ක්ෂේත්‍ර අධ්‍යනයකට අනුව, මෙරට සමස්ථ සේවක සංඛ්‍යාවෙන් සියයට 66 ක් අවිධිමත් ආර්ථිකයෙහි සේවක සේවිකාවන් ය. ඉන් බහුතරයක් ආදායම් සොයා ගන්නේ නිෂ්පාදන හා සේවා සැපයුම් ඇසුරෙනි. සියයට 50 ට ආසන්න සංඛ්‍යාවක් ස්වයංරැකියාලාභීන් ලෙස නම් කෙරෙන, ස්ථිර ආදායමක් නොමැති තනි පුද්ගලයින් ය. අනාරක්ෂිත බව මේ අවිධිමත් ක්ෂේත්‍රයෙහි ආවේනික ලක්ෂණයකි. (විස්තර සඳහා - https://www.ilo.org/wcmsp5/groups/public/---asia/---ro-bangkok/---sro-new_delhi/documents/publication/wcms_123348.pdf )

විවෘත වෙළඳපල ආර්ථිකයෙහි දුප්පත්කම තීන්දු කෙරෙන්නේ විවෘත වෙළඳපල සාර්ථක යැයි කීමට හැකිවන අයුරු සංඛ්‍යා ලේඛන හා දත්ත පෙළ ගැස්වීමෙනි. එබැවින් දුප්පත්කමට විසඳුම් කතා කිරීමක් නැත. ඇත්තේ එයද මැතිවරණ සඳහා අලෙවි

කරගන්නේ කෙසේද යන්න පමණි. ඉතිහාසය පුරා සමාජ-ආර්ථික "විෂමතාව" නඩත්තු කෙරුණේ ඒ වෙනුවෙන් නිෂ්පාදනය කෙරුණු "මතවාද" සමගින් යැයි ප්‍රංශ ආර්ථික විද්‍යාඥ තොමස් පිකෙටි පවසන්නේ එනිසා වෙනි.

මෙවැනි විශාල අසංවර අවිධිමත් ආර්ථිකයක් පවතින්නේම ජාවාරම්කාර වෙළඳපලකය. විධිමත් විනය ගරුක ආයෝජන කලමනාකාරිත්වයකට ඇති නුසුදානම සමග ය. එබැවින් වර්ධනය වන අවිධිමත් ආර්ථිකය ''අතරමංවූ'' ලාංකීය දේශයෙහි අවසලස්සනම ප්‍රදේශය වන්නේය.

## ප්‍රජාතන්ත්‍රවාදයක් නොදන්නා පක්ෂ

මේ පසුබිමෙහි දේශපාලන පක්ෂවලට සිදුව ඇත්තේ කුමක්ද? ඔවුන් ඉන්නේ අතරමංවූ ලාංකීය දේශයෙහිද, නැතිනම් දූෂිත ජාවාරම්කාර දේශයෙහිද? දේශපාලන පක්ෂවල පරිනාමය ඇත්තේ ඒවායේ සංවිධානගත ප්‍රජාතන්ත්‍රවාදයක් නොතිබීමෙහිය. අතීතයේ සිටම දේශපාලන පක්ෂ සතු අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදයක් තිබුණේ සමසමාජ පක්ෂය ප්‍රමුඛ ඉන් බිඳී වෙන්වූ පක්ෂ කිහිපයට පමණි. අතීතය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු නොදන්නා අලුත් පිරිස් දේශපාලනයට පැමිණ ඇති හෙයින්, පක්ෂ සංවිධාන සතු සක්‍රීය අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදී පැවැත්ම සම්බන්ධ එක් නිදසුනක් සඳහන් කළ යුතු යැයි සිතුනෙමි.

ලංකා සමසමාජ පක්ෂය විශේෂයෙන් නාගරික කම්කරු සංවිධාන සමගින් රාජ්‍ය බලය සම්බන්ධ සිය දේශපාලනය තීන්දු කර තිබූයෙන් බහුතර ග්‍රාමීය ඡන්ද සඳහා එතරම් ආකර්ශනයක් ඔවුන්ට නොතිබුණි. එනිසා මැතිවරණ දේශපාලනයේදී ඔවුන් තීරණාත්මක බලයක් නොවුනි. 1947 පළමු පාර්ලිමේන්තු මැතිවරණයෙන් ආසන 10 ක් සමග ප්‍රධාන විපක්ෂය ලෙස විපක්ෂ නායක කම සමසමාජ පක්ෂයට ලැබුණද, 1952 දෙවන පාර්ලිමේන්තු මැතිවරණයේදී වසරක් වයසැති බණ්ඩාරනායකගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රී.ල.නි.ප) ලබා ගත් ඡන්ද ප්‍රමාණය හෝ සමසමාජයට ලබා ගත නොහැකි විය. ශ්‍රී.ල.නි.ප සියයට 15.5 ක් ලබා ගන්නා විට, සමසමාජ පක්ෂයට ලැබුණේ සියයට 13.1 ක් පමණි. වසර 04 ට පසු ශ්‍රී.ල.නි.පය පිලිප් ගුණවර්ධන සමග ඇතිකර ගත් මහජන එක්සත් පෙරමුණ ලෙස 1956 මහ මැතිවරණයේදී ආණ්ඩුවක්ද පිහිටුවා ගත්හ. 1960 ජූලි මහ මැතිවරණයෙන්ද  බණ්ඩාරනායක

මැතිනිය අගමැතිනිය ලෙස ශ්‍රී.ල.නි.පය ස්ථාවර ආණ්ඩුවක් පිහිටුවීය.

එවැනි දේශපාලන පසුබිමක සමසමාජ පක්ෂය අභ්‍යන්තරයෙහි ආණ්ඩු බලය සම්බන්ධ විවාදයක් ඇති විය. එය දිගින් දිගටම වර්ධනය වුයේ 1964 ආරම්භයේදී ඇන්.ඇම්. ප්‍රමුඛ කණ්ඩායමක් බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුවේ හවුල්කාර පක්ෂයක් ලෙස එකතු විය යුතු යැයි යෝජනා කිරීමත් සමගය. ඊට විරුද්ධව එඩ්මන් සමරක්කොඩි, කාරාලසිංහම්, පැලිස් සේරසිංහ, බාලා තම්පෝ ඇතුළු කණ්ඩායමක් සභාග දේශපාලනයට විරුද්ධ ඔවුන්ගේ අදහස් ඉදිරිපත් කළ හෙයින්, ඒ සම්බන්ධ තීන්දුවක් ගැනීමට විශේෂ පාක්ෂික නියෝජිත සමුළුවක් කැඳවීමට පක්ෂ මධ්‍යම කාරක සභාව තීන්දු කළේය. එම පාක්ෂික නියෝජිත සමුළුවෙහි තීන්දු ගැනීම සඳහා ඇන්.ඇම් ප්‍රමුඛ පිල සහ එඩ්මන් සමරක්කොඩි, කාරාලසිංහම් ප්‍රමුඛ පිල ඔවුන්ගේ දේශපාලන ස්ථාවර වෙන වෙනම ලිඛිතව පක්ෂයට ඉදිරිපත් කළහ. ඒ සමග ලෙස්ලි කොල්වින් ප්‍රමුඛ මධ්‍යස්ථ කණ්ඩායමක් සම්මුතිවාදී තෙවන යෝජනාවක්ද ඉදිරිපත් කළහ. ඔවුන්ගේ යෝජනාව වූයේ ඇමති වගකීම් බාර නොගෙන ආණ්ඩුවට නිල සහායක් ලබා දීම ගැනය.

පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අත්දැකීමෙහි වැදගත් කම ඇත්තේ, මේ කණ්ඩායම් තුනේම ලිඛිත යෝජනා සියලු පක්ෂ ශාඛා වෙත ලබා දීමත් ඒවා ගැන අදහස් දැක්වීමේ අයිතිය කණ්ඩායම් 03 ටම එක හා සමානව සහතික කිරීමෙහිත්ය. පක්ෂ ශාඛා සමග තම යෝජනා සාකච්ඡා කිරීම වෙනුවෙන් දින යොදා ගැනීමට කණ්ඩායම් 03 ට පූර්ණ නිදහසක් තිබිණ. ඒ අනුව පක්ෂ ශාඛා විසින් බහුතර ඡන්දයෙන් සම්මත කරන යෝජනාව වෙනුවෙන් ශාඛා සාමාජික සංඛ්‍යාව අනුව නියෝජිත සංඛ්‍යාවෙන් අවම සියයට 60 ක්ද සෙසු යෝජනා 02 ට ලැබෙන ඡණ්ද අනුපාත අනුව නියෝජිතයින් තීන්දු කිරීමද සිදුවිය.

පක්ෂ අභ්‍යන්තරයේ මාස 04 ට වැඩි කලක් පැවති සංවාදයෙන් පසු විශේෂ පක්ෂ නියෝජිත සම්මේලනය කොළඹ නව නගර ශාලාවෙහි 1964 ජුනි මස 04 වන දින පැවැත් වූයේ පක්ෂ ශාඛා විසින් එළෙසින් පත් කළ නියෝජිතයින් ගෙනි. එම සම්මේලනයේද පාර්ශව 03 ටම අවසාන වශයෙන් තමන්ගේ යෝජනා ගැන අදහස් දක්වන්නටත් ඒ යෝජනා ගැන විවාද කරන්නට පාක්ෂික නියෝජිතයින්ටත් වෙලාව වෙන්කර තිබිණ. අවසානයේ ගනු ලැබූ ඡන්දයෙන් ශ්‍රී.ල.නි.ප ආණ්ඩුවේ හවුල්කාරයින් වීමේ ඇන්.ඇම් ප්‍රමුඛ කණ්ඩායමේ යෝජනාව

සම්මත විය. ඒ සමග තම යෝජනාව පරාජය වීම නිසා එඩ්මන් සමරක්කොඩි, කාරාලසිංහම් ඇතුළු ප්‍රධාන වෘත්තීය සමිති නායක පිරිසක් සමසමාජ පක්ෂයෙන් ඉවත් වන්නට තීන්දු කළහ.

ආණ්ඩු සමග හෝ තවත් දේශපාලන පක්ෂයක් සමග හෝ සන්ධානගතවීම වැනි මූලික ප්‍රතිපත්තිමය තීන්දු ගැනීමේදී ඊට හවුල්වීමේ පාක්ෂික අයිතිය සහතික කෙරෙන ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියක් තුල ඒ තීන්දු ගැනීම ඔවුන් මූලික අවශ්‍යතාවක් ලෙස සැළකුවකි. එනිසා ඒ තීන්දු ගනු ලැබූයේ අද මෙන් කොළඹ පැලපදියම්ව ඉන්නා නායක කල්ලි විසින් රාත්‍රී භෝජන සංග්‍රහ වලදී නොවේ. දීර්ග සාකච්ඡා ඔස්සේ පක්ෂ සාමාජිකත්වයෙහි සෘජු හවුල්වීම් සමගිනි.

කාලයත් සමග සමසමාජ පක්ෂයද එනමුත් හැකිලී පිරිහුණු අතර, අනෙක් ප්‍රධාන පක්ෂ දෙකෙහි සහ ඒ සමග ගැට ගැසෙන පතුරු සංවිධාන සතු එවැනි ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායක් කිසිදා නොතිබුණි. ජවිපෙද ඔවුන් පෙන්වා සිටින අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදයක් ඇති සංවිධානයක් නොවේ. එබැවින් වර්තමානයේ දේශපාලන පක්ෂ යැයි අප කතා කරන්නේ අතීතයේ සිට පක්ෂ නාමය රැගෙන එන දේශපාලන නායක කල්ලි ගැන ය. ඔවුන් රැගෙන එන පක්ෂ නාමය වෙනුවෙන් මාධ්‍ය හමුවේ පෙනී සිටින, මාධ්‍ය ප්‍රකාශ නිකුත් කරන, මැතිවරණ සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීමේ නෛතික අයිතිය පමණක් තබා ගෙන ඇති නායක කල්ලි ගැනය. මේ දේශපාලන නායක කල්ලි සතුව ඉන්නේ සක්‍රීය පාක්ෂිකයින් නොව, නොයෙකුත් සමාජ සම්බන්ධතා මත පැවත එන පාරම්පරික ප්‍රාදේශීය හිතවතුන් සමූහ පමණි. මේ ප්‍රධාන ධාරාවේ දේශපාලනය හා ජන සමාජය අතර ඇති සම්බන්ධය තීන්දු කෙරෙන්නේ ඔවුන් තම පාරම්පරික ප්‍රාදේශීය හිතවතුන් සමග තබා ගන්නා ගනුදෙනුවෙහි සීමා අනුවය.

විවෘත වෙළඳපල ආර්ථිකයෙහි මොවුන්ගේ බලය සහ සමාජ පිළිගැනුම ඔවුන්ම මුදල් මත ප්‍රචාරාත්මකව හදා ගන්නකි. ඒ සඳහා විශාල මුදල් අවශ්‍යවන අතර මොවුන්ගේ කාර්යාල නඩත්තු කිරීමටද ඔවුන් සතු පාක්ෂික අරමුදල් නැත. විවෘත භාවයකින් තොර, පාක්ෂික ක්‍රියාකාරීන්ටවත් නොකියන ආකාරයෙන් රුපියල් කෝටි ගණනක විශාල අරමුදලක් ගොඩ නගා ගෙන ඇති එකම පක්ෂය ජ.වි.පෙ ය. ඒ අතර තම නායකයින්ගේ පුද්ගල යැපීම ගැන ඔවුන් කියන කතා විහිළු ය. මනස්ගාත ය. ආණ්ඩු බලය ලබා සිටි සහ ආණ්ඩු බලය ලැබේ යැයි සමාජ විශ්වාසයක් ඇති අනෙක් ප්‍රධාන පක්ෂ නඩත්තු කෙරෙන්නේ මේ විවෘත ආර්ථිකයෙහි හැදී

වැඩෙන ජාවාරම්කාරයින් විසිනි. තල්ලුකරන පාපැදි වලින් ප්‍රධාන ධාරාවේ දේශපාලනයට පැමිණ ආණ්ඩුවල ඇමතිවරුන් වූ හැම දෙනාම වාගේ කෙතරම් දුර බැහැරින් පාර්ලිමේන්තු පැමිණියත් කොළඹ පදිංචිවී දරුවන් කොළඹ ප්‍රධාන පාසල් වලට ඇතුළුකර ඉතා සුඛෝපභෝගී වත් පොහොසත් ජීවිත ගත කරන්නේ ජාවාරම්කාර අනුග්‍රහ ඇතිවය.

දැන් පාර්ලිමේන්තුවට, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වලට අපේක්ෂකයින් ඉදිරිපත් කරන්නේ මැතිවරණ කොමිසම පමණක් නොව, සමාජයද දේශපාලන පක්ෂ යැයි පිළිගන්නා කොළඹ කේන්ද්‍රීය එවැනි කල්ලි විසින්ය.

## රජයේ ඉහළ නිලධර තීරුව සමග වෘත්තිකයින්ද විශේෂඥයින්ද අලෙවි වීම

මේ විවෘත ආර්ථිකයෙහි ''වෘද්ධි යන්ත්‍රය පෞද්ගලික අංශය'' යැයි ඔවුන් උජාරු බස් දෙඩුවට, පෞද්ගලික අංශය මුදල් යටි මඩි ගසන්නේ රාජ්‍ය අනුග්‍රහය ඇතිවය. රාජ්‍ය බලය සඳහා දේශපාලන අනුග්‍රහයක් නැතිව මේ විවෘත වෙළඳපල ආර්ථිකයෙහි කඩිමුඩියේ මහා ව්‍යාපාරිකයින් වූවන් නැත. ඒ සඳහා ඔවුන්ට රාජ්‍ය බලය හැසිරවීමේ අවකාශයක් අවසරයක් තිබිය යුතුමය. එබැවින් ඡන්දදායකයින් මැතිවරණ වලදී ඡන්දය ලබා දී පත් කරන මන්ත්‍රීවරුන් හා බලයට ගෙනෙන දේශපාලන පක්ෂ වගකීමට බැඳී ඉන්නේ ඡන්දදායකයාට නොව, ඔවුන්ව නඩත්තු කරන ජාවාරම්කාරයින්ටය.

දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධ පාර්ලිමේන්තු විවාදයේදී ''මුදල් වෙළඳපලේ තැරැව්කාරයෝ......ප්‍රාථමික ගැණුම්කරුවෝ......... රට ආර්ථික අර්බුදයක සිටිය නිසා ඒ අය ණයට සල්ලි දුන්නා. ණය දුන්නා ඉතා ඉහළ පොලියකට. ඒ සියලු ලාභ සතයක් අඩු නැතුව ලබා ගන්නවා.......ඒ අයට අත තියන්න බැහැ. බැරිවෙලාවත් අත තියන්න බැහැ. ඒ අය යාළුවෝ. ඒ අය තමයි ඔබලව නඩත්තු කරන්නේ. මැතිවරණ වලට අරමුදල් දෙන්නේ. ඒ අය තමයි මේ වැඩ වලට ඔබලට කප්පම් ගෙවන්නේ'' යැයි යාපනය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සුමන්තිරම් කීවේ, සිංහල-බෞද්ධ දේශපාලනය වෙනුවෙන් පෙනී සිටින ප්‍රධාන ධාරාවේ දේශපාලන පක්ෂ නායකයින්ගේ සහ ජාවාරම්කාරයින් අතර මේ විවෘත වෙළඳපල ආර්ථිකයේ තහවුරුවී ඇති ඥාති සම්බන්ධය ගැනය.

ඒ හේතු නිසාම අපේ මැතිවරණවලදී ජනතාවට දෙන පොරොන්දු සහ ඉදිරිපත් කරන සැළසුම් කිසිවක් ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමේ බලාපොරොත්තු ඇතිව ඉදිරිපත් කෙරෙන පොරොන්දු නොවේ. ඒවා ඡන්ද ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන හිස් ප්‍රතිඥා පමණි. අවසන් වශයෙන් ඒ සියල්ල තීන්දු කෙරෙන්නේ ජාවාරම්කාරයින් විසිනි.

දේශපාලන බල තන්ත්‍රයත් රාජ්‍ය යාන්ත්‍රණයත් අවුරුදු 40 ට වැඩි කාලයක ජාවාරම්කාර ව්‍යාපාරික ග්‍රහණයට නතුව ගරා වැටීම හා ඒවායේ සදාචාර පිරිහීම ගැන විශේෂ අවධානයක් යොමු කළ යුතුව ඇත. රාජ්‍ය යාන්ත්‍රණයේත් දේශපාලන බල තන්ත්‍රයේත් දූෂණ වංචා සමාජයේ පහළටම කාන්දු වන්නකි. කාලයක් පුරා ගමේ පාසල, බෝක්කුව, සණ කසළ වල පවා දූෂණ වංචා එකතු වන්නේය. ඊට ඉහළින් දිස්ත්‍රික් මට්ටමින් සහ පළාත් මට්ටමින් දූෂණ වංචා මඳක් වැඩිපුර සිදුවන්නේය.

එවැනි පිරිහීම් රාජ්‍ය පරිපාලනය අකර්මන්‍ය, අකාර්යක්ෂම ජාලයක් බවට පත් කෙරුණු අතර, යෝධ ණය සඳහා හැදුනු සියලු ව්‍යාපෘති සැළසුම් කිරීමටත් විවිධ ශීර්ෂ අනුව වියදම් ඇස්තමේන්තු සකස් කර සමස්ථ ණය මුදල ගණන් හැදීමටත් කොළඹ ඉහළ පෙළ වෘත්තිකයින්, විශේෂඥයින්, මූල්‍ය කලමනාකරුවන් සහ රාජ්‍ය නිලධාරීන් වෙනම ලක ලැහැස්තිව ඉන්නාහ. ආණ්ඩුවේ නිල තීන්දු ලෙස ඔවුන්ව හවුල්කර ගැනීමේ වගකීම ඉටු වූයේ ඇමති මණ්ඩලය වශයෙන් වාඩි ගන්නා දේශපාලන ප්‍රධානීන්ගෙනි. ඒ කටයුතු ඉටු කරන්නට විශේෂඥයින් ලෙස ඔවුන් හැම හවුල් වන්නේ අත ලෙව කන්නට නොවන බව සිහි තබා ගත යුතුය. එබැවින් මේ සමාජ ආර්ථික බිඳ වැටීමට රාජ්‍ය යාන්ත්‍රණයේ ඉහළ නිලධර තීරුව සමග වෘත්තිකයින්ද විශේෂඥයින්ද බරපතල ලෙස දායකවී ඇත. දායක වන්නාහ.

රජයේ වෘත්තික හා නිලධර පිරිස් විසින් මෙතෙක් සොරා කා ඇති මහජන මුදල් ප්‍රමාණය ගැන පසුගිය මාස ගණනාවකදී යම් හෙළිදරුව්වක් කෙරුණේ ''කෝප් කමිටුව'' යැයි කවුරුත් දන්නා පාර්ලිමේන්තුවේ මහජන ව්‍යාපාර සම්බන්ධ කමිටු රැස්වීම් වලදීය. රජයේ නිලධාරීන් එහිදී ප්‍රශ්න කිරීමට ලක් කෙරුණු විටය. තමුන්ට එල්ල වෙන චෝදනා වලින් නිදහස් විය හැකි යැයි සිතමින් මන්ත්‍රීවරුන් විසින් රාජ්‍ය ආයතන හා ව්‍යාපාර භාරව ඉන්නා නිලධාරීන් ප්‍රශ්න කිරීමෙන් වසර ගණන් නොකඩවා කෙරුණු ඇමතිවරුන් පවා හරියාකාරව නොදැන සිටි මහ පරිමාන දූෂණ

පිළිබඳ තොරතුරු හෙළි විය. රාජ්‍ය නිලධර පද්ධතිය සමස්ථයක් ලෙස අති දූෂිත යැයි ඉන් රටට හෙළි විය.

විවෘත වෙළඳපල ආර්ථික සමගින් වන ආණ්ඩු පාලන අපේ රටේ පමණක් නොව, අසල්වැසි රටවලද මෙලෙසින්ම හෝ මීටත් වඩා දූෂිතය. එවැනි ආණ්ඩු පාලන සතු ආවේනික ලක්ෂණ හා සමාජ ව්‍යසන සටහන් කළහොත් ඒ ලේඛනය මෙවැනිය. 1) යෝධ දූෂණ හා වංචා 2) පරිපාලනය, නීතිය, අධිකරණය, බන්ධනාගාර, සෞඛ්‍ය, අධ්‍යාපනය ඇතුලු සමස්ථ රාජ්‍ය පද්ධතියම දේශපාලනීකරණයවීම, අකාර්යක්ෂමවීම හා දූෂණයට නතු වීම 3) දේශපාලන පක්ෂ ජාවාරම්කාරයින්ගේ මුදලින් නඩත්තු වීම 4) නීතිය සියල්ලන්ට සමානව හා හැමවිට සාධාරණව ක්‍රියාත්මක නොවීම 5) ආදායම් හා වත්කම් බෙදී යාමේ විෂමතාව, පරතරය විශාල වශයෙන් ඉහළ යාම 6) මහජාතියේ බලහත්කාරය හා අන්තවාදය විසින් සමාජය බෙදා වෙන්කර තබා ගැනීම 7) මත්ද්‍රව්‍ය හා අන්තරායකාරී ඖෂධ වෙළඳාම සමාජය ගිල ගැනීම 8) අපරාධ, මිනී මැරුම්, කප්පම් ගැනීම්, ස්ත්‍රී දූෂණ, බලවයස්කාර දැරිවියන් දූෂණ කිරීම් හා විවාහ වීම්, ළමා හිංසන, ළමා අපයෝජන වැනි සියල්ල සීඝ්‍රයෙන් ඉහළ යෑම 9) ජීවනෝපායන් සොයමින් තරුණ තරුණියන් තොග පිටින් ගමෙන් නගරයට සංක්‍රමණයවීම සහ 10) සෞඛ්‍ය, අධ්‍යාපනය, පොදු මගී ප්‍රවාහනය වැනි අත්‍යාවශ්‍ය සේවා පාරිභෝගීකරණයවී අලෙවි වීම දළ සටහනක් පමණි.

අප ආ ගමනේ විවෘත වෙළඳපල ආර්ථිකයෙහි හැඩයත් එයටම ගැලපෙන දේශපාලනයත් සමග මේ අර්බුදය නිර්මාණය වූ ආකාරය තේරුම් ගැනීම දැන් එතරම් අපහසු යැයි නොසිතමි. විවෘත වෙළඳපල ආර්ථිකය යනු ජාවාරම්කාර පැලැන්තියක් බිහි කෙරුණු ලාභ උපරීම කර ගැනීමේ දූෂිත, වංචාකාරී වාණිජ කටයුතු පවත්වා ගන්නා මහ නගර කේන්ද්‍රීය මැදපංතික පාරිභෝගිකයින්ගේ වෙළඳපලකි. තව පැහැදිලි කළහොත් එය දූෂිත ජාවාරම්කාර අවශ්‍යතා වෙනුවෙන් පවත්වා ගන්නා දූෂිත ආණ්ඩු පාලන යටතේ වර්ධනය කෙරෙන මහ නගරවල ව්‍යාප්තවන පාරිභෝගික වෙළඳපලකි. විනයක් නීතියක් සදාචාරයක් නොදන්නා සහ ආණ්ඩුවල දේශපාලන බලය හසුරුවා ගැනීම වෙනුවෙන් දූෂණයත් මහජාතියේ අන්තවාදය හා බලහත්කාරයහත් යොදා ගන්නා, දේශපාලන බල තන්ත්‍රයක හයිය මත පවතින, දූෂිත වාණිජ ආර්ථික මාදිලියකි. එනිසාම ජීවන අවශ්‍යතා, පරිසරය සහ ආත්ම ගෞරවය ගැන කිසිදු තැකීමක් නොකෙරෙන සුළුතරයකගේ මහ පරිමාන ආර්ථික ගසා කෑමකි.

## ආ. අර්බුදය 2023 ට ගෙන ඒම

කොහේදෝ සිට 2022 මැයි මාසයේ 09 වන දින හවස අගමැති පුටුවට පැමිණි එ.ජා.පයේ එකම හුදකලා පාර්ලිමේන්තු මන්ත්‍රී රනිල් වික්‍රමසිංහ දෙමසක් අවසානයේ පාර්ලිමේන්තු බහුතර ඡන්දයෙන් විධායක ජනාධිපති ධුරයේද අසුන් ගත්තේය. වික්‍රමසිංහ අගමැති ලෙස දිවුරුම් දුන් වහා ඔහුට සුභ පතා ජා.මූ.අරමුදල සමගින් කෙරෙන ගනුදෙනු වෙනුවෙන්ද පූර්ණ සහායක් ලබාදෙන බව ඇමෙරිකානු තානාපතිනිය ඇයගේ නිල ''ට්විට'' ගිණුමෙන් ප්‍රකාශ කළාය. පසුදින අළුයම, කොළඹ විදෙස් තානාපතිවරුන් අතරින් ඇමෙරිකානු හිතවතුන් කිහිප දෙනද අගමැති වික්‍රමසිංහ හමුවී සුභ පැතූහ. ඔහු අගමැති වූ විගස #GotaGoHome විරෝධයට අනුග්‍රහය දැක්වූ, සහාය දුන් හා සහභාගි වූ කොළඹ මැදපංතිකයින් වහා ගාලුමුවදොර පිටියෙන් ඉවත් වූහ. ලෝක බලවතුන් කිහිප දෙන අගමැති වික්‍රමසිංහ වටා සිට ගැනීමෙන් මෙතෙක් ශ්‍රී ලංකාවට නොතිබුණු ජාත්‍යන්තර සහායක් දැන් ලැබෙන්නේ යැයි සුභවාදී චිත්‍රයක් සමාජ මානසිකයෙහි නිර්මාණය කෙරිණ.

එවැනි වටපිටාවක අවදානම් සහගත බරපතල අවිනිශ්චිතයකට තල්ලුවෙමින් සිටි පාර්ලිමේන්තුවේ රාජපක්ෂ බහුතරයට වහා රැකවරණයක් ලබා ගත හැක්කේ වික්‍රමසිංහගේ නායකත්වයෙන් වන ආණ්ඩුවකින් යැයි සරළ තේරුම් ගැනීම විය. එනිසා ඔහුව ජනාධිපති ලෙස පත් කිරීමේ බහුතරය රාජපක්ෂවාදීන් විසින් ලබා දුන්නකි. මාස කිහිපයක් යන විට වික්‍රමසිංහ ජනාධිපති ඔහුගේ තනි විධායක බලයට පාර්ලිමේන්තුවේ බහුතරයක් අවනත කරවා ගෙන අවසන් විය. එය එතරම් අසීරු කාර්යක් නොවුනකි. 69 ලක්ෂයක් ඡන්ද සමගින් හැදූ රාජපක්ෂවාදී ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් වශයෙන් තවදුරටත් ආණ්ඩු බලයේ රැඳී සිටීමේ ලොල් බවක් ඔවුන්ට නිතැතින්ම තිබූවකි. ඔවුහු බහුතරය වික්‍රමසිංහ ජනාධිපතිගේ ආධිපත්‍යයට එනිසා අවනත වූහ. ඒ බහුතරයට පවා දැන් ඇත්තේ ඊළග පාර්ලිමේන්තු මැතිවරණයේදී ඔවුන් සිට ගත යුත්තේ කොතැනද යන හෙයියම්මාරුව ය.

## ජා.මූ. අරමුදල සමගින් රට ගොඩ යාවිද?


ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග කොන්දේසිගතවීමෙහි වික්‍රමසිංහ දේශපාලනයේ පසු බිම එවැනිය. ආර්ථික හෙයියම්මාරුවෙන් ගොඩ එන්නට විපක්ෂයේ ආර්ථික හා මූල්‍ය කලමනාකරණ විශේෂඥයින්ගේ අවවාද උපදෙස් වූයේද ජාත්‍යන්තර මූල්‍ය

අරමුදලේ සහාය ලබා ගත යුතුය යන්න ය. පසුගිය මාර්තු මාසයේදී ජනාධිපති වික්‍රමසිංහගේ ආණ්ඩුව ජා.මූ.අරමුදල සමග ඔවුන්ගේ සියලු කොන්දේසි සඳහා අත්සන් තැබුවේය. ඒ වනවිට අපේ රටේ විදේශ ණය ප්‍රමාණය පමණක් ඇමෙරිකානු ඩොලර බිලියන 53 ක් යැයි ගණන් බලා තිබිණ.

''පැරිස් සංගමය'' සහ ඇමෙරිකාව, ජපානය ඇතුළු අනෙක් බලවතුන් ජා.මූ.අරමුදලේ විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කොන්දේසිය සපුරාලීම සඳහා වික්‍රමසිංහ ආණ්ඩුවට අවශ්‍ය වටපිටාව වහා සකස්කරන්නට වූහ. එවගේම දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියද ආණ්ඩුව ආරම්භ කළේය. ඒ වෙනුවෙන් පාර්ලිමේන්තු පනතක්ද සම්මත කෙරිණ.

මේ ආකාරයෙන් වික්‍රමසිංහ ජනාධිපති යටතේ මේ රටේ ආර්ථිකය ගොඩ දා ගත හැකිද? ඔහුගේ නව ලිබරල්වාදී ලෝක දෘශ්ඨිය අනුව ජා.මූ.අරමුදලේ සහායද ඇතිව මේ ආර්ථිකය ගොඩ දමන්නට සැළසුම් කෙරෙන අයුරු, බහුතර ජනයාට තම දෛනික ජීවිතයේ අවශ්‍යතා විසඳා ගැනීමේ පහසුවක් ලැබෙනු ඇති ද?

ජනාධිපති වික්‍රමසිංහට නොව, ජනාධිපති සී ජිංපිංට හෝ ගෝලීය ආර්ථිකය හා පෙළ ගැසුණු මේ දූෂිත, මහ නගර වලට සීමාවන විවෘත වෙළඳපල ආර්ථිකයෙන් සැමට යහපත් සාධාරණ සමාජ හදන්නට නොහැක. චීනයේ යෝධ ආර්ථිකය ගැන කතා කරන විට, රටේ ජනතාවගේ ආර්ථික වර්ධනය ගැන කතා කරන්නේ නැත. චීන කො.පයේ ඉහළ පෙල නායකයින්ගේ ආර්ථික වර්ධනය ගැන කතා කරන්නේ නැත. අති බහුතර ජනතාවක් අන්ත දිළිඳු තත්ත්වයේ තබා ගනිමින් ආර්ථිකය සූරා කන කොමියුනිස්ට් පක්ෂ




ඉහළ නිලධරයේ සුව පහසු පැවැත්ම ගැන කතා කරන්නේ නැත. චීන ආර්ථිකය යැයි කතා කරන්නේ ප්‍රාන්ත 23 කින් නැගෙනහිර වෙරළාසන්න ප්‍රාන්ත 07 ක වත්කම් හා ආදායම් පිළිබඳව පමණය.

ෂැංහායි නගරයේ සිට වාර්ෂිකව ගෝලීය වත්කම් හා ආදායම් සම්බන්ධ පුද්ගල සමීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කරන ''හුරුන් පර්යේෂණ ආයතනය'' මේ වසරේ (2023) මාර්තුවේදී නිකුත් කළ වාර්තාවට අනුව ඒවායේ හැඳුණු ධනකුවේරයන් සංඛ්‍යාව 969 ක් යැයි සඳහන් කරන්නේය. හොංකොං සහ මැකෝව් දූපත් ඇතුළත්ව මේ වසරේද චීන ඩොලර් බිලියනාධිපතීන් සංඛ්‍යාව

ඇමෙරිකාවට වඩා වැඩිය. ඇමෙරිකාවේ බිලියනාධිපතීන් සංඛ්‍යාව 691 කි.

කොවිඩ් වසංගතය ප්‍රකාශයට පත් කෙරෙන්නට පෙර 2019 වසරේ මහජන චීනයේ ජාතික ඒක පුද්ගල ආදායම වූයේ යුආන් 70,892 කි. ඒ වසරේ බෙයිජිං ප්‍රාන්තයෙහි ඒක පුද්ගල ආදායම එමෙන් දෙගුණයකටත් වැඩි වූ යුආන් 1,64,220 කි. ෂැංහායිහි ඒක පුද්ගල ආදායම එළෙසින්ම දෙගුණයකට වැඩි 1,57,279 ක් විය. නැගෙනහිර වෙරළබඩ අනෙක් ප්‍රාන්ත 04 වන ජියංසූ, ගුඅංඩොං, ටියන්ජිං, ෆුජියාන් සහ සෙජියාං සතු ඒක පුද්ගල ආදායමද ජාතික ඒක පුද්ගල ආදායමට වඩා බෙහෙවින් වැඩිය. එහෙත් මධ්‍යම චීනයේ සහ විශේෂයෙන් බටහිර චීනයේ ප්‍රාන්ත සියල්ල අන්ත දුප්පත්ය. ගන්සු, හෙයිලිංජියෙං වැනි ප්‍රාන්තවල ඒක පුද්ගල ආදායම යුආන් 36,000 ටත් අඩුය. ඇතැම්වා 40,000 ත් 45,000 ත් අතරය. එවගේම ඒවායේ යටිතල පහසුකම් හා සේවා සැපයීම්ද අතිශය දුර්වලය.

චීනයේ ධනවත් ප්‍රාන්ත 07 හි ආර්ථික වර්ධනය වෙනුවෙන් ඔවුන් සමස්ථ චීනයේම පරිසරය විනාශකර ඇතැයි, වාර්තා වන්නේය. චීනයේ මහ නගර 300 ක වායු දූෂණ ඉතා බරපතලය. ගංගා වලින් සියයට 40 ක් අන්ත දූෂිතය. ඉන් සියයට 20 ක ජලය විස සහිතය. කොවිඩ් වසංගතයෙන් පසු ඔවුන්ගේ ආර්ථික පුනර්ජීවනය වෙනුවෙන් සැළසුම්කර ඇති නව විදුලිය ජනන මධ්‍යස්ථාන 22 ක් විසින් ගිගාවොට් 250 ක් විදුලිය ජනනය කිරීමේදී කාබන් ඩයොක්සයිඩ් ($CO_2$) වායුව අමතර ටොන් මිලියන 175 ක් මුදා හරිනු ඇතැයි ගණන් බලා ඇත. (විස්තර සඳහා ගොඩවන්න - https://www.futuredirections.org.au/publication/china-continues-to-confront-steep-environmental-challenges/)

චීනයේ සුළු ආගමිකයින් හා වාර්ගිකයින් මර්දනයද අතිශය බියකරුය. ආසියාවේ ''හරි මැද'' යැයි හඳුන්වනු ලබන ඔවුන්ගේ බස්නාහිර මායිම් කෙරෙන සින්ජියෑං ප්‍රාන්තයේ බහුතරය මුස්ලිම් උයිගු ජාතිකයින් වූවත් චීනයේ ඔවුන් ඉතාම කුඩා සුළුතරයකි. සින්ජියෑං ප්‍රාන්තය මායිම්වන රටවල් 08 කින් 05 ක් මුස්ලිම් රාජ්‍යයන් ය. එබැවින් චීන කොමියුනිස්ට් මධ්‍යම රජය බහුතර චීන වාර්ගිකයින්වන ''හන් වාර්ගික'' චීන ජනාවාස සින්ජියෑං ප්‍රාන්තයේ ආරම්භ කරන්නට වූයෙන් උයිගු වාර්ගිකයෝ ඊට විරුද්ධ වූහ. ඒ විරෝධතා මර්දනය කෙරෙන්නේ වාර්ගික මර්දනයක් විලසින්ය. 2020 වනවිට මුස්ලිම් උයිගු වාර්ගිකයින් දස ලක්ෂයකට වැඩි පිරිසක් චීන රජය විසින් ''පූර්ව අධ්‍යාපන මධ්‍යස්ථාන'' යැයි

නම්කර ඇති ''වද කඳවුරු'' 380 ක රඳවා ඇතැයි වාර්තා විය. මුස්ලිම් උයිගු කාන්තාවන් දූෂණය කර වඳ සැත්කම් කරනු ලබන්නේ යැයිද බරපතල චෝදනා ඇත.

ඉන්දියාව සම්බන්ධයෙන්ද එවැනිම තොරතුරු ඇත. මහ ඇමති වශයෙන් නරේන්ද්‍ර මෝඩිද හවුල් විනැයි චෝදනා ඇති 1985 ගුජරාත්හි මුස්ලිම් ඝාතන වලින් පසු 2021 අවසන් වන විට, අගමැති මෝඩිගේ දේශපාලන හයිය මත වර්ධනය කෙරෙන හින්දුත්වා මැර කල්ලි විසින් අමානුෂික ලෙස ඝාතනය කර ඇති මුස්ලිම් පුද්ගලයින් සංඛ්‍යාව 7,167 ක් යැයි සඳහන්වේ.

ඉන්දියාවේ දුප්පතුන් ගණන් බැලීමේදී 2022 වසර අවසන් වනවිට ජාතික බහුමාන දිළිඳුකම සියයට 14.96 ක් විය. සියයට 65 ක් ඉන්දියානු ග්‍රාමීය ජනතාවගෙන් සියයට 19.28 ක් දිළින්දන් වූහ. ඉන්දියාවේ රැකියාලාභීන්ගෙන් විධිමත් ආර්ථිකයෙහි ඇත්තේ සියයට 10 කි. රැකියාලාභීන් යැයි ගණන් හැදෙන ඉතිරි සියයට 90 අඩු ආදායම් සහිත අස්ථාවර අවිධිමත් ක්ෂේත්‍රයේ රැඳී සිටින වුන්ය. ''2019 - 2021 ජාතික පවුල් සෞඛ්‍ය සමීක්ෂණයට'' අනුව ඉන්දියාවේ ළමුන් මිලියන 16.2 ක් පාසල් නොයන්නේ යැයි ඇස්තමේන්තුකර ඇත.

ධනවත් බලවත් යැයි කියන හැම රටකම කතා වන්නේ බහුතර දිළින්දන් ගැන නොවේ. ඒ හැම රටකම සුළුතර ''ඇත්තන්ගේ දේශය'' සහ බහුතර ''නැත්තන්ගේ දේශය'' යැයි දෙකක් ඇත. ඒ රටවල් ගැන කතා වන්නේ ඔවුන්ගේ සුළුතර ''ඇත්තන්ගේ දේශය'' රටටම ආදේශ කර ගනිමින් ය.

## විශ්ලේෂණ නැති ජා.මු.අරමුදලේ කොන්දේසි

ජා.මූ.අරමුදල සමග ඔවුන්ගේ කොන්දේසි වලට අනුගතව ගොඩ දමන්නේ යැයි පැවසෙන ආර්ථිකයෙහි ''අතරමංවූ'' ලාංකීය දේශයෙහි ලක්ෂ 80 ක් 90 ක් පමණ වන පුරවැසියන් ඉතිරි වනු ඇත්තේ තව දුරටත් අතරමං වූවන් ලෙසින්ම පමණි. එසේ කීමට හේතු කවරේදැයිද කිව යුතුය. පසුගිය මාර්තු මස ශ්‍රී ලංකාණ්ඩුව සහ ජා.මූ.අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අත්සන් කෙරුණු ද්විපාර්ශවීය ගිවිසුමට පාදක කරගනු ලැබූයේ ඉකුත් වසරේ (2022) අගෝස්තු මස අවසානයේදී ජා.මූ.අරමුදලේ මාණ්ඩලික සේවා නියෝජිතයින් සමග ශ්‍රී ලංකාණ්ඩුව, එනම් ජනාධිපතිගේ ප්‍රධානත්වයෙන් ඔහුගේ මුදල් අමාත්‍යාංශයෙහි ඉතා ප්‍රවේසමෙන්

තෝරා ගත් ඉහළ නිලධාරීන් දෙතුන් දෙනා සමග මහ බැංකු අධිපති සහ ඔහුගේ සහායකයින් කිහිප දෙනා එකඟත්වයට පැමිණි ආර්ථික පියවර සහ ඊට සම්බන්ධ රාජ්‍ය ප්‍රතිව්‍යුහගත කිරීමේ සැළසුම ය.

ඒ සම්බන්ධයෙන් ජා.මූ.අරමුදල විසින් 2022 සැප්තැම්බර මස 01 වන දින නිකුත් කළ නිල නිවේදනයට අනුව, ඔවුන්ගේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශ්‍රී ලංකාණ්ඩුව සමග ඔවුන්ගේ විස්තීරණ ණය පහසුකම් අරමුදලින් ඩොලර බිලියන 03 ක සහන මුදලක් මාස 48 ක් සඳහා ලබා දීම සඳහා ගිවිසුම් අත්සන් කිරීමට පෙරාතුව ශ්‍රී ලංකාව විසින් ඉටු කළ යුතු වගකීම් නම් කෙරුණි. තමන්ගේ නිල ආයතනගත ණය දුන්නවුන්ගෙන් මූල්‍ය සහාය ලබා ගැනීමේ ප්‍රතිඥාවක්ද පෞද්ගලික ණය සැපයුම්කරුවන් සමග ගනුදෙනු කිරීමේ හොඳ හිත එකඟතාවක්ද ඇතුළු ශ්‍රී ලංකාණ්ඩුව විසින් සැපිරිය යුතු තවත් කාරණා ගණනාවක් ඒ සමග තිබිණ. මේවා සම්බන්ධ සවිස්තරාත්මක සඳහන් කිරීම් එකී නිවේදනයේ නැතත් කරුණු වශයෙන් පමණක් නිශ්චිත කෙරුණු සඳහන් කිරීම් 07 ක් එහි තිබිණ.
01. ප්‍රධාන බදු ප්‍රතිසංස්කරණ 02. විදුලිය සහ ඉන්ධන වෙනුවෙන් වැය කිරීම් පියවා ගත හැකි අයුරු මිල සකස් කිරීම් 03. සමාජ වියදම් ඉහළ දමමින් සමාජ රක්ෂණ ජාල දියුණු කිරීම 04. ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්වාධීනත්වය ශක්තිමත් කරමින් දත්තානුසාර මූල්‍ය ප්‍රතිපත්ති ඇසුරෙන් මිල ස්ථාවර කිරීම 05. වෙළඳපල නැවත තහවුරු කිරීම සහ නම්‍යශීලි විනිමය අනුපාත සමගින් විදේශ විනිමය සංචිත යළි ගොඩනගා ගැනීම 06. මූල්‍ය ස්ථාවරත්වය රැක ගැනීම සහ 07. මූල්‍ය විනිවිද භාවය හා මහජන මුදල් කලමනාකාරිත්වය දියුණු කිරීමත් වඩා ශක්තිමත් දූෂණ විරෝධී නීති රාමුවක් හඳුන්වා දීමත් මගින් දූෂණ සඳහා ඇති අවකාශ අවම කිරීමත් ඒ මූලික කාරණා 07 වන්නේය.

මෙය ලියන්නට වාඩි වුනු මේ සැප්තැම්බරයේ (2023) පළමු සතියෙන් අවුරුද්දකට පෙර සිට වික්‍රමසිංහ ආණ්ඩුව ක්‍රියාත්මක කිරීමට බැඳී සිටි ඉහත කාරණා බැලූ බැල්මටම බොහෝ සෙයින් එකිනෙකට පරස්පර වාගේම සාමාන්‍ය ජනයාට කිසිසේත් අදාල නොවන බැව් දැකිය හැක. මුලින්ම කිව යුත්තේ ඒ පියවර සියල්ල ගත්තද ජා.මූ.අරමුදල විසින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් තැබූ තක්සේරුව වූයේ 2023 වසරේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය තව දුරටත් සියයට 03 කින් හැකිලෙනු ඇත යන්නය. ජා.මූ.අරමුදලේ ආසියානු පැසිපික් කලාපීය අධ්‍යක්ෂ ක්‍රිෂ්ණ ශ්‍රීනිවාසන් ඉන්දීය ''සී නිවුස්'' රූපවාහිනි නාලිකාව සමග 2023 මැයි 16 වන දින කියා තිබුණේ

2023 දී හැකිලෙන ශ්‍රී ලාංකීය ආර්ථිකය 2024 දී යම් හුස්මක් ලබන්නේ සියයට 01.4 ක වර්ධනයකින් පමණක් යැයි කියාය.


ලෝක බැංකුව මේ වසර (2023) ආරම්භයේ නිකුත් කළ ''ගෝලීය ආර්ථික ප්‍රක්ශේපන'' වාර්තාවට අනුවද ශ්‍රී ලංකාවේ ආර්ථිකය මේ 2023 වසර සියයට 04.2 ක සෘණ අව ගමන් යන අතර ලබන 2024 දී අපේක්ෂා කළ හැක්කේ සියයට 01 ක වර්ධනයක් පමණි. ජා.මූ.අරමුදලේ සහ ලෝක බැංකුවේ ඒ ප්‍රකාශ අනුව 2023 සහ 2024 වසර දෙකෙහිද මේ රටේ බහුතර ජනයාට ජා.මූ.අරමුදල සමග වික්‍රමසිංහ ආණ්ඩුව කරන්නාවූ කිසිදු ගනුදෙනුවකින් සහන ලැබෙන්නේ නැත.

අනතුරුව ජා.මූ.අරමුදල සමග ඇති කරගත් මූලික එකඟතා මත එහි ඇති පළමු ප්‍රධාන කාරණාව වන බදු ප්‍රතිසංස්කරණයෙහි, පුද්ගල ආදායම් සඳහා බදු අය කිරීමේ ගිණුම් සංඛ්‍යාව වැඩි කෙරෙන ලෙස බදු අය කිරීමේ අවමය මාසිකව රුපියල් දෙලක්ෂය යැයි වික්‍රමසිංහ ආණ්ඩුව තීන්දු කළ අතර, දැනට ක්‍රියාත්මක බදු ප්‍රතිසංස්කරණ මගින් නැවතත් වක්‍ර බදු සියයට 80 ට වැඩි ප්‍රතිශතයකින් පවත්වා ගෙන යති. වක්‍ර බදු ගෙවීම් සම්බන්ධ කතාව වන්නේ කහට කෝප්පයේ සිට මේ රටේ හිඟන්නාත් බදු ගෙවන බවය. හැම ආණ්ඩුවක්ම පහසුවෙන් එකතු කර ගැනීමට හැකි නිත්‍ය ආදායමක් ලෙස වක්‍ර බදු අය කිරීම ඉතා ඉහළ ප්‍රතිශතයක් ලෙස තබා ගන්නකි. කොවිඩ් වසංගතයට පෙර ශ්‍රී ලංකාවේ අවම ආදායම් ලබන පවුල් සියයට 10 ඔවුන්ගේ ආහාර පරිභෝජනයේදී සියයට 16 ක් වැය කෙරුවේ වක්‍ර බදු වෙනුවෙනි. සුඛෝපභෝගී ආහාර වේලක් බුක්ති විඳින මේ රටේ පොහොසත්ම සියයට 10 එනමුත් ඔවුන්ගේ ආහාර පරිභෝජනයේදී ගෙවූ වක්‍ර බදු ප්‍රතිශතය වූයේ සියයට 01.8 ක් පමණි.

ඊට අමතරව ''වැට් බද්ද'' ලෙස අය කරන නිෂ්පාදන හා සේවා සම්බන්ධයෙන් අලුතින් වටිනාකම් එකතු කෙරෙන විට අය කෙරෙන සියයට 15 ක බද්ද එකම භාණ්ඩයකට එක් වරක් පමණක් එකතුවන බද්දක් නොවේ. එය වටයෙන් වටය භාණ්ඩයකට හෝ සේවාවකට එකතු විය හැකි බද්දකි. එබැවින් විශේෂයෙන් ආනයනය කරනු ලබන පාරිභෝගික භාණ්ඩ සඳහා පිටකොටුවේ ප්‍රධාන ආනයන ඒජන්තගේ සිට ප්‍රාදේශීය සිල්ලර වෙළෙන්දා දක්වා සීනි මිටියක් අලෙවි කෙරෙන හැම තැනකදීම සියයට 15 වැට් බද්ද අය වන්නේය. එනිසා සාමාන්‍ය පාරිභෝගිකයා මිලට ගන්නා සේවා හා භාණ්ඩ සඳහා ඔහු හෝ ඇය ගෙවන්නේ ආණ්ඩුව පැනවූ සියයට 15 ක වැට් බද්ද මෙන් දෙගුණ තෙගුණ වූ

ඉහළ බද්දක් මත වැඩි වූ පාරිභෝගික මිලකි. එහි වඩාත්ම බරපතල කාරණාව නම්, වැට් බදු ලියාපදිංචිය ඇති වාණිජ ආයතන ඔවුන් පාරිභෝගිකයාගෙන් අය කර ගන්නා වැට් බදු නියමිත ලෙස ආණ්ඩුවට නොගෙවීම සහ ඒ වැට් බදු ආදායම රජයට එකතු කර ගැනීමට අවශ්‍ය නිසි පියවර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නොගැනීමය.

ජා.මූ.අරමුදල පෞද්ගලික ව්‍යාපාරික ක්ෂේත්‍රයට අත පොවන්නේ නැත. එබැවින් බදු අය කර ගැනීමේ යාන්ත්‍රණය කාර්යක්ෂම කර ගැනීමේ අවධානයක් ඔවුන්ගේ යෝජනාවල ඇත්තේ නැත. ඒවායේ ඇත්තේ ආදායම් වැඩිකර ගැනීමේ කතාවක් පමණි.




ආදායම් වැඩිකර ගැනීමේ අවශ්‍යතාව අපිදු දනිමු. පරස්පරය ඇත්තේ බදු ආදායම් වැඩිකර ගැනීමේ යෝජනා සම්බන්ධයෙනි. වැඩි වැඩියෙන් බදු අය කිරීම් වලට වඩා බදු අය කර ගැනීමේ යාන්ත්‍රණය සුද්ද පවිත්‍ර කර ගැනීමෙන් එය කළ හැකි යැයි මම කියමි. අති දූෂිත රාජ්‍ය ආයතන අතුරින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව පෙරමුණේ සිටින්නෙකි. ව්‍යාපාරිකයින්ගෙන් ඔවුන් අත හැර දමා ඇති බදු ආදායම රුපියල් කෝටි ගණනක් යැයි කෝප් කමිටුවකදී පිළිගනු ලැබිණ. එවගේම බදු ආදායම් එකතු කෙරෙන රේගුව හා සුරා බදු දෙපාර්තමේන්තුවද සුද්ද පවිත්‍රකර කාර්යක්ෂම කිරීමෙන් වාර්ෂිකව තව රුපියල් කෝටි ගණනක් අලුතින් එකුකර ගත හැකිය. දේශීය ආදායම් වැඩිකර ගැනීමේ එවැනි නැඹුරුවකින් බොහෝ විට සාමාන්‍ය ජනතාවට වාසි වන වක්‍ර බදු ප්‍රමාණය අඩු කිරීමටද හැකි වනු ඇත.

ජා.මූ.අරමුදලේ යෝජනාවන්හි පවත්නා බදු අය කිරීම්, රාජ්‍ය වියදම් හා ඉදිරියේදී අවශ්‍යවන රාජ්‍ය ආදායම් සහ එලෙසින් අවශ්‍ය ආදායම් එකතුකර ගැනීමේ යෝජිත පියවර සම්බන්ධ කිසිදු විශ්ලේෂණයක් නැත. වැදගත් තියුණු විශ්ලේෂණයකින් තොරව කෙරෙන යෝජනා හුදු ජනප්‍රිය කතා අනුව කෙරෙන යෝජනා පමණි. එවැනි යෝජනා මගින් මේ රට ගොඩ දැමිය නොහැකිය.

ජා.මූ.අරමුදලේ ප්‍රධාන කරුණු 07 අතුරින් දෙවැන්න වන්නේ ''විදුලිය සහ ඉන්ධන වෙනුවෙන් වැය කිරීම් පියවා ගත හැකි

අයුරු මිල සකස් කිරීම්'' සම්බන්ධ කාරණාවය. එහිම ''රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංවිධානය කිරීමද'' සඳහන් වන්නේය. මේ ආණ්ඩුව ඒ අනුව වහා ක්‍රියාත්මක කිරීමට සූදානම්වන ''රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංවිධානය කිරීම'' යටතේ ආයතන 52 ක් අලෙවි කරන්නට සැළසුම් කර ඇත. එය මේ වික්‍රමසිංහ ජනාධිපති යටතේ වැඩි කතා බහක් නොකරන නමුත් වේගයෙන් ඉදිරියට ගෙන යන ඔවුන්ගේ ප්‍රධානම කාර්යයකි. එ.ජා.පක්ෂයේ ජයවර්ධන හා ප්‍රේමදාස ජනාධිපතිවරුන්ට කළ නොහැකි වූ මේ ''පෞද්ගලීකරණය'', දැන් කෙරෙන්නේ ජාවාරම්කාර විවෘත වෙළඳපල ආර්ථිකය නිසාවෙන් නිර්මාණය වූ යෝධ සමාජ ආර්ථික බිඳ වැටීම හේතු කර ගනිමින් ය. ආණ්ඩුව මුහුණ දෙන දේශීය ආදායම් හිඟය හමුවේ මහජන මුදල් රාජ්‍ය ව්‍යාපාරවල පාඩු පියවීමට වැය කළ නොහැකිය යන්න දැන් පොදු සමාජ පිළිගැනීමක් ලබන්නකි. ඒ සමග නාගරික මැදපංතිකයින්ගේ අනුමැතිය සහ සමාජයේ ලොකු විරෝධයකින් තොරව ''රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංවිධානය කිරීම'' යන ඉතා අහිංසක අයුරින් කියැවෙන කතාව, වික්‍රමසිංහ ආණ්ඩුවට පෞද්ගලීකරණය සඳහා ඉඩ ලබා දී ඇත.

වික්‍රමසිංහ ආණ්ඩුව රාජ්‍ය ව්‍යාපාර විකුණා දැමීමට උනන්දු වන්නේ ඒවායේ සිදුවන ඉහ වහා ගිය දූෂණ වංචා වැනි කිසිත් පෞද්ගලික ව්‍යාපාරවල සිදු නොවන්නේ යැයි කියන්නාක් මෙනි. අපගේ පමණක් නොව හැම රටකම, සියලු දූෂණ සිදුවන්නේ ජාවාරම්කාර ව්‍යාපාරිකියන්ගේ ලාභ රේට්ටු වැඩි කරදීමේ ගනුදෙනු වශයෙනි. එනිසා මුළු වැය පියවා ගත හැකි අයුරු මිල සකස් කිරීම් යනුවෙන් ඔවුන් කතා කරන්නේ අදාල රාජ්‍ය ආයතනවල වාර්ෂික වියදමෙහි ඇතුළත් ඉහ වහා යන නාස්තිය, අනවශ්‍ය වියදම් හා යෝධ දූෂණ වංචා ගැන නොවේ. ඒ සියල්ල එකතුවූ පසු ගොඩ ගැසෙන සමස්ථ වියදම පියවා ගැනීමට මිල වැඩි කිරීම හා ජනතාවගෙන් වැඩියෙන් ගාස්තු අය කිරීම ගැනය. මේ සම්බන්ධයෙන්ද කිසිදු ක්ෂේත්‍ර අධ්‍යනයක් හෝ රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධ ආර්ථික විශ්ලේෂණයක් ඇත්තේ නැත. නැවතත් ඇත්තේ විවෘත වෙළඳපල ආර්ථිකය කරපින්නා ගත්තවුන්ගේ ජනප්‍රිය තර්කයකට අනුව ''ප්‍රතිසංවිධානය'' යන පදය යටතේ පෞද්ගලීකරණයද යෝජනා කිරීම පමණි.

අප කියන ආකාරයේ විමර්ශනාත්මක මගක යාමට ජා.මූ.අරමුදල සහ වික්‍රමසිංහ ආණ්ඩුව සූදානම් නොවන්නේ එසේ වුවහොත් රාජ්‍ය ව්‍යාපාර පෞද්ගලික ව්‍යාපාරිකයින්ට අලෙවි කිරීමේ ඔවුන්ගේ ව්‍යාපෘතියට එය බාධාවක් විය හැකි බැවින්ය. ඒ

සම්බන්ධව අවසන් වශයෙන් මෙය ලියා තැබිය යුතුය. පෞද්ගලික ව්‍යාපාරිකයින් මේ රටේ සියලු දූෂණ වංචා වලට හවුල්ය. ඔවුන් නොමැතිව කිසිදු දූෂණයක් වංචාවක් සිදුවිය නොහැකි බැව්

කරුණාවෙන් සළකන්න. දෙවැන්න, පෞද්ගලික ව්‍යාපාර සතු විශේෂ කලමනාකරණ හැකියාවක් නැත. ඔවුන්ට එවැනි විශේෂ හැකියාවන් තිබේ නම්, 2010 සිට 2016 දක්වා අවුරුදු 07 ක් ඇතුළත ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සියලු බදු වාසි, සියලු වරප්‍රසාද ලබා ගත් පෞද්ගලික ව්‍යාපාර 721 ක් වසා දමා හිමිකරුවන් අතුරුදහන් වන්නේ නැත. ඒ සංඛ්‍යා අනුව එම වසර 07 ඇතුළත හැම වසරකම වරප්‍රසාද ලත් පෞද්ගලික ව්‍යාපාර 103 ක් වසා දමා ඇත. පෞද්ගලික ව්‍යාපාර සතු හැකියාව ගැන වෙනත් විස්තර අවශ්‍ය නැත. මහජන බදු මුදල් වැය කරමින් හැම ආණ්ඩුවක්ම ලබා දුන් සියලු සහන සහ වරප්‍රසාද බුක්ති විඳ පාඩු ලැබුවේ යැයි වසා දැමූ මෙම ව්‍යාපාර 721 ක ගැන වැඩි විස්තර - https://www.sundaytimes.lk/170903/news/721-boi-companies-closed-down-from-2010-to-2016-257726.html

ජා.මූ. අරමුදල දූෂණ හා වංචා ගැන කතා කරන්නේද යාන්ත්‍රිකව විසඳිය හැකි කාරණා වශයෙනි. දියුණු ශක්තිමත් නීති රාමුවක් හැදීමෙන් දූෂණ වංචා අවම කිරීමට ය. ඒ සඳහා ඔවුන්ගේ විශේෂඥතාව ලබා දීමටද ගිවිසුම්ගතව ඇත. දූෂණය එසේ නතර කළ නොහැක්කකි. ජාවාරම්කාර ආර්ථිකයක නීති ක්‍රියාත්මක වන්නේද ජාවාරම්කාර ආර්ථිකයේ වාසියට බැව් අවුරුදු 40 ක අපේ අත්දැකීම් කියන්නකි.

දැන් අප ඉන්නේ ඒ කිසිත් ආපසු හැරවීමට නොහැකි විනාසයක ය. එහෙත් ජාවාරම්කාර විවෘත වෙළඳපල වෙනුවෙන් සකසා ගෙන ඇති දේශපාලන නායකත්වය වෙනත් විසඳුම් සඳහා ඉඩ තබන්නේද නැත. මේ විවෘත වෙළඳපල ආර්ථිකයෙන් බිඳ වැටුණු ජීවිත සඳහා කිසිදු අලුත් හුස්මක් ලබා දීමටද එනමුත් නොහැකිය. මේ මොහොතේ ජනාධිපති වික්‍රමසිංහ ඉන්නේ තුන්මං හන්දියක අතරමං වූවකු ලෙසින්ය. ජා.මූ.අරමුදල සමග පැමිණි පාරේම නොහැරී යන්නට නම්, හැම ක්ෂේත්‍රයකින්ම මතුවන නොනවතින විරෝධතා වලට ඔහු මුහුණ දිය යුතුය. එවැනි විරෝධතා මතු වන්නට ජා.මූ.අරමුදල සමගින් නොහැරී යන්නේ නම්, පාර්ලිමේන්තුවේ පොහොට්ටු මන්ත්‍රීවරුන්ගේ සහාය නොලැබෙනු ඇත. ඒවායින් බේරී යන්නට නම්, බහුතර දුප්පත් ජනතාවට, රජයේ සේවකයින්ට, ඔවුන්ගේ ආර්ථික ඉල්ලීම් වෙනුවෙන් යම් සැළකිල්ලක් පෙන්විය හැකි වෙනත් පාරකට හැරීමට සිදුවන්නේය.

එහෙත් එයට විරුද්ධ වන්නේ ජා.මූ.අරමුදල පමණක්ම නොවේ. ඔහුගේ ජාවාරම්කාර හිතවතුන්ද එවැනි පාරක යාමට එකඟ නැත. අනෙක් තුන්වන පාරට ඔහුට කිසිසේත් මාරු විය නොහැක. එය විවෘත වෙළඳපල ආර්ථිකය අභියෝග කරන්නාවූ වෙනත්ම පාරකි. එනිසා ජනාධිපති වික්‍රමසිංහට දැන් සිදුව ඇත්තේ ජා.මූ.අරමුදලේ කොන්දේසි සමගින් ඉදිරියට යෑමටත් ඒ සමගින් තව දුරටත් බිඳ වැටෙන ජීවිත ලක්ෂ ගණනක විරෝධය සමනය කර ගැනීමට රාජ්‍ය මර්දනය විවෘතව සමාජය හමුවේ මුදා හරින්නටය.

පසුගිය වසරේ මැයි මාසයෙහි ඔහු අගමැති ලෙස දිවුරුම් දුන් විගස නිතර ජනතාව අමතා ආර්ථිකයෙහි බිඳ වැටීම ගැන බරපතල අඳුරු චිත්‍රයක් ඇඳීමට හේතු වූයේද මෙවැනි තත්ත්වයක් ඇතිවිය හැකි යැයි ඔහු දැන සිටි හෙයිනි. ඒ අතරම ඔහු බටහිර මිත්‍ර රටවල ආධාර ගැන කීවේ මධ්‍යමපංතික බලාපොරොත්තු සඳහා අවස්ථාවක් ලබා දීමටය.

විරෝධතා ගොනුවීමේ ප්‍රචාරක වේදිකා වශයෙන් මේ නූතන ලෝකයේ යොදා ගැනෙන්නේ විද්‍යුත් විකාශන සහ වැඩිමනත් සමාජ මාධ්‍ය ජාල යැයි දැන් කවුරුත් දන්නා කරුණකි. වික්‍රමසිංහ විධායක පුටුවට පැමිණියේම ඒවා පාලනය කිරීමේ නීති හදන්නට ගනු ලැබූ තීන්දු සමගින්ය. ඔහු පැමිණි විගස #GotaGoHome යුගයේ විරෝධතා වෙත පොලීසිය හා ආරක්ෂක සේවා දැක්වූ හිත මිත්‍ර සැළකිලි අහෝසි වූයේ එබැවින්ය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වෙනස් කිරීම, උතුරු-නැගෙනහිර රාජ්‍ය මැදිහත්වීම් සිංහල-බෞද්ධ බලහත්කාරය සමගින් විවෘතව මුදා හැරීම, පාර්ලිමේන්තුව තව දුරටත් හැල්ලු වන්නට ඉඩ හැරීම සමග යම් අරාජික තත්ත්වයක් සඳහා ඉඩ ලබාදීමෙන් ඔහුට මර්දනකාරී රාජ්‍ය පාලනයක් සඳහා නාගරික මැදපංතික සහාය ලැබෙනු ඇතැයි ඔහු ගණන් හදනු දැකිය හැකිය.

නියෝජන ප්‍රජාතන්ත්‍රවාදීයැයි තවමත් සිතා සිටින මේ ''ජනරජය'' තව දුරටත් ජන රජයක් නොවේ. මෙහි ඇණයක් මුරිච්චියක් වෙනස් කිරීමට වැය කරන වෙහෙස මහන්සියෙන් කිසිදු සහනයක් ලැබිය නොහැක. මේ විවෘත වෙළඳපල ආර්ථිකයෙහි සමස්ථ සමාජයත් සමස්ථ රාජ්‍ය යාන්ත්‍රණයත් ප්‍රධාන දේශපාලන පක්ෂ සමග සමස්ථ දේශපාලන දේහයත් මේ තුන්මං හන්දියෙන් ජනාධිපති වික්‍රමසිංහ හැරෙන්නට සූදානම් නොවන විවෘත වෙළඳපල ආර්ථිකය අභියෝග කරන්නාවූ තුන්වන පාරට හරවා ගත යුතුය. මේ සමස්ථය සඳහා වෙනත් විසඳුමක් ඉල්ලා සිටින මොහොතකි.




## දෙවන කොටස

## සංවර්ධනයේ ''සුරතාන්තය'' විඳීම

''ජාතික සංවර්ධනය'' ගැන කතාවට වැදගත් උපුණපූරකයක් ඇත. තවමත් ලංකාවේ ''සංවර්ධනය'' ගැන කොයි ආකාරයෙන් කියූවත් ඒ කිසිවකින් ''සංවර්ධනය'' යැයි කියන්නේ කුමක්දැයි පැහැදිලි කෙරෙන්නේ, අර්ථ දැක්වෙන්නේ නැත. ජාවාරම්කාර විවෘත වෙළඳපල ආර්ථිකයෙහි ''ජාතික සංවර්ධනය'' ගැන කිසිදු අදහසක් නැත. සාකච්ඡා සඳහා සියල්ල ගොනු කෙරෙන්නේ ''ආර්ථික වර්ධනය'' වශයෙනි. ''සංවර්ධනය'' යනු ''ආර්ථික වර්ධනය'' යැයි සමාජ මතයක් තහවුරු කෙරුණු පසු ඒ ගැන කතා වන්නේ දළ ජාතික නිෂ්පාදනය, උද්ධමනය, ඒක පුද්ගල ආදායම, සෘජු විදේශ ආයෝජන, කොටස් වෙළඳපල ප්‍රසාරණය වැනි සාමාන්‍ය ජන ජීවිතයට සෘජු බලපෑමක් නොමැති නාගරික මැදපංතික ජීවිත විෂය කොට ගන්නා නිර්ණායක කිහිපයක් වශයෙනි. අවම වශයෙන් වත්කම් හා ආදායම් බෙදී යාමේ විෂමතා, අත්‍යාවශ්‍ය භාණ්ඩ හා සේවා සමග සරළ ජීවිතයකට අවශ්‍ය අවම ආදායම, ගම හා නගරය අතර සේවා පහසුකම් සතු පරතරය වැනි කිසිවකට අවධානය යොමු වන්නේ නැත. ඇත්ත කතාව නම්, අපේ රටේ ''සංවර්ධනය'' යනු කවුරුවත් පැහැදිලි නොකරන හා පැහැදිලි කිරීම් නොඉල්ලන, මැතිවරණ පොරොන්දුවකට හෝ නිශ්චිතව හා පැහැදිලිව ඇතුළත් නොවන විෂය පථයකි.

එවගේම රටක, සමාජයක ''සංවර්ධනය'' පිළිබඳ පිළිගත් නිශ්චිත අර්ථ දැක්වීමක් තවමත් ජාත්‍යන්තර සංවාද වලද නොමැති බව යම් සෙවිල්ලක් කළ විට අවබෝධ වන්නකි. එහෙත් ''සංවර්ධනය'' පිළිබඳව කෙරෙන විද්වත් කතිකාවන්හි ''ජනතාව, ජන සමාජය හා දේශපාලනය'' ඇතුලු වන්නේ නැත. විද්වත් කතිකා සැකසෙන්නේ

ඒ සියල්ල ඉවත්කර ඉතිරිකර ගන්නා ආර්ථික සාධක සමගින්ය. නව ලිබරල්වාදී ලෝකයේ පර්යේෂණ, අධ්‍යන හා සංවාද න්‍යායිකව සීමා කෙරෙන්නේ ආර්ථික වර්ධනය සමාජයේ පහළ ස්ථර වෙත කාන්දුවීමෙන් ඔවුන්ගේ ජීවිතද දියුණු වන්නේ යැයි කීමටය. සියල්ල ඉලක්කම් වලට සීමාකර ගන්නා එවැනි විද්වත් අභ්‍යාසවල, මනුස්ස ජීවිතයද ලඝු වන්නේ ඉලක්කම් වලට ය. එබැවින් විද්වතුන් ගණන් හදා කතා කරන සංවර්ධනයෙහි සාමාන්‍ය ජනතාවට හිමි සහ අහිමි ජීවිතය ගැන කතාවන් නැත. සංවර්ධනය ගැන කතිකා වල සමාජයේ සේවා සහ පහසුකම් බුක්ති විඳීමේ හැකියාව හා අවස්ථා පිළිබඳ විස්තර කතාවක් ඇතුළත් නැත. වැඩිමනත් ඇත්තේ වෙළඳපල ආර්ථිකයේ නාගරික ප්‍රසාරණය අතර ආදායම් හා වත්කම් බෙදී යාමේ කතා සහ දුප්පත්කම ඉලක්කම් වලට නැගීමේ කතා ය.

රටක ජනතාවගේ අනාගතය සුව පහසු, යහපත්, සදාචාර සම්පන්න අනාගතයක් වන්නට ඒ වෙනුවෙන් නිර්මාණය කෙරෙන ''ජාතික සංවර්ධන සැළසුමක'' අවශ්‍යතාව අනිවාර්ය වන්නකි. ඒ අවශ්‍යතාව මත එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන ලෝකයටම පොදු ''තිරසාර සංවර්ධන ඉලක්ක'' සමූහයක් 2015 දී ප්‍රකාශයට පත් කළේය. එහි පූර්විකාවට අනුව ''සමස්ථ ජනගහනයේත් පුද්ගලයින්ගේත් සුභසිද්ධිය අඛණ්ඩව දියුණු කිරීම වෙනුවෙන් ඉලක්ක කෙරුණු සමාජ ආර්ථික, සංස්කෘතික හා දේශපාලන ක්‍රියාවලියට ඔවුන් ක්‍රියාකාරීව, නිදහස්ව හා අර්ථවත් ආකාරයට දායක වන්නේද යන්න සහ එහි පලය සාධාරණව බෙදා ගැනීමට අනතුරුව හවුල් වන්නේද යන්න සංවර්ධනය වන්නේය''.

මෙහි ඇති අවුල, ''සමස්ථ ජනගහනයේත් පුද්ගලයින්ගේත් සුභසිද්ධිය අඛණ්ඩව දියුණු කිරීම වෙනුවෙන් ඉලක්ක කෙරුණු සමාජ ආර්ථික, සංස්කෘතික හා දේශපාලන ක්‍රියාවලිය'' ජනතාවගේ හවුලකින් තීන්දු නොවීමය. එය ඔවුන්ගේ ''තිරසර සංවර්ධන ඉලක්ක'' මත පදනම් විය යුතු යැයි වන පිළිගැනීමය. අනතුරුව ''එහි පලය සාධාරණව බෙදා ගැනීමට'' ජනතාව හවුල්වීම ''සංවර්ධනය'' ලෙසින් ඉදිරිපත් කරනු ලබන්නකි.

ඉලක්ක තීන්දු කළ යුත්තේ ''සංවර්ධනය'' අර්ථ දක්වා ගැනීමෙන් පසුවය. ජනතාවට අවශ්‍ය සංවර්ධනයේ අන්තර්ගතය, සංයුතිය හා පැති මාන තේරුම් ගැනීමෙන් පසුවය. අපට අවශ්‍ය අනාගත ''සංවර්ධනය'' අපි අර්ථ ගන්වා ගෙන සිටිය යුත්තේ එබැවින්ය. එය මූලික වශයෙන් අපේ රටේ සමාජ ආර්ථික විෂමතා ක්‍රමානුකූලව තුනී කරමින් දුප්පත්කම අහෝසි කරන්නක් විය

යුතුය. වඩාත් වැදගත් වන්නේ දෛනික ජීවිතයේදී සියල්ලන්ට සමාන අවස්ථා සහ පහසුකම් බුක්ති විඳින්නට හැකි වැදගත් අවකාශයක් එහි අරමුණු කෙරෙන නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී නව සමාජයෙහි ප්‍රධානම ලක්ෂණය ලෙස තහවුරු කර තිබීමය. එවැනි සමාජයක පුරවැසියන්ගේ සමාජ ආර්ථික හා ''සංස්කෘතික'' පැවැත්ම පියවරෙන් පියවර දියුණු කෙරෙන සහ ආකල්පමය වශයෙන් වඩා පරාර්ථකාමී, සමාජශීලි පුරවැසියකු නිර්මාණය කෙරෙන ක්‍රියාවලිය අපේ ''සංවර්ධනය'' වන්නේ යැයි මගේ තේරුම් ගැනීමය.

එබැවින් අපට අවශ්‍ය ''සංවර්ධනය'' මෙවැනි යැයි එකඟත්වයකට පැමිණිය යුත්තේ බහුතර ජනතාවය. ඒ සඳහාවන සංවිධානාත්මක මැදිහත්වීමක් ලෙස එය සාකච්ඡාවට ගත යුත්තේ වෘත්තිකයින්ගේ සමාජ, වෘත්තීය සමිති, ගොවි හා ධීවර සංවිධාන, ජන සමාජයේ ස්වාධීන එකතුවීම්, සමිති සමාගම්, විශ්ව විද්‍යාල ඇදුරන් හා උසස් අධ්‍යාපනයෙහි සිසු සිසුවියන් වැනි පිරිස් විසිනි. එවන් පුළුල් සංවාද වලදී හමුවන ඊළඟ කාරණාව විය හැක්කේ එවැනි සංවර්ධනයක් සඳහා මේ මොහොතේ අපගේ මූලික හා ප්‍රධාන අවධානය තිබිය යුත්තේ කවර කාරණා කෙරෙහිද යන්නය. අපගේ ප්‍රමුඛතා කවරේද යන්නය.

## ''හෙට'' යනු ''ඊයේ'' නොවන්නට....

මේ බරපතල සමාජ ආර්ථික බිඳ වැටීමෙන් නැවත නැගිටීම කෙසේ විය යුතුදැයි අප කතා කරන්නේ නැත. මුදල් අමාත්‍යාංශය, මහ බැංකුව වැනි අදාල බලධාරීන් සමග ආණ්ඩුව එය තීන්දුකර හමාර යැයි අපි ඒ ගැන සිතන්නට වෙහෙස නොවෙමු. එනිසා සංවර්ධනය ගැන සාකච්ඡා නාගරික සමාජයේ හෝ අසන්නට නැත. නව සංවර්ධනයක් ගැන කොවිඩ් වසංගතයෙන් බිඳ වැටුණු ගෝලීය ආර්ථිකයෙහිද ඒ වෙනුවෙන් මතවාදී පදනම් සකසන නව ලිබරල්වාදීන්ද කතා නොවුනේ වසංගතයට පෙර පැවති ''යථා තත්ත්වයට'' යෑම ගෝලීය ව්‍යාපාරිකයින්ගේ අවශ්‍යතාව වූයෙනි. එහෙත් ඊට අභියෝග කළ වෙනස්වූ ලෝක දෘෂ්ඨියක් වෙනුවෙන් පෙනී සිටි ආර්ථික විද්‍යාඥයින්ද ඇත. පෙර පැවති ''යථා තත්ත්වය'' ඔවුහු දැන් නොපිළිගනිති. එවැනි අභියෝගාත්මක වෙනසකට සූදානමක් අපේ සමාජයේ දකින්නට නැත. එවැන්නක් පසුගිය අවුරුද්දේ ගොනු වූ ගාලු මුවදොර සාකච්ඡාවල හෝ නොතිබුණි. එබැවින් නැවත වරක් පෙර පැවති යථා තත්ත්වයට සීඝ්‍රයෙන් යෑමට වික්‍රමසිංහ ජනාධිපති පොරොන්දු වන්නේය.

ජාත්‍යන්තර පිළිගැනුමක් දිනා සිටින, ආර්ථික විද්‍යාව සඳහා 2019 නොබෙල් ත්‍යාගය හිමිවූ එස්ත ඩුෆ්ලො සහ කේට් රේවත්, මරියානා මට්සුකාටෝ, ස්ටෙෆනි කෙල්ටන්, කලොටා පෙරෙස්, වාමගාමී ආර්ථික විද්‍යාඥවරියක වන ක්‍රිස්ටින් බෙරී වැනි කාන්තාවන්ද පෝල් මේසන්, තොමස් පිකෙටි, සහ බ්‍රිතාන්‍යයේ ''ප්‍රජාතන්ත්‍රවාදී හවුලෙහි'' සභාපති ජෝ ගයිනන්, මාටින් ඕ'නීල් වැනි සැළකිය යුතු ආර්ථික විද්‍යාඥයින් පිරිසක් කොවිඩ් වසංගත සමයෙහි මතු කළ ඉතාම වැදගත් ප්‍රශ්නය වූයේ, කොවිඩ් වසංගතයට පෙර පැවති තත්ත්වය නැවත තහවුරු කරගත යුත්තේ මන්දැයි යන්නය.

ඒ යුගය දෙවන ලෝක යුද්ධයෙන් පසු පැවති ඉතාම නාස්තිකාර, අතිශය දූෂිත, අපරාධ පිරුණු, තම මව් බිම අහිමි වුනු ලක්ෂ ගණන් යුධ අනාථයින් බිහි කළ, පරිසරය විනාශ කරමින් ගෝලීය උෂ්ණත්වයට සහ බරපතල දේශගුණික විපරියාස වලට ලොවම ගොදුරු කළ, ප්‍රජාතන්ත්‍රවාදය හකුළා දැමීම සමග ගෝලීය සම්පත් භුක්ති විඳීම බලසම්පන්න අතළොස්සකගේ වරප්‍රසාදයක් බවට පත් කළ යුගයක් යැයි ඔවුහු කීහ. බහුතර ජනතාවකට එවැනි යුයකට නැවත යාමේ ඇති අරුත කුමක්දැයි ඔවුන්ගේ ප්‍රශ්නය විය.

එනිසා ඔවුන්ගේ අදහස වූයේ අප යා යුත්තේ සක්‍රීය ලෙස රාජ්‍ය ප්‍රජාතන්ත්‍රීයකරණය කරන්නාවූත් පරිසරය යළි පිරිසකර කරමින් සුරකින්නාවූත් සියල්ලන්ට සාධාරණ පංගුකාරිත්වයක් තිබෙන්නාවූ නිෂ්පාදන ආර්ථිකයකුත් ගොඩ නගා ගන්නා, පවතින අර්බුදයට අභියෝග කරන්නාවූ විසඳුමක් බව ය.

ඒ නිගමනය සමග කිසිදු අරියාදුවක් අකමැත්තක් අපට තිබිය නොහැකිය. අපගේ අර්බුද ඉහ වහා යන්නට පෙර, කොවිඩ් වසංගතයෙන්ද අප බේරුනා යැයි කියන්නටද කලියෙන්, අපගේ යථා පැවැත්මද ඔවුන් කියන විනාසකාරී, අශිෂ්ට පැවැත්මක්ම විය. දසක ගණනාවක්ම ගම අතරමංව තිබුණි. ගමේ පලදායි ආර්ථිකයක් නොවුනි. එබැවින් තරුණියන් දිනපතා මැද පෙරදිග ගෘහ සේවයට යැවීමට හැම ආණ්ඩුවක්ම පියවර ගත්තේය. තවත් පිරිස් නිදහස් වෙළඳ කලාපවල හා ඇඟළුම් කම්හල්වල කඹුරන්නට වූහ. ගමේ තාරුණ්‍ය කලක් යුද්ධයේ ඉදිරි පෙළ සොල්දාදුවන් ලෙස ගොස් බොහෝ දෙන නැවත පැමිණියේ නැත. පැමිණි අය සැළකිය යුතු සංඛ්‍යාවක් අනුන්ගේ කර මතින් අවසන් ගමන් යෑමට පැමිණි තරුණන් ය. ඒ අතරතුර, ගමේ හා වැව්ලිකරයේ

තරුණ පිරිස් අවිධිමත් ආර්ථිකයෙහි රැකියා සොයමින් කොළඹ හා අවට නාගරික ප්‍රදේශ වෙත සංක්‍රමණය වූහ.
ආර්ථික අභේනියෙහි ලොකුවට දකින්නට ඇති බේදවාචකය ඒ සියල්ල යැයි අපි සිතන්නෙමු. එහෙත් ඒ සන්දර්භයෙහි සිදුවුනු තවත් ප්‍රධාන බිඳ වැටීම් පොකුරක් ඇත. මානව පරිනාමය පුරා ''සමාජ සත්වයෙක්'' වුනු ''මිනිසා'' ලාභය හා වත්කම් පසු පස හඹා යන හදුකලා ගිජුලිහිණියෙකු වැනි කෑදර සත්වයෙකු බවට විවෘත වෙළඳපල ආර්ථිකය විසින් පත් කරනු ලැබිණ. එවගේම '70 දසකයේ අවසානය දක්වා සමාජයේ පැවති සාරධර්ම, විනය, සමාජ වටිනාකම්, ආචාර ධර්ම, අන්‍යෝන්‍ය සුහදත්වය වැනි යහපත් සියල්ල ඉකුත් දසකයක දෙකක කාලයෙහි විනාශ කෙරුණි. ඒවා සමග සමාජයේ හැම අස්සක් මුල්ලක් නෑර පැතිර ගිය අපරාධ, මිනී මැරීම්, මත්ද්‍රව්‍ය භාවිතය සහ අලෙවිය, කප්පම් ගැනීම්, ස්ත්‍රීන් සහ බාල වයස්කාර දැරිවියන් දූෂණය, ළමා අපචාර, ලිංගික හිංසන සාමාන්‍ය දෛනික සිදුවීම් බවට පත්ව ඇත.

ඒ කිසිවක් රුපියල් ශත වලින් ගණන් හැදිය හැකි විපාක නොවේ. එවගේම රටක මනුස්සකම පිරිහීමේ ඉතාම කණගාටුදායක විලාපය නැගෙන්නේ ස්ත්‍රීන්ට, විශේෂයෙන් ලා බාල දැරිවියන්ට ඒ සමාජය සළකන අයුරෙනි. මේ විවෘත වෙළඳපල ආර්ථිකය විසින් හැඩ කෙරුණු පාරිභෝගික සමාජයේ මනුස්සකම පිරිහීමත් එහි වර්ධනයවන අපරාධත් වාර්ෂික පොලිස් වාර්තා හා දත්ත ඇසුරෙන් බලාගෙන ගියහොත් දැකිය හැක්කේ මෙවැනි චිත්‍රයකි. විවෘත වෙළඳපල ආර්ථිකයෙහි 1979 සිට පළමු අවුරුදු 10 ක පමණ කාලයේ ස්ත්‍රී දූෂණ 365 ක් වාර්තාවී තිබිණ. 1990 සිට තවත් අවුරුදු 10 ක් යත්ම 2010 අවසානයේදී ඒ සංඛ්‍යාව 1,054 දක්වා ඉහළ ගොස් තිබිණ.

කොවිඩ් වසංගතයට පෙර වසර, 2019 වසර වනවිට, සීඝ්‍රයෙන් පිරිහුණු මේ රටෙහි ශීලාචාර සමාජයක් ඉතිරිව නොතිබුණු බවට මේ දත්ත කිහිපය සාක්ෂි කියනු ඇත. මෙය 2019 වාර්තා වූ බරපතල අපරාධ සම්බන්ධයෙන් පොලිස් දෙපාර්තමේන්තුව විසින් සකස් කළ සංක්ෂිප්ත සටහනින් උපුටා ගැණුනකි. ඒ ගැන මෙය මුලින්ම කිව යුතුව ඇත. බරපතල අපරාධ සම්බන්ධ මෙම සංක්ෂිප්ත සටහන, 2021 මැයි මස වන තෙක් පොලිස් දෙපාර්තමේන්තුව සතු නිල වෙබ් අඩවියෙහි පළකර තිබුණු බවට සහ අනතුරුව එය ඉවත්කර ඇති බවට සඳහන් කිරීම් ඇත.

එසේ වූවත් එහි වූ දත්ත අනුව මේ සමාජයේ සැබෑ පිරිහීම, සැබෑ ගරා වැටීම හා මනුස්සකම් අහිමිවීම ගැන ඇත්තේ මහා විලාපයකි.

මෙය සිංහල-බෞද්ධ යැයි කියන්නාවූ, ලෝකෙන් උතුම් යැයි කියන්නාවූ රටක තිරිසන් පැවැත්ම හෙළි කරන දත්ත ප්‍රමාණයකි. 2019 වසරේ පමණක් වාර්තාවූ ස්ත්‍රී දූෂණ සංඛ්‍යාව 1,674 කි. ඔවුන්ගේ කැමැත්ත අකමැත්ත නොතකා බාල වයස්කාර දැරිවියන් දූෂණය කිරීම් 67,548 කි. ළමුන්ට එරෙහි ලංගික අපචාර 256 කි. ළමුන්ට එරෙහි කුරිරුකම් 90,400 කි. අස්වාභාවික නැතිනම් බරපතල ළමා හිංසන 8,921 කි. මේ එකම වසරක කතාවකි.

ළමුන් ගැන කතාවට කුඩා පසුවදනක් තැබිය යුතුය. ළමා හිංසන, අපචාර, ලිංගික අතවර සැළකිය යුතු සංඛ්‍යාවක් අසන්නට ලැබෙන්නේ පාසල් ඇසුරෙහිය. මනුස්සකමත් සදාචාරයත් අතු ගා දැමුණු සමාජයේ අධ්‍යාපනය සීඝ්‍රයෙන් බිඳ වැටීමත් සමග ගුරු විනයද එළෙසින්ම වල් වැදෙන බැව් නොකිවමනා ය. ඒවගේම එහි ප්‍රතිවිපාකයක් ලෙස එවැනි හිංසන වාර්තා වන්නේද ඉතා අල්ප වශයෙනි. මෙහි සඳහන් කෙරුණේ එවැනි අල්ප සංඛ්‍යාවකි.

එම සංක්ෂිප්ත වාර්තාවටම අනුව, 2019 වසරේ මිනිස් ඝාතන 2,005 කි. පුද්ගල පැහැර ගැනීම් හා බලහත්කාරයෙන් රහස්‍ය ලෙස තබා ගැනීම් එකතුව 21,010 කි. කප්පම් ගැනීම් 5,040 කි. මුදල් අච්චු ගැසීම් හා ළඟ තබා ගැනීම් 6,709 කි. අන්තරායකර ඖෂධ, මත්ද්‍රව්‍ය ආනයන අපනයන හා නිෂ්පාදනය කිරීම, ප්‍රවාහනය සහ අලෙවිය වැනි නීති විරෝධි කටයුතු සම්බන්ධ වාර්තා 10,012 කි.

අනෙක් විනාශ ලෙස වාර්තා වන්නේ වනාන්තර විනාශය හා වන සත්ව ගැටුම් ය. අනවසර කැලෑ එළි කිරීම්, තෙත් බිම් වැනසීම් හේතුවෙන් ඇතිවන පාරිසරික විපරියාස අපේ රටේ සැබෑ ලෙස වාර්තා වන්නේ නැත. දේශපාලන අනුග්‍රහය ඇතිව සිදුවන හෙයින් එවැනි විනාශ නවතාලීමට නිල වශයෙන් කටයුතු යෙදෙන්නේද නැත. කඳු නාය යෑම් වැනි විනාශ ස්වාභාවික විනාශ යැයි නම්කර පැත්තකට දමනු ලබන්නේද එනිසාමය. එළෙසින් අපද සක්‍රියව හවුල්වන, ලොව පුරා සිදුවන පාරිසරික විනාශ හේතුවෙන් ඇතිවන අහිතකර දේශගුණික බලපෑම් දැන් ගෝලීය වශයෙන් කතාවන බරපතල අනතුරු සහිත විපරියාසයන් ය.

එවැනි සියල්ලට ගොදුරව සිටිනා අප උත්සාහ කළ යුත්තේ ඒ විනාස සහ බරපතල අපරාධ සමග වූ ඒ අශීලාචාර, අසාධාරණ සමාජය නැවත ඔසවා ගැනීමටදැයි අපිද අපෙන්ම ඇසිය යුතු වෙමු. ''හෙට'' ගැන කතාව ඊයේ පැවති සමාජය ගැන කතාවක් නොවිය යුතු යැයි මම තරයේ විශ්වාස කරමි. එය ''හෙට දවස'' ගැනම විය යුතුය.

# හෙට දකින හීනය
# අද පැල කිරීමට...

සමාජ සංවර්ධනය ගැන වැදගත් සංවාදයක් අපේ රටේ තවමත් හමු වන්නේ නැත. එහෙත් තැන තැන ඇසෙන කතා අනුව පෙර නොවූ යම් උනන්දුවක් දැන් ''සංස්කෘතිය'' සම්බන්ධයෙන් ඇතැයි සිතමි. වික්‍රමසිංහ ආණ්ඩුව 2002 දී ඉදිරිපත් කළ ඔවුන්ගේ ''යළි පුබුදමු ශ්‍රී ලංකා'' ආර්ථික ප්‍රතිපත්තිය සමග විවෘත වෙළඳපල ආර්ථිකය සම්බන්ධ මගේ විවේචන විරෝධ සටහන් කරන්නට පටන් ගත් පසු ''සංස්කෘතික දියුණුව'' ගැන මම යම් නිශ්චිත අදහසක් වර්ධනය කිරීමට උත්සාහ කළෙමි. එවැනි සාකච්ඡා කලාකරුවන් අතර නොමැත්තේ මන්දැයි මම ඇසූවෙමි. ඔවුන් කලා සන්ධාන අටවා ගෙන දේශපාලන පක්ෂ හා වේදිකාගත වූයේ කඩේ යන්නට ලියා ගන්නා බඩු ලැයිස්තුවක් වැනි ලැයිස්තු සමගින් පමණි. ඒවා හැමවිටම පෞද්ගලික ලාභ වාසි පිළිබඳ ඉල්ලීම් වලට සීමා වූ ලේඛන විය.

අනාගතය සඳහා ''දියුණු සංස්කෘතික මිනිසකු'' හැදීම යනු සමාජ සංවර්ධනයේම කතාවක් යැයි තර්ක කළ මම, වෘත්තීය සමිති වෙත එය යොමු කෙරුවෙමි. ඔවුන් පැය 08 ක වැඩ දිනය සඳහා වැටුප් ඉල්ලා සිටිය යුත්තේ අතිකාල නොමැතිව දෛනික අවශ්‍යතා ඉටු කර ගැනීමට ප්‍රමාණවත් වැටුපක් වශයෙන් යැයි මම කීවෙමි. පැය 08 ක සේවා කාලයෙන් පසු දවසේ ඉතිරි පැය 16 ය තමන්ට රිසි සේ ගත කරන්නට සියලු සේවකයින්ට අයිතියක් සහ හැකියාවක් තිබිය යුතු යැයි මගේ දැඩි විශ්වාසය විය. නිදහසේ, පොත පත, නාට්‍ය, චිත්‍රපට වැනි සාහිත්‍ය කලා රස වින්දනය සඳහා තනිව හෝ පවුලක් වශයෙන් කාලය වෙන්කර ගැනීමට සියලු සේවක සේවිකාවන්ට අයිතියක් ඇතැයි මම විශ්වාස කරමි. ඒ වෙනුවෙන්ද වියදම් දැරීම සඳහාවන දෛනික වැටුපක් පැය 08 ක සේවය සඳහා ඔවුන් ඉල්ලා සිටිය යුතු යැයි මම කීවෙමි. ඇතැම් වෘත්තීය සමිතිවල ක්‍රියාකාරිකයෝ කලාකරුවන්ට වඩා ඒ වෙනුවෙන් සංවේදී වූහ.

එබැවින් මා සංස්කෘතික දියුණුවක් යැයි කියන්නේ සමාජයේ ඇති ඓන්ද්‍රිය සංස්කෘතික ''අනන්‍යතා'' වලට අමතර සෞන්දර්යාත්මක සාධකයක් වශයෙනි. බහු සංස්කෘතික සමාජයක විවිධ සංස්කෘතික අනන්‍යතා පිළිගනිමින් සියල්ලන් සමානයින් ලෙස ගෞරවාන්විතව පිළිගැනීම සමග, සෞන්දර්යාත්මක රස වින්දනය දියුණු කිරීම අත්‍යාවශ්‍ය සාධකයක් ලෙස සටහන් කරමින්ය. දියුණු රස

වින්දනයක් සඳහාවන සෞන්දර්යාත්මක සංස්කෘතිකාංග පාසලේ සිටම දැනුවත්ව වගා කරන්නාවූ සමාජයක අනෙක් යහපත් හා සාධාරණ සමාජ සාධකද සමග මනුස්සකම, පරාර්ථය, කරුණාව සහ ආත්ම ගරුත්වය නොඅඩුව බුක්ති විඳින රටවැසියනට අණ පනත් නීති රීති එතරම් අවශ්‍ය නොවන්නේ යැයි මගේ දැඩි විශ්වාසයක් ඇත.

ඒ අදහස එක්තරා ආකාරයකින් මීට වසර 80 ට 90 ට පෙර සිට රාජ්‍ය මන්ත්‍රණ සභාවෙහි සංවාද වලද මතු වූවකි. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා කොමිසමක් පත් කිරීම පිළිබඳව අවුරුදු ගණනාවක් රාජ්‍ය මන්ත්‍රණ සභාවෙහිත් එහි විධායක කමිටුවෙහිත් වාද කෙරුණකි. වසර 03 ක කාලයක වාද විවාද වලට පසු 1940 මැයි මස අධ්‍යාපන ඇමති සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගරගේ ප්‍රධානත්වයෙන් රට පුරා ඇති සංවිධිත අසංවිධිත සමස්ථ අධ්‍යාපනයම අළලා කෙරෙන අධ්‍යනයකින් පසු රාජ්‍ය මන්ත්‍රණ සභාවට පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහාවන කමිටුවක් පත් කරනු ලැබිණ.

එහි වාර්තාව රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත් කර සම්මත කරනු ලැබුවේ 1943 සැසි වාර පත්‍ර අංක 24 වශයෙනි. මෙහි ඇත්තේ එහි අංක 06 සහ 07 යටතේ වන කරුණු උපුටා දැක්වීමක සිංහල පරිවර්තනයකි.

''*අපගේ මූලික අවශ්‍යතාව වන්නේ විවිධත්වයක් සහිත ජනගහනය විශාල දේශයක් ලෙස ගොනු කිරීමය. වාර්ගික මූලයන්, ආගම් සහ භාෂා වෙනස්කම් ඇති ජනතාවකගේ එකමුතුවක් ලංකාවට සුවිශේෂී නොවන්නකි. අපගේ වැනි විවිධත්වයක් සහිත ජනගහනයක් සමගින් පොදු දේශයක් බිහි කිරීම, නොකළ හැක්කක් නොවේ යැයි ඉතිහාසය පෙන්වන්නකි. නිසැකවම අපගේ සංස්කෘතීන්හි දැනටත් විශාල පොදු සාධකයක් ඇත...... ලංකාවේ අනාගතය සඳහා අධ්‍යාපනය සැළසුම් කිරීමේදී අපගේ උත්සාහය වන්නේ පොදුකම තව තහවුරු කිරීමටය. පොදු දේශයක් පිළිබඳ අදහස ප්‍රචලිත කිරීමටය............. මේ විවිධත්වය දුර්වලකමක් නොවේ. එය ශක්තියකි. සෑම ප්‍රජාවකටම පොදුකම වෙනුවෙන් යම් විශේෂිත එකතුවක් කිරීමේ හැකියාවක් ඇත. එය සක්‍රීය ලෙස කළ හැක්කේ සැමට සමාන අවස්ථා තිබේ නම් පමණි. අපගේ කාර්යභාරය වන්නේ සෑම පුද්ගලයෙකුටම තම උපරිම දායකත්වය ලබා දීමට හැකිවන අයුරු අසමානකම් මකා දැමීමය.*''

අවාසනාවකට කන්නන්ගර වාර්තාවෙහි මූලික අරමුණ වූ ''පොදුකම තව තහවුරු කිරීම, පොදු දේශයක් පිළිබඳ අදහස

ප්‍රචලිත කිරීම'' මේ රටේ කිසි දිනක අවධාරණය නොවූ අතර, එය අතහැර දැමූවකි. පාසල් අධ්‍යාපනයට ඒ වෙනුවට ඔබනු ලැබුවේ සිංහල-බෞද්ධ රජවරුන්ගේ ලංකාවක් සම්බන්ධ ඉතිහාස කතා ය. එබැවින් කන්නන්ගර නිර්දේශ මගින් අපේක්ෂා වූ සංස්කෘතික විවිධත්වය සමගින්වන පොදු දේශයක දියුණු සංස්කෘතික මිනිසකු හැදීමේ වගකීම සමස්ථ පාසල් අධ්‍යාපනයෙන්ම අත හැර දැමුනකි. විනාශය ඇත්තේ එය අතහැර දැමීමෙහි පමණක්ම නොවේ. ඊට ප්‍රතිවිරුද්ධව, සිංහල-බෞද්ධ මහ ජාතිවාදය බලහත්කාර බලයක් ලෙස සමාජය හමුවේ තැබීමෙහිය.

ඒ සියලු විනාශ හමුවේ ''ජාතික සංවර්ධනය'' ලෙස මා දකින්නේ යෝධ අභියෝගයකි. විෂමතා සීඝ්‍රයෙන් අවම කෙරෙන, සමාන අවස්ථා සහතික කෙරෙන නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක, ''දියුණු සංස්කෘතික මිනිසකු'' යළි හැදීමේ සමාජ ආර්ථික ක්‍රියාවලියක ආරම්භයකි.

එබැවින් හෙට ගැන අද කතා කළ යුතු යැයි මා යෝජනා කරන්නේ,

01. නිත්‍ය ජනතා සහභාගිත්වයක් ඇතිව රාජ්‍ය ප්‍රජාතන්ත්‍රීය කිරීමත්
02. පරිසරය යළි පිළිසකර කිරීම හා සුරැකීම, රජයේ හා ජන සමාජයේ වගකීමක් ලෙස සමාජගත කිරීමත්
03. ග්‍රාමීය ආර්ථිකයද සක්‍රීය නිෂ්පාදන ක්‍රියාවලියක් ලෙස ජාතික ආර්ථිකයට හවුල් කර ගන්නා, ආදායම් විෂමතා තුනී කෙරෙන ආර්ථිකයක් සමග වෙළඳපල නඩත්තු කිරීමත්

ජාතික සංවර්ධන සැළසුමෙහි ප්‍රතිපත්තිමය පදනම ලෙස තබා ගැනීම සම්බන්ධයෙනි.

## 01. රාජ්‍ය ජනතාකරණය කිරීම උදෙසා

රාජ්‍ය ප්‍රජාතන්ත්‍රීය කිරීම යනු සමස්ථ ජනතාවටම, සියලු සංස්කෘතික අනන්‍යතාද ඇතිව තමන්ගේ යැයි කිව හැකි රාජ්‍යයක් ලෙස රජය යළි තහවුරු කිරීමකි. අපේ රටේ එය ලියන කියන තරම් පහසු කාර්යක් නම් නොවන්නකි. එයට හේතු දෙකකි. ''රාජ්‍ය'' යනු දෛනික සමාජ පැවැත්ම සඳහාත් ආණ්ඩු විසින් තම ප්‍රතිපත්ති, සැළසුම්, ක්‍රියාවට දැමීම සඳහාත් නියාමනය සඳහාත් ස්ථාපිත කෙරුණු එකිනෙකට සම්බන්ධ පරිපාලන කාර්යාල, පොලීසි, හිරගෙවල්, ආරක්ෂක හමුදා, උසාවි ඇතුළත් යාන්ත්‍රණයක් පමණකැයි සිතුවත් ඒ සියල්ල සමග රාජ්‍යයද මතවාද නඩත්තු

කෙරෙන, මතවාද අනුව ප්‍රතිචාර තීන්දු කරන, ඒ අනුව සමාජය හැසිරවිය හැකි යෝධ මෙවලමකි.

රාජ්‍ය ජනතාකරණය කිරීමේ බරපතලම අසීරුව හා බාධාව වන්නේ රාජ්‍යයෙහි මේ මතවාදී පැවැත්මය. දෙවැන්න, ඒ මතවාදය අනුව මර්දනය සඳහාවන බැර උපකරණයක් ලෙස රාජ්‍ය යොදා ගැනීමය. තෙවනුව, එහි දූෂිත අකාර්යක්ෂම පැවැත්මය. ඉන් පළමුවැන්න, තීරණාත්මක සාධකයකි. විශේෂයෙන් සිංහල-බෞද්ධ මතවාදය ප්‍රචණ්ඩ මතවාදයක් ලෙස ලිහා දැමීමත් එය රාජ්‍ය මතවාදය වන විට සිංහල-බෞද්ධ මතවාදයට වෙනස් සියලු මතවාද රාජ්‍ය විරෝධී මතවාද ලෙස මර්දනය කිරීමත් එක ගමන් යන නිසා ය. තෙවැන්න එවැනි මර්දනයක් විසින් සමාජය සම්වෘත සමාජයක් බවට පත් කෙරෙන හෙයින් ඒ සමාජය නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් නොවන්නේය.

රාජ්‍ය මර්දනය ගැන කතාව පටන් ගැනීමට 1971 ජ.වි.පෙ කැරැල්ලට යා යුතුය. රාජ්‍ය පාලනය වෙනුවෙන් සාමාන්‍ය නීතියට අමතරව හදිසි නීතිය යොදා ගැනීම, 1971 ජ.වි.පෙ සන්නද්ධ කැරැල්ල හේතුවෙන් බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව, විපක්ෂයේද පූර්ණ එකඟතාව ඇතිව සිදු කෙරුවකි. පළමු වරට 1977 පෙබරවාරි දක්වා නොකඩවා වසර 06 ට ආසන්න කාලයක් හදිසි නීතියට අනුව කටයුතු කිරීමේ නෛතික බලය ලැබුණු පොලීසිය, ඒ අධිකාරී බලයට හුරු වන්නට ඇබ්බැහි වන්නට විය. එයට රැකුලක් වූයේ, සිවිල් දෙපාර්තමේන්තුවක් ලෙස පිහිටුවනු ලැබ තිබූ පොලීසියට පළමු වරට නවීන අවි ආයුධ සමග ප්‍රහාරක අවි භාවිතය සඳහාද '71 කැරැල්ලෙන් පසු පුහුණුවීම් ලබා දීමය.

ජයවර්ධන 1977 මහ මැතිවරණයෙන් බලයට පත් වන විට ජ.වි.පෙ කැරැල්ලේ සුන්බුන් පවා පිස දමා තිබුණු අතර, විවෘත වෙළඳපල ආර්ථිකය සඳහා ඔහුගේ ආණ්ඩුව මුල පිරුවේ 1977 සහ 1979 දෙමළ ජනතාවට එරෙහි මැර ප්‍රහාර සමගය. උතුරේ තරුණ කල්ලි කිහිපය මර්දනය කිරීම සඳහා යැයි අනතුරුව 1979 දී සම්මත කෙරුණු තාවකාලික ''කොටි පනත'' පසුව ස්ථිර පනතක් වශයෙන් සම්මත කෙරුණි. ''කොටි පනත'' මගින් හදිසි නීති බලතල වලට සමාන බලයක් පොලීසියට ලබා දුන්නේය. අතරින් පතර සාමාන්‍ය නීතියට මාරු වූවත් සමස්ථයක් ලෙස 1971 න් ඇරඹි හදිසි නීති පාලනය අවුරුදු 40 ක පමණ කාලයක් පවත්වා ගැනීම පොලීසියේ වගකීම් හා කාර්ය වඩා මර්දනකාරී පාලනයකට අවශ්‍ය පරිදි සකස්කර ගැනීමකට අවකාශය ලබා දුන්නකි. එවගේම ඒ දිගු කාලයේ පොලීසියට කෙරුණු බඳවා ගැනීම් සහ පුහුණුවීම්

කෙරුණේ හදිසි නීතිය හා කොටි පනත ක්‍රියාත්මක කෙරුණු සමාජ පසුබිමක ය.

හදිසි නීතිය යටතේ වන රාජ්‍ය පාලනය සාමාන්‍ය නීතියට පිටතින් පවත්වා ගන්නා පාලනයක් වූවත් ව්‍යවස්ථාමය පාලනයකි. එනිසා හදිසි නීතිය හා අනෙක් මර්දනකාරී නීති සමගින් දිගු කල් රාජකාරී කටයුතු කරන පොලීසිය, මර්දනය තමන් සතු නිල අවියක් ලෙස සිතන්නට පමණක් නොව, භාවිත කරන්නටත් හුරු පුරුදු වෙති. ඒ සමග ප්‍රාදේශීය ස්ථාන භාර ප්‍රධානීන්ද පොලීසියේ ඉහළ නිලතලද දේශපාලනීකරණයට හසු විය.

එවැනි රාජ්‍ය යාන්ත්‍රණයක් නොමැති වූවා නම්, දිස්ත්‍රික් සංවර්ධන සභා මැතිවරණ සමග 1981 මැයි මස අවසානයේ යාපනය නගරය විනාශ කරමින් දකුණු ආසියාවේ විශිෂ්ට පුස්තකාලයක් වූ යාපනය පුස්තකාලය ගිණිබත් කිරීමට ජයවර්ධන ආණ්ඩුවේ ප්‍රබල ඇමතිවරුන්ට සෘජුව සහභාගි වන්නට නොහැකිය. රටම නිගාවට පත් කෙරුණු දෙමළ ජනතාව දහස් ගණනින් අවතැන් කළ, ඔවුන්ගේ ගෙවල් දොරවල් ගිණිබත් කළ, සිය ගණනක් ඝාතනය කළ '83 කලු ජූලියද එ.ජා.පට දියත් කළ හැකි වූයේ ඒ හේතුව නිසාමය. එතැනින් පසු හමුදා ක්‍රියාකාරිත්වයකින් දෙමළ සන්නද්ධ කණ්ඩායම් විනාශ කිරීමේ දිග ඇදුණු යුද්ධයකට රටම ඇද දැමුනි. යුද්ධයක් ඉල්ලා සිටි දකුණේ සිංහල-බෞද්ධ මානසිකත්වය විසින් රාජ්‍ය වඩ වඩාත් මර්දනකාරී ප්‍රබල රාජ්‍යයක් බවට පත් කිරීමෙන් දෙමළ ජාතික ප්‍රශ්නය සාකච්ඡා මගින් විසඳිය හැකි තත්ත්වයක් ඉතිරි නොකළේය.

වඩා තීව්‍ර වූ හා මෘග ලෙස ව්‍යාප්ත වූ සන්නද්ධ ගැටුම් හේතුවෙන් ඉන්දියානු මැදිහත්වීමද සෘජු මැදිහත්වීම් ලෙස විවෘත වන්නට විය. 1987 ජූලි මාසයේ අත්සන් තැබුණු ඉන්දු-ලංකා ගිවිසුමට අනුව උතුරු-නැගෙනහිර පළාත් ඉන්දියානු ''සාම හමුදා'' යටතේ තැබිණ. ඉන්දීය මැදිහත්වීමට එරෙහිව දකුණේ සිංහල-බෞද්ධ දේශප්‍රේමය අතට ගත් ජ.වි.පෙ දියත් කළ ම්ලේච්ඡ ත්‍රස්තවාදය හේතුවෙන් සමාජයේ ප්‍රජාතන්ත්‍රවාදී පැවැත්ම යටපත් කෙරුණාට අමතරව, ඔවුහු වාමගාමී හා ආණ්ඩුවාදී පුද්ගලයින් 90 ට වැඩි පිරිසක් ඝාතනය කළහ. තරුණ ජීවිත 2,300 ක් පමණ අහිමි විය. ඉන්දියානු ''සාම හමුදා'' 1990 දී පිටත්ව යන විට, ඔවුන්ගෙන් 1,100 ට වැඩි සොල්දාදුවන් පිරිසක් මිය ගොස් තිබිණ. 2009 මැයි මස යුද්ධය කෙළවරකට පැමිණෙන විට ලක්ෂයකට වැඩි ලාංකීය සිවිල් වැසියන්ද, රාජ්‍ය හමුදාවන්හි 30,000 ක් පමණද එල්.ටී.ටී.ඊ 27,000 ක් පමණද මිය ගොස් තිබිණැයි ගණන් බලා ඇත.

අනතුරුව වඩාත් ශක්තිමත්ව සකස්වූ සමාජ යථාර්තයේ ඉතිරි වූයේ සිංහල-බෞද්ධ ආධිපත්‍ය විසින් අනුමත කර බාර ගනු ලැබුණු හමුදාකරණය සහ ස්වාධීන විය යුතු රාජ්‍ය, සිංහල-බෞද්ධ රාජ්‍යයක් ලෙස ස්ථාපිත වීමය.

රාජ්‍ය ප්‍රජාතන්ත්‍රීය කිරීම එබැවින් හුදෙක් ග්‍රාමීය මට්ටම දක්වා වන රාජ්‍ය ව්‍යුහ යළි ප්‍රතිසංවිධානය කිරීමකට සීමා කළ හැකි නොවේ. රාජ්‍ය ප්‍රතිසංවිධානය කිරීමට දියුණු මතවාදී මැදිහත්වීමක්ද අවශ්‍ය වන්නේය. කන්නන්ගර මහතාගේ ප්‍රධානත්වයෙන් වූ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කමිටුව අපේක්ෂා කළ ''විවිධත්වයක් සහිත ජනගහනය විශාල දේශයක් ලෙස ගොනු කිරීම'' අතහැර සිංහල-බෞද්ධ අධිපති මතවාදය තහවුරු කළ ප්‍රධාන ධාරාවෙහි ජාතිවාදී දේශපාලනය, අලුත් මතවාදී මැදිහත්වීමකින් තර්කානුකූලව හා අධිශ්ඨානසහගතව කණපිට හැරවීමට සිදුවන්නකි. සිංහල-බෞද්ධ අධිපති මතවාදයට එරෙහි අලුත් සමාජ මතවාදයක් ලෙස කන්නන්ගර කොමිසම අපේක්ෂා කළ සංස්කෘතික විවිධිවත්ය සමගවන ''පොදුකම'' අලුතින්ම තහවුරු කිරීමට සිදුවන්නකි.

පෘතුගීසින් 1505 දී අහම්බෙන් ලංකාවට ගොඩ බසින විට අද සිංහල-බෞද්ධ මතවාදය ඉතා දැඩිව රකින ඒකීය රාජ්‍යයක් මෙරට ඉතිහාසයෙහි කෙදිනකවත් නොවුනි. පෘතුගීසින් ගොඩ බැස්සේ කන්ද උඩරට, ජයවර්ධනපුර, සීතාවක, රයිගම්පුර සහ යාපනය ලෙස කැබලි රාජ්‍ය 05 ක් වූ ලක්බිමටය. පසුව 1658 දී ලන්දේසීන් විසින් අල්ලා ගන්නා විටද ලක්බිම එසේම කැබලි රාජ්‍ය ලෙස පැවතින. අවසානයේ 1815 දී බ්‍රිතාන්‍යයින් විසින් මුලු දිවයිනම ඔවුන්ගේ අණසකට දිනාගත් පසු 1835 අංක 19 දරණ ඉඩම් සංවර්ධන ආඥා පනතින් සමස්ථ ලංකාවේම බිම් ප්‍රමාණය බ්‍රිතාන්‍ය කිරීටයට පවරා ගනිමින් පියවරෙන් පියවර මේ භූමිය පාලනය කිරීම සඳහා ස්ථාපිත කළ සංවිධිත ''ඒකීය රාජ්‍ය'' මේ රටට අලුත්ම අත්දැකීමක් විය.

තවමත් සුද්දන් හැදූ ඒ ''ඒකීය රාජ්‍ය'' සිංහල-බෞද්ධයින්ගේ ඒකීය රාජ්‍යයක් යැයි දකුණේ බහුතර සමාජයේ තහවුරු කෙරෙන මතවාදය අභියෝග නොකර, රාජ්‍ය ප්‍රජාතන්ත්‍රීය කිරීමේ ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කළ නොහැකිය. කෙටියෙන් කිවහොත් රාජ්‍ය ප්‍රජාතන්ත්‍රීය කිරීම සියල්ලන් එක්සත් කිරීමේ නව සමාජ මතවාදයක් පිළිබඳ කතාවකි. සියලු සංස්කෘතික අනන්‍යතා සමාන යැයි වන පිළිගැනුම සමගින් එක්සත් එකමුතු දේශයක් තහවුරු කිරීම වෙනුවෙන් එවැන්නක් දේශපාලන වගකීමක් ලෙස බාර නොගන්නේ නම්, රාජ්‍ය ප්‍රජාතන්ත්‍රීය කිරීමේ කාර්ය භාරයට ඉඩක්

නොමැත. සෙසු ව්‍යුහාත්මක වෙනස්කම් ගැනද ඊට අදාලව කතා කළ යුත්තේ, රාජ්‍ය ප්‍රජාතන්ත්‍රීය කිරීම යනු වෙනකක් නොව එහි ක්‍රියාකාරිත්වය ඍජු නියාමනයකට ලක් කිරීමේ රටවැසි අයිතිය ඉන් සහතික කිරීමක්වන හෙයින් යැයි කිව යුතුය.

## 02. නිස්කලංක පරිසරයක් සුරැකීම උදෙසා

''ස්වභාව ධර්මය'' නැතිනම් අප වටා ඇති පාරිසරික සම්පත් සඳහා වටිනාකම් සහතික නොකිරීම සමග ඒවා පෞද්ගලික වාසි, ලාභ ප්‍රයෝජන වෙනුවෙන් යොදා ගැනීමට විශේෂ අවසරයක් සැළසුමක් අවශ්‍ය යැයි සමාජය සිතන්නේ නැත. එනිසා හැම දූෂිත ආණ්ඩුවක් යටතේම වැඩි සමාජ අවධානයකින් තොරව විනාශ කෙරෙන්නේ වෙරළබඩ තීරුවය. එය සංචාරක ව්‍යාපාරය වෙනුවෙන් යැයි වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ නගර සංවර්ධන අධිකාරියද ඔවුන්ගේ වාසි වෙනුවෙන් අත හැර දමන භූමි තීරුවකි. සංචාරක ව්‍යාපාරය යැයි කියූ විට, මේ සමාජයටද පරිසරය වැදගත් නැත.

දුප්පත් ග්‍රාමීය සමාජයේ සාමාන්‍ය ජන ජීවිතයේද පරිසර විනාශයක් ඇතිවන බවක් නොසිතෙන්නේත් පරිසරය අවශේෂ විෂයක් නිසාවෙන්මය. සමාජ ආකල්පයන්හි ඇති ඒ දිළිඳුකම හේතුවෙන් ජාතික පාරිසරික ප්‍රතිපත්තියක අවශ්‍යතාව මේ සමාජය දකින්නේ නැත.

මේ විවෘත වෙළඳපල ආර්ථිකයෙහි ප්‍රධාන දේශපාලන ධාරාවත් රාජ්‍යයත් ජාවාරම්කාර අනුග්‍රහය සමගින් පවතින හෙයින් මහ කැලෑ විනාශ වැනි යෝධ පරිසර විනාශ ඇතිවන්නේ ප්‍රදේශයේ ජනතා විරෝධ තලා දැමීමත් සමගින්ය. එනිසා නීති තිබූ පමණින් එවැනි පරිසර විනාශ නතර කළ නොහැකිය. නීති නිසි අයුරු ක්‍රියාත්මක නොවීමත් ජාවාරම්කාර ගනුදෙනු ලෙස තීන්දුවන බැවිනි.

ඒ නිසාවෙන් පරිසර සංරක්ෂණයටත්, කාර්මික අපද්‍රව්‍ය ඉවත් කිරීමටත් පරිසර සංරක්ෂණ බලපත්‍ර සඳහාත් වායු හා ශබ්ද දූෂණ සම්බන්ධවත් ඝණ කසළ කලමනාකාරිත්වය සම්බන්ධවත් වෙරළ සංරක්ෂණය සඳහාත් තවත් එවැනි අපමණ වෙනත් කාරණා සම්බන්ධවත් මේ රටේ නීති ඇතත් ඒවායේ වගකීම් නෛතිකව පැවරුණු රාජ්‍ය ආයතන ඇතත් ඒ නීති අණ පනත් කිසිවක් නිසියාකාරව ක්‍රියාත්මක කෙරෙන්නේ නැත.

පරිසර සුරක්ෂාව සම්බන්ධ දියුණු සමාජ අවබෝධයක් හා වගවීමක් ඇති කෙරෙන අයුරු පුළුල් සංවාදයක් අනෙක් කාරණා සඳහා මෙන්ම පරිසරයටද අවශ්‍ය වන්නේ එබැවිනි. එය ''ජාතික පරිසර ප්‍රතිපත්තියක්'' කෙටුම්පත් කිරීමේ පුරෝගාමී කාර්ය නොපමාව ආරම්භ කිරීමට මුල පුරණු ඇත. පුළුල් සමාජීය හවුලකින් ඇති කර ගන්නා සමාජීය බැඳීමක් නොමැතිව පරිසරය සුරැකිය නොහැකිය.

## 03. ජාතික ආර්ථිකයක් සමගවන වෙළඳපලක් උදෙසා

අවුරුදු 40 ට වැඩි කාලයක් අපි අති දූෂිත, විනාශකාරී සහ වාර්ගික අන්තවාදය නඩත්තු කරන, මේ තොරොම්බල් ආර්ථික ක්‍රියාවලියේ ජීවත් වීමු. එහි තරගකාරී පාරිභෝගිකයින් ලෙස අපව දක්කා ගෙන යනු ලැබූයේ යෝධ වෙළඳ ප්‍රචාරණ කර්මාන්තයක් මගින්ය. අපගේ පාරිභෝගික තේරීම් පමණක් නොව, අපගේ දෛනික ජීවිතයේ හැඩරුව සහ පරිභෝජනයද තීන්දු කරනු ලැබූයේ විවිධාකාරයෙන් අපව හැසිරවූ මේ වෙළඳ ප්‍රචාරණ කර්මාන්තය විසින්ය. ඒ වෙනුවෙන් අපගේ විවේකය, නිදහස සහ සෞන්දර්යාත්මක රස වින්දනය අපට නොදැනීම අපෙන් වියෝ විය. පාරිභෝගික තරගයෙහි ගැනුම්කරුවන් ලෙස අප ණය වූයේ අනුන්ගේ ලාභ වැඩි කරන්නට බැව් අකමැත්තෙන් වූවත් පිළිගත යුතුව ඇත. එවැනි වෙළඳපල ආර්ථිකයක් සංවර්ධන ආකෘතියක් නොවන බව නැවත නැවතත් අමුතුවෙන් අලුතින් කීමට අවශ්‍ය නැත.

දැන් අභියෝගය වන්නේ ජාවාරම්කාර ඒ වෙළඳපල ආර්ථිකයට අභියෝග කළ හැකි සමාජ සංවර්ධනය සඳහාවන ආර්ථික ආකෘතියක් සකස්කර ගැනීමය. ඒ සඳහා අප පළමුව 1970 පෝලිම් යුගයට ගොස් පැමිණිය යුතු යැයි සිතමි.

මේ විවෘත වෙළඳපල ආර්ථිකය ප්‍රතික්ෂේප කළ වහා නාගරික මැදපංතිකයින් අසන්නේ ''ඔය කියන්නේ නැවත මැතිනියගේ පෝලිම් යුගයට යන්නදැයි'' කියා ය. ඔවුන් කියන 1970-1977 බණ්ඩාරනායක මැතිනියගේ සභාග ආණ්ඩුව කාලයේ, මේ විවෘත වෙළඳපල ආර්ථිකයේ මෙන් කිලෝ මීටර 10 - 15 දිග, දින ගණන් එක දිගට පෝලිම් ගැසුණු, පෝලිම්වල මිනිසුන් මිය ඇදුණු යුගයක් නොවුනි. එදා නාගරික සමාජයේ පාන් සළාකය සඳහා පැය භාගයක් පැයක් උදෙන්ම පෝලිමේ ඉන්නට සිදුවිය. පැයක් හමාරක් සතියේ අත්‍යාවශ්‍ය සළාක ගැනීමට සමූපකාර පෝළිමේ සිටින්නට සිදුවිය. එවැනි පෝලිම් කිහිපයක් සහ වී, සහල් වැනි අත්‍යාවශ්‍ය භාණ්ඩ පෞද්ගලිකව ප්‍රවාහනය කිරීමේ තහංචි තිබිණ.

ඒ ගැහැට වෙනුවෙන් රටට, බහුතර ජනතාවට ලැබුණු යම් වාසි තිබිණ. සමාජයේ ආදායම් විෂමතාව තුනී විය. 1970-1977 යුගයේ ජනගහනයේ පහළම සියයට 40, ජාතික ආදායමෙන් සියයට 20 ට ආසන්න ප්‍රතිශතයක් බුක්ති වින්දාහ. බණ්ඩාරනායක මැතිනියගේ සභාග ආණ්ඩුව සමයේ සමස්ථ රාජ්‍ය වියදම් අතුරෙන් සමාජ සේවා හා සුභසාධනය වෙනුවෙන් සියයට 33 ක මුදලක් වැය කෙරුණි.

පෝලිම් වලට අමතරව, ඒ යුගයේ ජාතික ආර්ථිකය විශාල නිෂ්පාදන ආර්ථිකයකට යොමු කරමින් තිබිණ. ටයර්, ලෝහ භාණ්ඩ, පේෂකර්ම, පිඟන්, කඩදාසි, සිමෙන්ති, ඖෂධ වැනි ආනයන ආදේශන වෙනුවෙන් ආරම්භ කෙරුණු නිෂ්පාදන විය. ඉන් ජාතික වශයෙන් තිබූ ආර්ථික වාසි දෙකකි. පළමුව ආනයනය සඳහා වැය කළ යුතු වූ විදේශ විනිමයෙන් වැදගත් ප්‍රතිශතයක් ඉතිරි කරගත හැකි විය. දෙවැන්න, විශාල රැකියා උත්පාදනයක් ඇති විය.

රාජ්‍ය හිමිකාරිත්වය සමග පැවති ඒ කර්මාන්ත සම්බන්ධව තිබූයේ වෙළඳපල සඳහා තරග වැදිය හැකි අයුරු නිෂ්පාදන සඳහා තත්ත්ව වර්ධනයක් සහිත දියුණු කලමනාකාරිත්වයක් එකතු නොකිරීම පිළිබඳ ගැටළුවය. එවැනි වර්ධනයකට නොයන්නට ප්‍රධානම හේතුවක් වූයේ 70 -77 ආණ්ඩුවේ පැවති සමසමාජ හා කොමියුනිස්ට් පක්ෂ දේශපාලන බලපෑමය. ඔවුන් අනුකරණය කරන්නට වූයේ රුසියානු පන්නයේ රාජ්‍යවාදී ආර්ථික මාදිලියකි. එවැන්නක නිෂ්පාදන තීන්දු වන්නේ වෙළඳපල තරගකාරිත්වය මත නොව, සමාජ අවශ්‍යතා තීන්දු කිරීමේ අයිතිය පවරා ගන්නා මධ්‍යම ආණ්ඩුව මගින්ය. අනතුරුව ඒ වගකීම් රජය වෙත පැවරීමෙහිය.

මේ සීමා ඉවත් කරමින් එවැනි භාණ්ඩ බොහෝමයක් වෙළඳපල ඉලක්ක කොට නිෂ්පාදනය කිරීමට හැකිව තිබිණ. එහෙත් ජයවර්ධන ආණ්ඩුව 1977 බලයට පැමිණීමට මැතිනියගේ සභාග ආණ්ඩුවේ පෝලිම් හැල්ලු කෙරුවා මිස, රාජ්‍යගත නිෂ්පාදන ගැන කිසිවක් කතා නොකළේය. බලයට පැමිණි විගස 1977 - 78 සඳහාත් 1979 - 82 දක්වාත් ඔහු ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ආර්ථික සහාය ලබා ගත්තේය. අද වාගේම අවුරුදු 40 ට පෙරද ජා.මූ.අරමුදලේ ප්‍රතිකාර වූයේ පසුව ඔවුන්ගේ ''වොෂිංටන් සම්මුතිය'' සඳහා පදනම සැපයූ විනිමය අනුපාත ලිහිල් කිරීම, රුපියල අවප්‍රමාණය කිරීම, මිල පාලන ඉවත් කිරීම, ආහාර

සහනාධාර කපා හැරීම, වැටුප් වැඩි කිරීම් අත්හිටුවීම සහ පෞද්ගලික ආයෝජන සඳහා වාසි සහ වරප්‍රසාද ලබා දීමය.

ඒ සම්බන්ධව පසුව කෙරුණු විචාර විවරණ වලට අනුව, ජයවර්ධන 1977 බලයට එනවිට ජාතික ආදායම් බෙදී යාමේදී සමාජයේ පහළ සියයට 40 බුක්ති විඳි සියයට 20 වසර 05 ක කාලයකදී 1982-83 වනවිට සියයට 15 ක් දක්වා අඩු විය. ඒ කාලය තුල සමස්ථ වාර්ෂික රාජ්‍ය වියදමින් සමාජ සේවා හා සුභසාධනය සඳහාවූ වියදම සියයට 33 සිට 22 ක් දක්වා අඩු කෙරිණ. සය වසරකට අඩු දරුවන් අතර මන්දපෝෂණය ඒ කාලය තුල සියයට 9.4 දක්වා ඉහළ ගියේය.

ඉන් එක් විවරණයකින් ගනු ලැබූ මේ උපුටනය දක්වන්නේ ජා.මූ.අරමුදල හවුල් වූවාට, මේ විවෘත වෙළඳපල ආර්ථික පවත්වා ගැනීමට මහජාතිවාදයේ බලහත්කාරයත් අධිකාරවාදයත් දේශපාලන වශයෙන් යොදා ගන්නා බැව් පෙන්වීමට ය. ''ජා.මූ.අරමුදලේ වැඩසටහන ක්‍රියාත්මක වූයේ දේශපාලන වෙනස්වීම් දෙකක් පසුබිමෙහිය. පළමුවැන්න, වැඩිවෙන ආර්ථික පීඩා හමුවේ ගොනුවන ජනතා වෛරය මග හැර ගැනීමට ආණ්ඩුවට උපායික වෙනසක් අවශ්‍ය විය. ඒ අනුව ආණ්ඩුව දැනුවත්ව සිංහල ජනතාව හා දෙමළ සුළුතරය අතර බෙදීමක් වෙනුවෙන් සිංහල ජාතිවාදයක් ප්‍රවර්ධනය කළේය. දෙමළ සුළුතරයට එරෙහිව විධිමත් වෙනස්කම් කිරීම් හා නිරන්තර පහර දීම් සිදුවිය..........දෙවනුව, ආණ්ඩුවේ නවලිබරල්වාදී ප්‍රතිපත්ති වලට විරුද්ධවූ වෘත්තීය සමිති සහ වාමගාමී සංවිධාන මර්දනය කෙරුණි. පාර්ලිමේන්තුවාදී ක්‍රමය වෙනුවට ජනාධිපති ක්‍රමයක් ඇති කළ පසු ඒකාධිපතිවාදයට රුකුලක් ලැබිණ. හදිසි නීති සහ හමුදාව යොදා ගනිමින් මෘග ලෙස වැඩවර්ජන තලා දැමුණි. 1980 ජූලි වැඩ වර්ජනය සම්බන්ධයෙන් ජනාධිපති ජයවර්ධන ජාතිය අමතා වරක් පැවසූයේ අලියා තවම හෙල්ලුවේ හොඬවැල විතරක් බවත් සම්පූර්ණ ශරීර ශක්තිය යොදා නොගත් බවත්ය.'' (Roots of Sri Lanka's economic crisis – R. Ramakumar)

ආර්ථික ගරා වැටීම සමග මේ තත්ත්වයන් තව තවත් උග්‍රවනවා මිස පාලනය වීමක් අඩු වීමක් අත් දකින්නට නැත. එනිසා මේ විවෘත වෙළඳපල ආර්ථිකය නියත වශයෙන්ම වෙනස් කළ යුතු අතර, එය වෙනස් කළ යුත්තේ දියුණු සංස්කෘතික මිනිසකු ඇති කළ හැකි ජාතික සංවර්ධනයක් වෙනුවෙනි.

# අ. අභියෝගාත්මක වෙනසකට

බොහෝ දෙන තවමත් පෝලිම් යුගයක් යැයි ප්‍රතික්ෂේප කරන රාජ්‍යවාදී ආර්ථිකය සහ අනෙක් පිරිස වෙන විසඳුමක් නැතැයි කියමින් මේ අපරාධ පිරි, දූෂිත, අශිෂ්ට සමාජයේම ජීවත්වීමට උත්සාහ කරන විවෘත වෙළඳපල ආර්ථිකයටද වෙනස් අලුත් ආර්ථික තේරීමක් තිබිය යුතුය. එය ලෝකේ කොහේ තිබෙන්නේ දැයි අසන අයට ඉතාම කෙටියෙන් මා කියන්නේ, ලෝකේ වෙනත් තැනක විකල්ප හැදෙන තෙක් සිටින්නට මා සූදානම් නැති බවත්, වෙනත් අයට අවශ්‍ය නම් අපෙන් විකල්පය කොපි කර ගැනීමේ තහනමක් නැති බවත්ය.



එවැනි නව විකල්පයක් සංකල්පගත කර ගැනීමේදී මූලික ලක්ෂණ පිළිබඳව සමාජ අවබෝධයක් මෙන්ම බහුතර එකඟතාවක් තිබිය යුතුයැයි මම සිතමි. මේ කතා කරන්නේ සමාජ කතිකාවක් ඔස්සේ පොදු එකගතාවක් ඇතිව ක්‍රියාත්මක කෙරෙන්නාවූ නව ආර්ථික තේරීමක් ගැනය.

එවගේම මෙතැන් සිට අපට කතා කිරීමට සිදුවන්නේ ආරම්භයේදී කියූ අයුරු හෙට දවස ගැට ගසා ගැනීමේ දැවැන්ත අභියෝගයට මුහුණ දී සිටින සියයට 35 ක් පමණ වන දූ දරුවන්ද ඇතුළත් පවුල් සඳහා වහා අත්‍යාවශ්‍ය භාණ්ඩ ඇතුළත් සහන මල්ලක් සමග සුභසාධන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමේ සැළසුම්ද සමගය.

එය සමෘද්ධි හෝ අස්වැසුම නොවිය යුතුය. එය මාසික වැටුප හෝ පවුලේ ආදායම රුපියල් 60,000 ට නොවැඩි පවුල් සඳහා කාණ්ඩ දෙකක් ලෙස වර්ගීකරණය කරමින් ලබා දෙන්නක් විය යුතුය. ඒ තේරීම් ග්‍රාම සේවා වසම් මට්ටමින් විවෘත ජන සහභාගිත්වයක් ඇතිව තෝරා ගන්නා සහනලාභීන් ලේඛනගත කිරීමක් විය යුතුය.

ඉන්පසු එය ඉදිරි වසරකට දීර්ග කරනවා නම් ඒ කෙසේ දැයි නැවත සමාජ කතිකාවකින් තීන්දු විය යුතුය.

ඒ ක්ෂණික අවශ්‍යතාව ඉදිරියෙන් තබා ගෙන මගේ තේරුම් ගැනීම අනුව අලුත් ආර්ථික තේරීම සතු ලක්ෂණ කිහිපයක් මෙසේ කැටි කරන්නෙමි.

1. මෙය පෞද්ගලික ආයෝජන සඳහා වැදගත් අවකාශයක්ද සමගින්වන ජාතික සංවර්ධනය ඉලක්කගත වෙළඳපල ආර්ථිකයකි.
2. ග්‍රාමීය ආර්ථිකය සඳහා කෘෂි නිෂ්පාදන නවීකරණය කෙරෙන හා වෙළඳපල අවකාශ දියුණු කෙරෙන සැළසුම්ගත ආර්ථිකයකි.
3. අනිවාර්යෙන්ම අපනයන නිෂ්පාදනය සඳහා ඉඩ තැබෙන්නකි.
4. එවගේම මෙය නියාමනය කෙරෙන වෙළඳපලකි. නිරන්තර නිරීක්ෂණයක් සමග ආනයන පාලනයක්ද පවත්වා ගන්නකි.
5. විදේශ ආයෝජන සඳහා දිරි ගැන්වීම් ලබා දෙනු ලබන්නේ ජාතික සංවර්ධන සැළැස්මෙහි ප්‍රමුඛතා අනුවය. ආයෝජක ලාභ රේට්ටු අනුව ඔවුන්ගේ තේරීම් සඳහා නොවේ.

ඊළගට අවධාරණය කළ යුත්තේ ජාතික සංවර්ධන සැළසුම සමග සමාජ කතිකාවකට අනිවාර්යෙන් ඉදිරිපත් විය යුතු,
1. අධ්‍යාපනය, සෞඛ්‍ය, පොදු මගී ප්‍රවාහනය, ජාතික නිවාස, පරිසරය සහ ශ්‍රම බලය සඳහාවන ජාතික ප්‍රතිපත්තිය ඉදිරිපත් කෙරෙන ධවල පත්‍රිකා සහ
2. මාධ්‍ය ආයතනද ඇතුළත් රාජ්‍ය ව්‍යාපාර දේශපාලන අධිකාරයෙන් මුදවා ස්වාධීන කලමනාකාරිත්වයකට නතු කිරීමේ ජාතික ප්‍රතිපත්තිය,
සමාජගත කිරීමෙන් පසු නිත්‍යානුකුල කිරීමය.

මේ පුළුල් ආර්ථික රාමුව සඳහාවන ජාතික සංවර්ධන සැළසුම ක්‍රියාවට නැගීමේදී, පළාත් බද සහ ප්‍රාදේශීය ජන සහභාගි ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහ ව්‍යවස්ථානුකූලව ස්ථාපිත කිරීම අත්‍යාවශ්‍ය වන්නකි. ජන සහභාගි ප්‍රජාතන්ත්‍රවාදය යැයි අදහස් කරන ප්‍රජාතන්ත්‍රවාදය අප අත්දකින අසාර්ථක දූෂිත නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයට ඉඳුරා වෙනස් සක්‍රීය ප්‍රජාතන්ත්‍රවාදයකි.

කෙටියෙන් කිවහොත් නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය විසින් මැතිවරණ පැවැත්වීමෙන් පත් කෙරෙන පාර්ලිමේන්තුව, පළාත් සභා සහ පළාත් පාලන ආයතන කිසිවක් ඒවා පත් කෙරුණු පසු, පත් කළ ජනතාවට වග කියන්නේ නැත. එය අපි අත් දැකීමෙන්ම දනිමු. තෝරා පත් කෙරෙන පක්ෂයවත් ඔවුන්ව නියෝජනය කරන්නේ

නැත. ''ජනතාවට සේවය කරන්න'' යැයි කියමින් පක්ෂ මාරු කරන, ආණ්ඩුවේ මැති ඇමතිකම් ලබන්නට එළිවන යාමයේ වැට පනින මන්ත්‍රීවරුන් පසුගිය දසක දෙක තුනක කිසි අඩුවක් නොවුනි. එවැනි මන්ත්‍රීවරුන් හවුල් වී පාර්ලිමේන්තුවේ සම්මත කරන්නේ ඡන්දය ගැනීමට පොරොන්දුවූ ප්‍රජාතන්ත්‍රවාදය සහමුලින් අහෝසි කරන, ජාවාරම්කාර ප්‍රජාතන්ත්‍රවාදය සඳහාවන අණ පනත්ය.

සංකල්පයම වශයෙන් ''ජනතා සහභාගී ප්‍රජාතන්ත්‍රවාදය'' ඊට හාත්පසින් වෙනසි. දැනට අප පළාත් සභා සහ පළාත් පාලන ආයතන වලට සීමාවී ඒ ගැන කතා කළහොත්,

i. ජනතා ඡන්දයෙන් පත් කළ පසු එකී ආයතනවල බලයට පත්වන දේශපාලන කණ්ඩායම දිවුරුම් දීමෙන් පසු ඔවුන්ගේ සමස්ථ ධූර කාලය සඳහාවන සංවර්ධන සැළසුම සහ ඒ සඳහාවන සමස්ථ වියදම නිශ්චිත කෙටි කාලයක් තුල සවිස්තරව ප්‍රසිද්ධ කළ යුතු අතර, ඒ වෙනුවෙන් ජනතා ප්‍රතිචාර ලබා ගැනීමෙන් පසු අවශ්‍ය පරිදි කෙරෙන සංශෝධන සමගින් සැළසුම හා අයවැය අදාල පළාත් සබා බල ප්‍රදේශයෙහි පවත්වනු ලබන ජනමත විචාරණයකින් අනුමත කෙරුණහොත් පමණක් සභා සම්මත කරගත යුතුය.

ii. අනතුරුව අර්ධ වාර්ෂික ප්‍රගතිය සම්බන්ධ වාර්තා ප්‍රසිද්ධ කළ යුතු අතර, ඒ වෙනුවෙන් ජනතාවට අදහස් දැක්වීමේ නිල සභා රැස්වීමක් පැවැත් විය යුතුය.

iii. වාර්ෂික අයවැයද සභාව විසින් නිල වශයෙන් සම්මත කිරීමට පෙර ජනතා ප්‍රතිචාර වෙනුවෙන් ප්‍රසිද්ධ කළ යුතුය.

පළාත් පාලන ආයතන වෙනුවෙන්ද එවැනිම ජනතා සහභාගී ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහ ව්‍යවස්ථානුකූලව ස්ථාපිත කළ යුතුය. එසේ විය යුත්තේ සම්මත කෙරෙන සංවර්ධන සැළසුමෙහි පළාත් බද කාර්ය නියාමනය කිරීමේ වගකීම පළාත් බද ජනතාවගේ අයිතියක් වන හෙයිනි.

ජන සහභාගී ප්‍රජාතන්ත්‍රවාදයක ඇති වැදගත්කම වන්නේ අප දන්නා නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයෙහි ඇති දොස් නිවැරදි කිරීමට යැයි යෝජනා කෙරෙන ''නියෝජිතයින් නැවත කැඳවීමේ'' ඡන්දදායක අයිතිය, තව දුරටත් අවශ්‍ය නොවීමෙහිය.

## ආ. ලක් වැසියනට ''ප්‍රජාතන්ත්‍රවාදය'' දැරිය හැකිද?

මෙය ඇත්ත ප්‍රශ්නයකි.

ඒ ප්‍රශ්නයට මගේ උත්තරය නම්, පැහැදිලිවම නොහැකිය යන්නය.

මේ සමාජයට සක්‍රීය ප්‍රජාතන්ත්‍රවාදී පැවැත්මක් දරා ගැනීමට තරම් දැනුවත් දේශපාලන පරිනතභාවයක් පරිචයක් නැත. අප ඉන්නේ හිස් පටිපාටිමය (Procedural) ප්‍රජාතන්ත්‍රවාදයක් සමගය. එහි ජනතාවට ඇති එකම කාර්ය කාට හෝ ඡන්දය ලබාදී තම නියෝජිතයින් යැයි පාර්ලිමේන්තුවට, පළාත් සභාවට හෝ පළාත් පාලන ආයතන වලට මන්ත්‍රීවරුන් පත් කිරීම පමණි. එහි ඇති වැදගත්කමක් නොවුනාට, මැතිවරණ පැවැත්වීම ප්‍රජාතන්ත්‍රවාදය යැයි සමාජයට ඒත්තු ගන්වන දේශපාලන පක්ෂ හා විදේශ අරමුදල් මත ''නිදහස් සාධාරණ මැතිවරණ'' ගැන කතා කරන කොළඹ මැදපංතික සමාජ ක්‍රියාකාරීන් ජන සමාජයේ ප්‍රජාතන්ත්‍රවාදී වගකීම් ගැන කතා කරන්නේ නැත. ප්‍රජාතන්ත්‍රවාදී වගකීම් නොදන්නා මේ සමාජයේ ඇණකොටා නොගන්නා නිදහස් සාධාරණ මැතිවරණ වලින් කෙරෙන්නේ වර්තමානයේ පත් කෙරෙන වර්ගයේ ඇණකොටා ගන්නා පාර්ලිමේන්තු පළාත් සභා හා පළාත් පාලන ආයතන පත්කර ගැනීම පමණි.

රාජ්‍ය ප්‍රජාතන්ත්‍රීය කිරීමට නම් සක්‍රීය ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායන් හා ජන සමාජයේ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයන් රැක ගැනීමේ පූර්ණ වගකීම දරන්නාවූ රටවැසියන් බහුතරයක් සිටිය යුතුය. එනිසා මේ මොහොතේ ඒ කාර්යටද උර දිය යුතු හෙයින් අපි ඒ කතාවත් කෙටියෙන් හෝ මෙහි ආරම්භ කරමු.

මේ රටේ ජනතාව 1931 සිට පරම්පරා ගණනාවක්ම වසර 92 ක් පුරා සර්වජන ඡන්දය භාවිත කර ඇත. ඡන්දය භාවිත කිරීමේ ප්‍රතිශතයද බෙහෙවින් ඉහළය. අපගේ දේශපාලන පක්ෂ කුමක් කතා කළද, ඡන්ද භාවිතය පාර්ලිමේන්තු හා ජනාධිපතිවරණය යැයි එතරම් වෙනසක් නැත. සාමාන්‍යයෙන් එය සියයට 73 ක් පමණි.

මේ වනවිට මේ රටේ ආණ්ඩු පත් කිරීමට, ජනාධිපතිවරුන් පත් කිරීමට, පළාත් සභා සහ පළාත් පාලන ආයතන පත් කරන්නට ඡන්දය ප්‍රකාශ කළ අවස්ථා ගණන, කොතෙක්දැයි නොදනිමි.

එහෙත් තවමත් ඡන්දය ප්‍රකාශ කරන්නේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් වැදගත් සංවර්ධන සැළසුමක් ඇති පක්ෂයක් ආණ්ඩු බලයට පත්කර ගැනීමට නොවේ. එවැනි දේශපාලන චුවමනාවක, සමාජ වගකීමක සේයාවක් හෝ මේ සමාජයේ තවමත් නැත. එවැන්නක් වෙනුවෙන් කිසිදු දේශපාලන පක්ෂයක් සමාජය සමග කරන වැදගත් ගනුදෙනුවක්ද නැත. විපක්ෂයේ ඉන්නා විට දේශපාලන පක්ෂ ගණන් හදන්නේ තම වාසියට ආණ්ඩු විරෝධයක් වගා කර ගන්නේ කෙසේදැයි කියා පමණය.

එසේ නම්, ආණ්ඩු මාරු වන්නේ කෙසේද? එයට උත්තරය මේ සමාජයද හොඳින් දන්නාහ. මෙහි තවමත් කෙරෙන්නේ ''පැත්ත මාරු කරන එක'' යැයි ජනතාව දොස් කියන්නේ ඔවුන්ම පැති මාරු කිරීම වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කරමින්ය. සරළව කතාව, මේ රටේ ආණ්ඩු මාරු කෙරෙන්නේ අලුත් ආණ්ඩුවක් තෝරා ගැනීමේ දැනුවත් ඡන්ද භාවිතයකින් නොවේ. ආණ්ඩු මාරු කෙරෙන්නේ පැවති ආණ්ඩුවට එරෙහිව ප්‍රකාශ කෙරෙන ''විරෝධතා'' ඡන්දයකින් ය. ඒ විරෝධතාවයේද තර්කයක් ඇත්තේ නැත. සමාජයක් වශයෙන් තමන්ගේ ජීවන ප්‍රශ්න විසඳා ගැනීම සඳහා ආණ්ඩුවක් තෝරා පත් නොකරන ඡන්දදායකයා වසරක් දෙකක් යනවිට ආණ්ඩුව සමග උරණ වන්නේ තමුන්ගේ දෛනික ගැටළු වලට ඒ ආණ්ඩුවෙන් විසඳුම් නොලැබෙන්නේ යැයි කියමින්ය. එහෙත් ජනතා ප්‍රශ්න සඳහා විසඳුම් තිබේදැයි නොඇසූ හා ඇසුවත් විසඳුම් නොමැති, ප්‍රශ්න විසඳීම වෙනුවෙන් පත් නොකළ ආණ්ඩුවක් සමග ඇති කරගන්නා වෛරය, ඊළග මැතිවරණයේදී මේ ඡන්දදායකයා විරෝධතා ඡන්දයක් ලෙස ප්‍රකාශ කරන්නේ ය.

ජනතාව ඡන්දය ප්‍රකාශ කරන්නේ කවර කාරණා සඳහාදැයි අප මඳක් විමසිය යුතුය. සර්වජන ඡන්දය ලබා දීමට ඩොනොමෝර් කොමිස 1931 දී තීන්දු කළ හේතු දක්වන්නේ, ප්‍රභූ සමාජයේ ඇතැම් කොටස් ලංකාවට ස්වයං පාලනයක් ඉල්ලා සිටියත් දේශපාලන පක්ෂ නොමැති ලාංකීය සමාජය පුද්ගලයින් අනුව ඡන්දය දීමේදී කුලය, ජාතිය, ආගම අනුව ඡන්ද ප්‍රකාශ කිරීමෙන් බහුතර වාර්ගිකයින්ට, ආගමිකයින්ට ආණ්ඩු පාලනය ලැබෙන විට සුළුතර ජනතාවට අවාසි විය හැකි හෙයින් ඊට පළමුව තමන් සඳහා වැදගත් පාලනයක් පත්කර ගැනීමේ අවබෝධය අත්දැකීම ලබන්නට සර්වජන ඡන්ද අයිතිය ලබා දුන් බවය.

අවබෝධය අත්දැකීම් ලැබීමේ ඒ කතාවට අවසානයක් නැත. වැදගත් ආණ්ඩු පාලනයක් පත්කර ගැනීමේ අවබෝධය අත්දැකීම

නොලබා නිදහසින් පසු අවුරුදු 75 පුරාවටත් තවමත් මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීමට උතුරේත් දකුණේත් ඡන්දය භාවිත කෙරෙන්නේ කුලය, ජාතිය, ආගමද එක් ප්‍රධාන සාධකයක් වශයෙන් තබා ගැනීමෙනි. එවැනි තේරීම් සමග රාජ්‍ය මන්ත්‍රණ සභාවට තරග වැදි දේශපාලන නායකයින් විසින් නිදහස් ලංකාව සඳහා පැවති 1947 පළමු පාර්ලිමේන්තු මැතිවරණය වෙනුවෙන් දේශපාලන සංවිධාන ගොනුකර ගත්තේද ඔවුන්ගේ වැඩවසම්වාදී ඇබ්බැහිවීම් සමගින්ය.

ඒ වනවිට පංතිමය ප්‍රකාශනයක් සහිත දාර්ශනික දේශපාලනයක් වෙනුවෙන් ඉදිරිපත්ව සිටි සමසමාජ පක්ෂයටද පාර්ලිමේන්තු මැතිවරණ සඳහා දිනන්නට හැකි අපේක්ෂකයින් තෝරා ඉදිරිපත් කරන්නට සිදුවූයෙන් ඔවුහුද කුලය, ආගම සඳහා ඉඩක් තැබූහ. මොරටුවේ සිට අම්බලන්ගොඩ දක්වා සමසමාජයෙන් පමණක් නොව වෙනත් කුමන පක්ෂයකින් මන්ත්‍රීවරුන් තේරී පත් වූවත් එසේ තේරී පත් වන්නේ මැතිවරණ ආසනයේ බහුතර කුලය හා ආගමට අනුවය. එයට හේතුව, ආසනයේ බහුතර ජන සංයුතියට ගැලපෙන අයුරු සෑම දේශපාලන පක්ෂයක්ම අපේක්ෂකයින් තේරීමය. අනෙක් මැතිවරණ ආසන සඳහාද අපේක්ෂකයින් තෝරනු ලැබුවේ එළෙසින්මය.

ජයවර්ධන ජනාධිපති විසින් විවෘත වෙළඳපල ආර්ථිකය වෙනුවෙන් මැතිවරණ ක්‍රමයෙහි සිදු කළ වෙනස්කම් සමග අනුපාත ක්‍රමයට මන්ත්‍රීවරුන් තේරීමේ ඡන්ද කොට්ඨාශය දිස්ත්‍රික්කය කළ පසු මේ වැඩවසම් ගොනුවීම් තව තහවුරු විය. දිස්ත්‍රික්කයෙහි ආසන කිහිපයක විසිර සිටින සුළුතර කුල නියෝජනයන්ටද ප්‍රධාන පක්ෂයක අපේක්ෂක ලැයිස්තුවට ඔවුන්ගේ සියලු මනාප එකතු කර මන්ත්‍රීවරයෙකු පත්කර ගැනීමේ හැකියාවක් ලැබිණ. එනිසා තවමත් නාමයෝජනා සඳහා අපේක්ෂක ලැයිස්තු සකස් කිරීමේදී ඒ ඒ දිස්ත්‍රික්කවල සුළුතර කුල අතරින් සැළකිය යුතු ඡන්ද සංඛ්‍යාවක් ලබාගත හැකි යැයි අනුමාන කෙරෙන කුල නියෝජනයක් ඇතුළු කෙරෙන්නේය. ගාල්ලේ සලාගම හා කරාව, මාතර දුරාව, කොළඹ දුරාව හා කරාව, මහනුවර සහ කෑගල්ල බත්ගම, රත්නපු වහුංපුර එවැනි දිස්ත්‍රික්ක කිහිපයකි.

විවෘත වෙළඳපල ආර්ථිකයෙහි දූෂිත දේශපාලනය සමග කුල හා ආගමික පදනමින් පසු ඡන්දය දීමේ ඉතිරි සාධක වන්නේ හුදෙක්ම පෞද්ගලික අභිලාෂයන් ය. මේ විවෘත වෙළඳපලෙහි තමන්ගේ වුවමනාවන් ඉෂ්ට කර ගන්නට හතිලමින් තරග වදින

පාරිභෝගිකයෙකු බවට නාගරික හා අර්ධ නාගරික ඡන්දදායකයා පත් කර ඇති හෙයින් තම දේශපාලන තේරීමෙන් පසු මනාප ඡන්දය වෙනුවෙන් පුද්ගල අපේක්ෂකයින් තේරීමේදී ඔහු හා ඇය සොයන්නේ වැලි පර්මිට්, බාර් පර්මිට්, ඉඩම් පර්මිට්, දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් කොන්තරාත් වැනි නිසි හෝ අනිසි ක්‍රම මගින් හෝ ආදායම් ඉපැයීමේ අවස්ථා ය. ඒ අතර තම කලත්‍රයාට හෝ දරුවන්ට රජයේ පත්වීම් ලබා ගැනීමත් තමන්ට හෝ පවුලේ කිසිවකුට උසස්වීම් ලබා ගැනීමත් ඇත.

කොළඹ හා මහ නගර කිහිපයේ විද්වතුන්, ඇදුරන් හා උගතුන්ද කුල තේරීම් අතහැර නැත. ඔවුන්ගේ වෙනස ඇත්තේ ඔවුන් වැලි පර්මිට්, බාර් පර්මිට්, ඉඩම් පර්මිට් වැනි සෘජු ආර්ථික ලාභ ගැන තවමත් එතරම් උනන්දු නොවීමෙහිය. ඔවුන් මනාප තේරීමේදී ප්‍රමුඛතා හදා ගන්නේ ඔවුන්ට සංස්ථා අධ්‍යක්ෂ ධූර, සභාපති ධූර, විදෙස් තානාපති සේවා පත්වීම්, උපදේශන කාර්ය වැනි ඉහළ පෙළ අවස්ථා ලබා ගත හැකි සම්බන්ධතාවන් ය.

අවසාන වශයෙන් කියන්නට ඇත්තේ මේ කිසිවකු ඡන්දදායකයින් වශයෙන් අනාගතය ගැන සිතා වැදගත් ඉදිරි ගමනක් වෙනුවෙන් ආණ්ඩු පත් කරන්නේ නැති බවය. ඔවුන්ට ''ඡන්දය'' යනු පෞද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා කේවල් කෙරෙන මෙවලමක් පමණි. එබැවින් මේ සමාජයේ උගත් නූගත් භේදයක් නැතිව සියලු ඡන්දදායකයින් සමාජ වගකීමක් ඇතිව ඡන්දය භාවිත කරන්නෝ නොවෙති.

එවැනි රටවැසියන්ගේ ආත්මාර්ථකාමී සමාජයක, ජාවාරම්කාර දූෂිත විවෘත වෙළඳපල ආර්ථිකයක පිරිහෙමින් ඇති සිංහල-බෞද්ධ රාජ්‍යයක් හා ප්‍රජාතන්ත්‍රවාදයක් නොදන්නා ජාතිවාදී දේශපාලන පක්ෂ සමග කවර මැතිවරණයක් පැවැත් වූවත් අනාගතය වෙනුවෙන් ආණ්ඩු හදන්නට නොහැකිය. එබැවින් මෙතැන් සිට අපට ගමන් කළ හැක්කේ ඒ සියල්ල සුද්ද පවිත්‍ර කර ගැනීමේ දුර දිග යන ප්‍රතිසංස්කරණ සඳහාවන සමාජ ව්‍යාපාරයක් වෙනුවෙන් කෙරෙන සමාජ මැදිහත්වීමක් සමගින් පමණය.

එයට පිවිසුමක් ලෙස මෙහි ඉදිරිපත් කෙරෙන්නේ,

01. විනාශ වූ ආර්ථිකය, සමාජ සාර ධර්ම, විනය, සාමය සහ බහුත්වවාදී සමාජ පැවැත්ම නැවත ගොඩ නගා ගැනීමට,
02. අනාගත ගමන වෙනුවෙන් ''සංවර්ධනය'' යනු කවරක්දැයි නිර්වචනය කිරීම හා ඒ වෙනුවෙන් පොදු සමාජ එකඟතාවක් ලබා ගැනීමට,

03. ඉදිරි සංවර්ධනය වෙනුවෙන් දේශපාලන පක්ෂද ඉලක්ක කෙරෙන ප්‍රජාතන්ත්‍රවාදී සමාජ ව්‍යුහ ශක්තිමත් කිරීම සඳහා සක්‍රීය සහභාගි ප්‍රජාතන්ත්‍රවාදයක් වෙත මාරුවීමකට,
04. නිෂ්පාදන ආර්ථිකයක් වශයෙන් ග්‍රාමීය ආර්ථිකයද ඇතුළත් ජාතික ආර්ථිකයෙහි ආදායම් හා වත්කම් බෙදී යාමේ විෂමතා තුනී කෙරෙන සැළසුම් සමග සැමට සමාන අවස්ථා හා පහසුකම් තහවුරු කෙරෙන සංවර්ධන ප්‍රවේශයක් හැදීමට සහ
05. ආර්ථික ප්‍රතිපත්තිය සමග අධ්‍යාපන, සෞඛ්‍ය, පොදු මගී ප්‍රවාහනය, නිවාස සහ ශ්‍රම බලය වෙනුවෙන් ජාතික ප්‍රතිපත්ති සමාජ කතිකා ඔස්සේ සකස් කිරීමටය.

## ප්‍රතිසංස්කරණ ගැන ඉතාම කෙටියෙන්

ජන සහභාගි ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව කතාව ඇත්තේ පළාත් හා ප්‍රාදේශීය බද සංවර්ධනයත් ඒ සඳහා අවශ්‍ය රාජ්‍ය පරිපාලනයත් ඒ අදාල පළාත්වල ජනතාවට බාරදීම සඳහා වන නව ව්‍යුහ සකස් කිරීම හා ඒ වෙනුවෙන් ව්‍යවස්ථාමය අවකාශ සැපයීම ගැන කතාවකි. එය 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පළාත් සභා සඳහා වෙන් කරනු ලැබූ සංවර්ධන කාර්යන් සඳහා ජනතා මැදිහත්වීමකට ඉඩ තැබෙන්නක් ලෙස සරළව අර්ථ දැක්විය හැකිය.

එවැනි ජනතා පාලනයකට යෝධ පාර්ලිමේන්තු අවශ්‍ය නැත. ඒ සඳහා ඉන්දියාවේ හර්යානා ප්‍රාන්ත පාලනය වැදගත් නිදසුනකි. එහි ජනගහනය මිලියන 27 කි. ඒ මිලියන 27 ක ජනතාවගේ සංවර්ධන හා දෛනික කාර්යන් සතු වගකීම් පැවරෙන ප්‍රාන්ත ආණ්ඩු පාලනයට ඔවුන් තෝරා පත්කර ගන්නේ ප්‍රාන්ත මන්ත්‍රීවරුන් 95 කි. අපගේ බස්නාහිර පළාතේ මිලියන 5.8 ක් වෙනුවෙන් අපි මන්ත්‍රීවරුන් 104 ක් පත්කර ගන්නෙමු. හර්යානා ප්‍රාන්තයේ සංවර්ධන කාර්යන් ප්‍රාන්ත ආණ්ඩුවෙන් කෙරෙන හෙයින් ඔවුන්ගේ ජාතික අවශ්‍යතා නියෝජනය වෙනුවෙන් ඔවුන් ලොක් සභාවට තෝරා පත් කරන්නේ මන්ත්‍රීවරුන් 10 කි. අපි මිලියන 22 ක් වෙනුවෙන් මන්ත්‍රීවරුන් 225 ක පාර්ලිමේන්තුවක් නඩත්තු කරන්නෙමු.

අපගේ නියෝජන සභා සියල්ල විශාල නියෝජිත ආයතන ලෙස අපි නඩත්තු කරන්නෙමු. පළාත්බද ජන සහභාගි

ප්‍රජාතන්ත්‍රවාදයක් සමග පාර්ලිමේන්තු නියෝජනය උපරිම 165 ක සීමාවක තැබිය යුතු අතර පළාත් සභා සහ පළාත් පාලන නියෝජනද සියයට 50 කින් කපා හැරිය යුතුය.

සමාජයේ සංස්කෘතික විවිධත්වය අගය කෙරෙන හා එය ගෞරවනීය ලෙස පිළිගන්නා සමාජයක් හැදීම වෙනුවෙන් අධ්‍යාපනය සකස් විය යුතුය. අධ්‍යාපනය නිදහස් විය යුත්තේ වියදම් දැරීමට නොහැකි දෙමාපියන්ගේ දරුවන් වෙනුවෙනි. ජාතික අධ්‍යාපනය ආණ්ඩුවේ වගකීමක් විය යුතු අතර, සියලු දරුවන්ට සමාන පහසුකම් හා සමාන අවස්ථා සහතික විය යුතුය. ඒ වෙනුවෙන් පාසල් අතර පහසුකම් සම්බන්ධයෙන් ඇති අතිශය විශාල පරතරය ක්‍රමානුකූලව තුනී කළ යුතුය.

සෞඛ්‍ය සේවාවේ අරමුණ විය යුත්තේ ඉහළ යන රෝගීන් සංඛ්‍යා සඳහා රෝහල් සහ වෛද්‍යවරුන් වැඩි වැඩියෙන් සැපයීම නොව, රෝගීන් සංඛ්‍යාව අඩු කෙරෙන ප්‍රජා සෞඛ්‍ය සේවය ශක්තිමත් කිරීමය. කෙටියෙන් කියන්නේ නම් අපගේ මූලික අවධානය විය යුත්තේ ප්‍රජා මට්ටමේ රෝග නිවාරණය මිස ප්‍රතිකාර සේවා නොවේ.

කාර්යක්ෂම හා සුව පහසු පොදු මගී ප්‍රවාහන සේවාවක් රටකට අත්‍යාවශ්‍ය වන්නකි. එය සේවක සේවිකාවන්ට තම දෛනික සේවා ඉටු කිරීමේ මෙන්ම රටක නිෂ්පාදන ක්‍රියාවලියටද අත්‍යාවශ්‍ය සේවාවකි. එවගේම එය ජාතික ආර්ථිකයට ඉමහත් ලෙස වැදගත් වන්නේ ඉන්ධන භාවිතය පලදායි ලෙස අවම කිරීමෙන් සහ තරගකාරී වාහන ආනයනයද සීමා කරමින් විදේශ විනිමය ඉතිරි කරන්නට හේතුවන බැවිනි.

රටක නිෂ්පාදන ක්‍රියාවලිය හා සේවා සැපයුම බෙහෙවින් තීන්දු වන්නේ සේවක සේවිකාවන් ඔවුන්ගේ රැකියාවෙහි කෙතරම් තෘප්තිමත් වන්නේද යන්න අනුවය. එය ඔවුන්ගේ ප්‍රශ්නයක්ම නොව, රටේම ප්‍රශ්නයකි. ඒ වෙනුවෙන් සේවක අයිතිවාසිකම් පූර්ණ ලෙස සහතික කෙරෙන සහ ජාතික ප්‍රතිපත්තීන් තීන්දු කිරීමේදී වෘත්තිය සමිති සමග පවත්වා ගන්නා සම්මුතිවාදී ප්‍රවේශයක අවශ්‍යතාව වෙනුවෙන් ජාතික ප්‍රතිපත්තියක් අවශ්‍ය වන්නේය.

**දියුණු ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් හදා ගැනීමට දැරිය යුතු පිරිවැයක් ඇත. එය සමාජ පිරිවැයකි. මේ යෝජනා කරන්නේ ඒ සඳහා අලුත් දැනුම, අලුත් ප්‍රවේශ සහ විකල්ප සැළසුම් එකතු කරමින් අපේම වූ අලුත් ජාතික සංවර්ධන මාදිලියක් සමාජගත කිරීමට සියලු පාර්ශව හවුල් වන්නාවූ ජනතා ව්‍යාපාරයක් ගොනු කිරීමේ අත්හල නොහැකි වගකීම බාර ගන්නා ලෙසය.**

## මෙය අමතර කියවීමකි

ඉකුත් මැයි මස 23 වන දින රාජ්‍ය ව්‍යාපාර පෞද්ගලීකරණය සම්බන්ධව විශේෂ අවධානයක් ඇතිව මෙම ලිපිය ලියුවේ ජා.මූ.අරමුදලේ ඇති පෞද්ගලීකරණය සඳහා ආණ්ඩුවට අවකාශ ලබා දෙන කොන්දේසි වන, වියදමට සරිළන අයුරු මිල තීන්දු කිරීමත් රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංවිධානය කිරීමත් සමග ඉකුත් මාර්තු 23 වන දින ජනාධිපති වික්‍රමසිංහ මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ප්‍රධානීන් හා මාධ්‍යවේදීන් හමුවූ අවස්ථාවේ පෞද්ගලීකරණය ගැන කියූ වැරදි අර්ථ ගැන්වීම්ද ප්‍රශ්න කළ යුතු වූයෙනි. ඒ සමගම, ජා.මූ.අරමුදලේ කතා නොවන පසුතල කතාවද දැන සිටීම, මේ වැනි කාරණා වලදී බොහෝ විට වැදගත්වන බැව් මට සිතෙන හෙයිනි.
කුසල්

### වොෂිංටනයේ සිට කොළඹ දක්වා උදව්වට එන හැමෝම ''ඩීල් පප්පො''

*එවකට ප්‍රංශ ජනාධිපති නිකොලොස් සර්කෝසිගේ ව්‍යාපාරික හිතවතෙකුට යූරෝ මිලියන 400 ක වන්දි මුදලක් ගෙවීම අනුමත කිරීම සම්බන්ධයෙන් සර්කෝසි ආණ්ඩුවේ මුදල් ඇමතිනිය වූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රධානී ක්‍රිස්ටීන් ලගාඩ් නොසැළකිලිමත් තීන්දුවකට වගකිව යුතුයැයි 2016 දෙසැම්බර 16 වන දින ප්‍රංශයේ විශේෂ අධිකරණයක් වන ''සමූහාණ්ඩුවේ සාධාරණත්වය සඳහාවන අධිකරණය'' විසින් තීන්දු කළේය. එම තීන්දුව මතභේදාත්මක තීන්දුවක් වූයේ, ඇයගේ තනතුර නිසා නොවේ. එකී විශේෂ අධිකරණයට ඇයව යූරෝ 13,000 ක දඩයක් සමග වසරක සිර දඬුවමකට යටත් කළ හැකිව තිබියදී, එසේ නොකර ඇයව නිදහස් කිරීම හේතුවෙනි. එසේ ඇය නිදහස් කිරීම*

*සාධාරණය කෙරුණේ ඇයට පෙර සිටි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රධානියාවූ ඩොමිනික් ස්ට්‍රවුස්-කාන් 2011 දී බරපතල ලිංගික අතවර චෝදනාවක් හමුවේ ඉල්ලා අස්වූ හෙයින් ඒ ආසන්නයේ ඇයව වරදකරු කිරීමෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නායකත්ව අර්බුදයකට එය හේතුවිය හැකි යැයි කෙරුණු අනුමානය සමගය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඊට පෙර සිටි තවත් ප්‍රධානියෙකුවන රොඩ්රිගො රාටෝ ස්පාඤ්ඤ බැංකුවක ප්‍රධානියා වශයෙන් කටයුතු කළ අවධියේ එහි අරමුදල් අවභාවිත කිරීම සම්බන්ධයෙන් වන නඩුවක ඔහු ප්‍රධාන චූදිතයෙකු විය.*
(බ්‍රිතාන්‍යයේ ''ඉන්ඩිපෙන්ඩන්ට්'' සහ ''බීබීසි'' පුවත් ඇසුරෙනි)

මහ භාණ්ඩාගාරයෙන් අපගේ මාධ්‍යයට ලබා දුන් තොරතුරු අනුව, ''ප්‍රතිව්‍යුහගත කිරීමට'' නියමිත රාජ්‍ය ව්‍යාපාර 430 ක් පමණ ඇත. ඒවායෙන් ඉකුත් අවුරුද්දේ වැඩියෙන්ම ණය වුනු රාජ්‍ය ව්‍යාපාර 22 ට අයත් වූ ව්‍යාපාර අතර ඉහළින්ම සඳහන්ව තිබූයේ ඛනිජ තෙල් සහ විදුලිබල සංස්ථාවන් ය. ජල සම්පාදන මණ්ඩලයත් ඒවාට අමතරව තිබිණ. මෙම ප්‍රතිව්‍යුහගත කිරීමට මෙතෙක් ලාභ ලැබූ බහුතර කොටස් රජයට හිමි ශ්‍රී ලංකා ටෙලිකොම් වැනි පෞද්ගලික ව්‍යාපාරද ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වැනි රාජ්‍ය ව්‍යාපාරද ඇතුළත්ව තිබේ.

මේ ''ප්‍රතිව්‍යුහගත කිරීම'' මගින් ඩොලර බිලියන 04.5 ක ආදායමක් ආණ්ඩුව අපේක්ෂා කරන බවට ප්‍රවෘත්ති තිබිණ. වික්‍රමසිංහ ආණ්ඩුව ප්‍රතිව්‍යුහගත කිරීම යැයි කියන්නේ කුමකටදැයි ඉන් පැහැදිලිය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පිහිට ඇතිව ඔවුන් ප්‍රතිව්‍යුහගත කිරීම යන්නට ''විකුණා දැමීම'' යැයි අලුත් අර්ථයක් ලබා දී ඇත.

ආණ්ඩුවේ එම තීන්දුව ඉකුත් මාර්තු 23 වන දින මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ප්‍රධානීන් හා මාධ්‍යවේදීන් අමතා ජනාධිපති වික්‍රමසිංහ නැගූ තර්කයෙන් සනාථ වන්නේය. පාඩු ලබන ආයතන වලට අමතරව, ලාභ ලබන ආයතනත් අලෙවි කරන්නේ මන්දැයි මාධ්‍යවේදිනියක් එදින නැගූ ප්‍රශ්නයට ඉතා දැඩි ස්වරයෙන් ජනාධිපති වික්‍රමසිංහ පිළිතුරු දුන්නේ ''රජය බිස්නස් කරන්නේ මොනවටද?.... මොන රටේද ඒවට නීති තියෙන්නේ? ඉන්දියාව ලාභ ලබන ගුවන් තොටුපළවල් පවා විකුණනවා. අපි පාඩු ලබන ඛනිජ තෙල් සහ විදුලිබල මණ්ඩලයට අධ්‍යාපනයට වඩා ගෙවලා තියෙනවා..... එංගලන්තයේ ටෙලිකොම් අයිති කාටද? ප්‍රංශයේ කාටද? ඇමෙරිකාවේ?........එහෙමයි අපි දියුණු වෙන්න ඕනෙ. එහෙම නැත්තං....උතුරු කොරියාව වගේ වැටෙන්න වෙයි'' කියා ය.

ආරම්භයේදීම කිව යුත්තේ රජයෙන් කළ යුත්තේ ''බිස්නස්'' නොවන බවය. රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ ගැටුම හදා ගන්නේම ඒවා පෞද්ගලික ව්‍යාපාර මෙන් අනිවාර්යෙන් ලාභ ලැබිය යුතු ''බිස්නස්'' ව්‍යාපාර යැයි තීන්දු කිරීමෙනි. රජය විසින් පවත්වා ගන්නේ සමාජයට අනිවාර්යවන අත්‍යාවශ්‍ය සේවාවන් ය. දූෂණ වංචා වලින් තොරව සැපයෙන සේවා වෙනුවෙන් යම් බදු මුදලක් වෙන් කිරීමට ආණ්ඩුවට සිදුවන්නේ නම්, එය කළ යුතුය. එවැනි ආයතන විසින් සැපයෙන සේවාවන් අත්‍යාවශ්‍ය සේවා ලෙස සැළකීමේදී ඒවායේ ලාභ-පාඩු ගණන් හැදිය යුත්තේ පෞද්ගලික ව්‍යාපාරවල ගණන් හැදීමේ ක්‍රමයට නොවේ. එවැනි රාජ්‍ය ව්‍යාපාර වෙතින් සමාජයට ලැබෙන සේවා ප්‍රතිලාභ  සඳහාද වටිනාකමක් ලබා දීම සමගින්ය.

බලශක්ති, පොදු ප්‍රවාහනය, සෞඛ්‍ය සහ අධ්‍යාපනය මූලික වශයෙන් රජය විසින් සුහසාධන සේවා ලෙස පවත්වා ගත යුතු සේවාවන්ය. ආණ්ඩුවක අසම්මුතික වගකීම වන්නේ, ඒවා සාමාන්‍ය ජනතාවට පහසුවෙන් ලබාගත හැකි මිලකට, කාර්යක්ෂම හා හොඳ ප්‍රමිතියකින් ලබා දීමය. එවැන්නක අවශ්‍යතාව ඇත්තේ පලදායි නිෂ්පාදන ක්‍රියාවලියක් පවත්වා ගත හැකි සමාජයක් සඳහාය. රටේ නිෂ්පාදන වියදම ගෝලීය වෙළඳපලෙහි තරගකාරීව පවත්වා ගැනීම සඳහාත් ය. ජාවාරම්කාර ව්‍යාපාරිකයින්ට අත්‍යාවශ්‍ය සේවා විකිණීමෙන් ජනතාවට ඔරොත්තු දිය හැකි මිලකට හා ගෝලීය වශයෙන් තරගකාරී නිෂ්පාදන වියදමක් පවත්වා ගැනීමේ සහතිකයක් ලැබෙන්නේ නැත.

අත්‍යාවශ්‍ය සේවාවන් සැපයීමේදී ඒවායෙන් සමාජයට හා ජාතික නිෂ්පාදනය සඳහා ලැබෙන දායකත්වය ගණන් නොබැලීම, ඉතා වැරදි ප්‍රවේශයකි. නිදසුනක් ලෙස කිවහොත්, විදුලිබල මණ්ඩලයේ සියලු දූෂණ, වංචා සහ නාස්තිය ගණන් නොබලා, එම දූෂණ වංචා, නාස්තිය පිටු දැකීමේ කිසිදු පියවරක් නොගෙන, සමස්ථ පාඩුව රුපියල් ශත වලින් පියවා ගැනීමට ඉකුත් අගෝස්තුවෙහි සියයට 60 ට වැඩි ප්‍රමාණයකින් සහ ජනවාරියේ තවත් සියයට 70 කින් විදුලිය ගාස්තු වැඩි කිරීම, පිරිසිදු රාජ්‍ය ආයතනයක සේවාව වෙනුවෙන් මහජන මුදල් වැය කිරීම හා සැසඳිය නොහැකි බරපතල පාපයකි. විදුලිබල මණ්ඩලයේ පාඩු වෙනුවෙන් ගාස්තු වැඩිකර අපනයන නිෂ්පාදන වියදම් අසීමිතව ඉහළ දැමීම නිසා බංගලාදේශය, වියට්නාමය වැනි රටවල නිෂ්පාදන වියදම් හා අපට තරග වදින්නට දැන් අසීරුය. ඉන්ධන ගාස්තුද ඒ සමග වැඩි කිරීමෙන් නිෂ්පාදන වියදම් තවත් වටයකින් ඉහළ ගියේය. වැදගත්

ආයෝජකයින්ගේ පැමිණීම නිෂ්පාදන වියදම මත තීන්දු වන බැව් කාටත් අමතකව ඇත.

රාජ්‍ය ආයතන දූෂිත, නාස්තිකාර තත්ත්වයකට පත් වන්නේ ඒවා හුදෙක් රාජ්‍ය අයිතියට සීමාවන නිසා නොවන බැව් මාධ්‍ය විසින් සාකච්ඡාවට තැබිය යුත්තකි. රාජ්‍ය ආයතන පිහිටවූ දින සිට දසක ගණනාවක්ම ඒවා පාලනය කර ඇත්තේ විෂය භාර ඇමතිවරයාගේ අභිමතය මත මිස, ඒවායේ පැවතිය යුතු දූෂණයෙන් තොර කාර්යක්ෂම කලමනාකරණය සහ සැළසුම් කිරීම් සමග නොවේ. එනිසා උත්තරය ඇත්තේ ඒවා විකුණා දැමීමෙහි නොවේ. උත්තරය ඇත්තේ ඒවා දූෂිත දේශපාලන බලපෑමෙන් ගලවා නිවැරදි සැළසුම් හා කලමනාකරණයක් සමග යළි තහවුරු කිරීමෙහිය. ඒ සඳහා අවශ්‍ය වන්නේ කලමනාකරණ ප්‍රතිසංවිධානයකි. එය මේ දේශපාලනයෙහි කවර පක්ෂයක හෝ ඇමතිවරයෙකු යටතේ කමිටු හැදීමෙන් කළ හැක්කක් හෝ කළ යුත්තක් නොවේ. එය කළ යුත්තේ ජනතාව වෙනුවෙන් පාර්ලිමේන්තුවට වග කියන්නාවූ ස්වාධීන කොමිසමකින් ආරම්භ කරන විවෘත සමාජ සාකච්ඡාවක් හරහා ය.

ඉහතින් සඳහන් කෙරුණු මාර්තු 23 වන දින මාධ්‍ය හමුවේදී ජනාධිපති වික්‍රමසිංහ මාධ්‍යවේදිනියට දෙනු ලැබූ පිළිතුර නූතන ලෝකයේ ''යථාර්ථයට'' සම්බන්ධයක් නැති අසම්පූර්ණ පිළිතුරක් වන්නේ එනිසාවෙනි. වත්මන් යුරෝපයේ රාජ්‍ය ආයතන සඳහාවන අලුත් නැඹුරුවක් දැන් ඇත. ''නැගී එන යුරෝපයේ රාජ්‍ය ව්‍යාපාර - හොඳ, නරක සහ අවලස්සණ'' නමැති 2017 වසරේ ජා.මූ.අරමුදලේ කාර්යසාධන පත්‍රිකාවෙහි (WP/17/221) සඳහන් අයුරු සියලු ක්ෂේත්‍ර ගත් විට, රාජ්‍ය ව්‍යාපාර සතු ආර්ථික පලදාව සියයට 01 සිට 12 දක්වා වන අතර, සමස්ථ රැකියා සංඛ්‍යාව සියයට 0.5 සිට 08 දක්වා වන්නේය. රාජ්‍ය ව්‍යාපාරවල වැඩිම ආර්ථික දායකත්වයක් ඇත්තේ ස්වීඩනයේ, පෝලන්තයේ හා ස්ලෝවේනියාවේ වන අතර, වැඩිම රැකියා සැපයුම ඇත්තේ ස්වීඩනයේ, බල්ගේරියාවේ හා ස්ලෝවේනියාවෙහිය. බලශක්ති ක්ෂේත්‍රය ගත්විට බල්ගේරියාවේ, පෝලන්තයේ, හංගේරියාවේ සහ ස්ලෝවේනියාවෙහි රාජ්‍ය ව්‍යාපාර සියයට 60 ට වැඩි උත්පාදනයක් ලබා දෙති.

යුරෝපීය රටවල අලුතින් වර්ධනයවන රාජ්‍යවාදී ව්‍යාපාර සමග දැකිය හැක්කේ වෙළඳපල තීන්දු කිරීමේ හැකියාව තමන් අත රඳවා ගනිමින් ඔවුන් පෞද්ගලික සමාගම් කිහිපයකටද ඉඩ තබන

බවය. බලශක්ති ක්ෂේත්‍රයෙහි සියයට 60 ක දායකත්වය රජයේ ආයතන මගින් යැයි කීමේ අරුත එය ය.

ඒ සම්බන්ධයෙන් අවධාරණය කළ යුතු කාරණාව වන්නේ ඒවායේ දේශපාලන සංස්කෘතිය සහ සමාජ අවබෝධය හා සම්ප්‍රදායන් විසින් පිරිසිදු, කාර්යක්ෂම රාජ්‍ය ව්‍යාපාර පවත්වා ගැනීමට ඉඩ තබා ඇත යන්න ය. ජනාධිපති වික්‍රමසිංහ එදින මාධ්‍ය හමුවේ කියූ මෝඩි ආණ්ඩුවේ ගුවන් තොටුපල අලෙවිය එවැනි පිරිසිදු ප්‍රතිපත්තිමය අලෙවියක් නොවේ. ජනාධිපති වික්‍රමසිංහ නොකීවත් එය අන්ත දූෂිත ගනුදෙනුවක් බව සමස්ථ ඉන්දියාවම දන්නා කරුණකි. ගුවන්තොටුපල කලමනාකරණය පිළිබඳ පූර්ව අත්දැකීම් අවශ්‍ය නොවන බවත් ඕනෑම සංඛ්‍යාවක් එක් ඉල්ලුම්කරුවකුට ලබාදිය හැකි බවත් මෝඩි ආණ්ඩුව පත්කළ විශේෂ කමිටුව තීන්දු කරනු ලැබුවේ ගුජරාත් සමයේ සිට මෝඩිගේ හවුල්කරුවකුවන අඩානිට පළමු ගුවන්තොටුපල 07 න් 06 ක්ම ලබා දීමට බව විවෘත කතාවකි.

අපේ ''ප්‍රතිව්‍යුහගත කිරීමද'' ඊට වෙනස් විය නොහැක. ඒවා රාජ්‍ය අයිතියෙන් ඉවත්කර පෞද්ගලික අයිතියට දෙනු ලබන්නේ ජාවාරම්කාර දූෂිත ව්‍යාපාරික ලෝකයකට ය. මේ වනවිට බල ශක්ති ක්ෂේත්‍රය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා කංචන විජේසේකර ඇමතිවරයාගේ සහායට පැමිණ ඇත්තේ ඇමෙරිකානු රාජ්‍ය ආයතනයක් වන ''යූඑස්ඒඩ්'' ආයතනය ය. කොළඹ බොහෝ රාජ්‍ය ආයතන හා දේශපාලන නායකයින් සමග ඇමෙරිකානු තානාපතිනිය තබා ගන්නා ඉතා සමීප ගනුදෙනු අනුව ආණ්ඩුවේ තීන්දු තීරණ වලට ඔවුන්ගේ අත පෙවීම් නැතැයි සිතීමත් අසීරුය. ඇමති විජේසේකරගේ නිල ''ට්විට'' පණිවුඩයකට අනුව ඔහු ඇමෙරිකානු ආයතනයේ නියෝජිත කණ්ඩායම සමග බලශක්ති ක්ෂේත්‍රය ප්‍රතිව්‍යුහගත කිරීමේ ඉදිරි සැළසුම් ගැන සාකච්ඡා සති 08 ක් ඇතුළත සම්පූර්ණ කිරීමට නියමිතය.

ඒ අතරතුර, මහ භාණ්ඩාගාරයේ ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකය විසින් රාජ්‍ය ව්‍යාපාර 04 ක් අන්සතු කිරීමේ උපදේශන කාර්ය වෙනුවෙන් පෞද්ගලික ආයතන ගණනාවක් තෝරා ගෙන ඇතැයි වාර්තා විය. ඒවායෙන් සමහර ආයතන අතිශය දූෂිත ආයතන ලෙස ප්‍රකටය. ඉන් එක් ආයතනයක් වන ''ප්‍රයිස් වෝටහවුස් කූප'' සමාගමට එරෙහිව නව දිල්ලි මහ අධිකරණයේ හිටපු අග විනිසුරු ඒ.පි ශාහ් විසින් 2017 ජූලියේදී අගමැති මෝඩිට යොමු කළ ලිපියෙන් ඔවුන්ගේ අවංකත්වය ප්‍රශ්න කර ඇත. අග විනිසුරු ශාහ් එහි සඳහන්කර ඇත්තේ වෝටහවුස් කූප ශාඛා සමාගම් විසින්

සිදුකර ඇති නීති විරෝධි කටයුතු මගින් ප්‍රදර්ශනය කෙරෙන්නේ මහා අයිස් කන්දක මුදුන පමණක් වන හෙයින් ඒවා පරීක්ෂා නෙකෙරෙන්නේ නම්, ඉදිරියේදී සමාජයටත් ජාතික ආරක්ෂාවටත් ඉමහත් තර්ජනයක් විය හැකි බවය. එවගේම එම වසරේ මාර්තුවේ ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන කිරිට් සොමායියා ට්විට පණිවුඩයකින් කියා තිබුණේ ග්ලෝබල් ට්‍රස්ට් බැංකුවේ මහා වංචා සම්බන්ධයෙන් පාර්ලිමේන්තු ඒකාබද්ධ කමිටුව මගින් වෝටහවුස් කූප සමාගමට එරෙහිව දැඩි දඬුවම් නිර්දේශ කර ඇති බවය. ඒ ඔවුන්ට එරෙහිව ඇති දූෂණ චෝදනා අතුරින් දෙක තුනක් පමණි.

එළෙස තෝරාගනු ලැබ ඇති තවත් සමාගමක් වන්නේ බ්‍රිතාන්‍යයේ යෝධ විගණන සමාගමක් වන ''ඩෙලොයිට්'' සමාගම ය. ඔවුන්ට එරෙහිව 2016 සිට 2021 දක්වාවන ''ගෝ-අහෙඩ්'' ප්‍රවාහන සමාගමේ වාර්ෂික ගිණුම් විගණනය කිරීමේ කටයුතු සම්බන්ධ පරීක්ෂණ ආරම්භකර ඇතැයි ''මූල්‍ය වාර්තා මණ්ඩලය'' මාධ්‍යයට පවසා ඇත. එකී ප්‍රවාහන සමාග විසින් රජයට බැර කළ යුතු බ්‍රිතාන්‍ය පවුම් මිලියන 80 ක මහජන මුදල් වසර 04 ක් පුරා වසන්කර තබා ගැනීම ඊට හේතුවය. ඊට අමතරව ''සිග්'' ගොඩනැගිලි ද්‍රව්‍ය සමාගමේ වාර්ෂික විගණන වාර්තා සම්බන්ධයෙන්ද ඩෙලොයිට් සමාගමට බ්‍රිතාන්‍ය පවුම් ලක්ෂ 09 ක දඩයක් ''මූල්‍ය වාර්තා මණ්ඩලය'' විසින් ඉකුත් දෙසැම්බරයේදී නියම කරනු ලැබ තිබේ.

වැදගත් වන්නේ ඔවුන්ගේ දූෂණ පමණක් නොවේ. දූෂණය පිටුදැකීමේ නීති හා සැළසුම් සකස් කිරීමේ වගකීම බාර ගන්නා ජා.මූ.අරමුදලේ හැදියාවය. ජා.මූ.අරමුදලේ වත්මන් ප්‍රධානී ක්‍රිස්ටලීනා ජෝර්ජීවා 2018 වන විට ලෝක බැංකුවේ ප්‍රධාන විධායිකාව වූවාය. ලෝක බැංකුව ''ව්‍යාපාර කිරීම - 2018'' වාර්තාව සකසන විට, එම වාර්තාවෙහි චීනයේ ස්ථානය ඉහළ දැමීම වෙනුවෙන් දත්ත සකස්කරන ලෙස අදාල නිලධාරීන් කිහිප දෙනාට ඇය අනවශ්‍ය බලපෑම් සිදු කළේ යැයි ලෝක බැංකුවේ ආචාර ධර්ම කමිටුව විසින් පැවැත් වූ ස්වාධීන පරීක්ෂණයෙන් හෙළිවී ඇත. (www.euractiv.com/) ඒ වෙනුවෙන් චීන බලධාරීන් ඇයව මුදලට ගෙන තිබුණේ යැයි තවත් ආයතනවල ආලින්දයේ කෙරුණු කතාද තිබිණැයි කියනු ලැබේ.

හවුල් වන අයගේ පැටිකිරි අනුව මේ පොරොන්දුවන ප්‍රතිව්‍යුහගත කිරීම් රාජ්‍ය ව්‍යාපාර පිරිසිදු කෙරෙන්නක් විය නොහැක. නියත වශයෙන්ම කිව හැක්කේ අලෙවිකරණයට හවුල් වූ, ඊට ආධාර කළ

පංගුකරුවන් වෙනුවෙන් ඒවායේ භාණ්ඩවල හා සේවා සැපයුම්වල මිල ක්ෂණිකව නොවුනත් ක්‍රමානුකූලව ඉහළ දමනු ඇත යන්නය. රාජ්‍ය ව්‍යාපාර විකුණා දැමුණු පසු ඒවායේ මිල පාලනය කිරීමට මේ ජාවාරම්කාර විවෘත වෙළඳපල ආර්ථිකයේ නඩත්තුවන ආණ්ඩුවේ දේශපාලන නායකයින්ට අවසර නොලැබෙණු ඇත. ඒ වෙනුවෙන් නීති සැකසූවත් ක්‍රියාත්මක වනු ඇත්තේ අඩාලෙට ය.

ජා.මූ.අරමුදලේ නායකත්ව හැදියාවද සමග ඒ සියල්ල සැළකූ පසු අනාගතය සඳහා අපට ඉතිරිවන එකම විසඳුම වන්නේ විශේෂයෙන් බලශක්ති ඇතුලු අත්‍යාවශ්‍ය සේවා කිහිපය සඳහා පිරිසිදු කෙරුණු රාජ්‍ය ආයතන පවත්වා ගැනීමය. ආණ්ඩුවේ ඇමතිවරුන්ගෙන් ඒවා ඉවත් කෙරෙන, එම ආයතන උපරිමයෙන් පිරිසිදුකර, ඒවායේ දූෂණ, වංචා, නාස්තිය නැවතිය හැකි කාර්යක්ෂම ස්වාධීන කලමනාකරණයක් ස්ථාපිත කෙරෙන නව ප්‍රතිසංවිධානයක් ඇතිකර, සාමාන්‍ය ජනයාටද සහනයක් වන අයුරු ගෝලීය වෙළඳපලෙහි තරගකාරී නිෂ්පාදන වියදමක් පවත්වා ගැනීමය. කෙටියෙන්ම කියන්නේ නම්, රාජ්‍ය ආයතන ඇගයිය යුත්තේ රුපියල් ශත අනුව විගණනය කරන ලාභ හා පාඩු මත වන ශේෂ පත්‍රයකින් නොව, පුරවැසියනට, සමාජයට සහ ජාතික ආර්ථිකයට ලැබෙන සේවාව හා ප්‍රතිලාභ අනුවය.

කුසල් පෙරේරා
2023 මැයි 23

**හෙට දින වෙනුවෙන් අද මා දකින නව සංවර්ධන සැළසුමෙහි ඉතා කෙටි හැඳින්වීම ''මාතෘභූමිය සංවර්ධනයේ සුරතාන්තය - සඳහා නිවැරදි පාර සෙවීමට'' මැයෙන් වූ මෙම විවරණය දැනට මෙලෙසින් නිම කරමි.**

**මෙය කියවූ ඔබට,**
**බෙහෙවින් ස්තුතියි.**